
sinhalaebooks.com




Scanned by CamScanner

sinhalaebooks.com

# මීදුමෙන් ආ මාරයා



ජයසිරි රත්නසිංහ

Scanned by CamScanner

sinhalaebooks.com

# 01

ඒදා වැඩිපුර රෝගීන් නොසිටි බැවින් දොස්තර රමේෂ් අවසානයට පැමිණි රෝගියාටත් බෙහෙත් දී පිටත් කර යවා පුවත්ති පත්‍රය බැලීමට සූදානම් වුණි. ඔහුගේ දුරකථනය නාද විය. ගැහැනු කටහඬකින් ඇමතුමකි.

"හෙලෝ ඩොක්ටර් රමේෂ්ට කතා කරන්න පුළුවන් ද?"

"ඔව් මිස් කතා කරනවා. කියන්න මොකක් ද ප්‍රශ්නය?"

"ඩොක්ටර් මම ලින්ඩා. ග්‍රේලෑන්ඩ් එස්ටේට් එකෙන්. මට ඩොක්ටර්ව හම්බ වෙලා කතා කරන්න ඕනෑ. අපේ අම්මාගෙ අසනීපෙ ගැන. මට වෙලාවක් දෙන්න පුළුවන් ද වැඩිය සෙනඟ නැති?"

"ම්.......මිස් ලින්ඩා, දැන් නම් කවුරුත් නෑ. දැන් වෙලාව 6.45 යි නෙ. මං අට විතර වෙනකම් ඩිස්පෙන්සරියෙ ඉන්නවා. පුළුවන් නම් අදම එන්න...."

"මම අම්මිගෙන් අහලා බලන්නම්. එයා කැමති වුණොත් දැන්ම එනවා."

"හොඳයි මිස්"

ඊට මඳ වේලාවකට පසු බෙහෙත් ශාලාව ඉදිරියේ කාරයක් නවතන හඬ ඇසිණි. තරුණ දොස්තර මහතා තමා ඉදිරිපස වූ ජනේලයෙන් මිදුල දෙස බැලුවේය. කාරය පදවාගෙන ආවේ සුරූපී තරුණියකි. පසුපස අසුනේ මහලු කාන්තාවක් සිටියාය. තරුණිය පඩිපෙළ නැග ඩිස්පෙන්සරිය වෙත ආවාය.

"ගුඩ් ආෆ්ටර්නූන් ඩොක්ටර්." තරුණිය දොරකඩ සිටම ආචාර කළාය.

"ගුඩ් ආෆ්ටර්නූන් මිස්, වාඩි වෙන්න. ඔයා, මිස් ලින්ඩා වෙන්න ඕන මගේ හිතේ......."



Scanned by CamScanner

sinhalaebooks.com



"බොහොම ස්තුතියි ඩොක්ටර්. මම තමයි ඉස්සෙල්ලා කතා කළේ."

"කෝ ඔයාගෙ අම්මා ආව ද?"

"නෑ ඩොක්ටර්. එයා කැමති කරව ගන්න බැරි වුණා."

"එතකොට අර වාහනේ ආවේ?"

"ආ.........ඒ අපේ ආයම්මා, ඇග්නස්. පුංචි කාලෙ ඉඳලා මාව බලා ගත්තේ එයා. මගෙ තනියටයි ආවේ."

ඇගේ කතා විලාසය ද දේහ විලාසය මෙන්ම ප්‍රියමනාප බව වෛද්‍යවරයාට පෙනිණ. ඔහු මෙම තරුණිය පළමුවරට දුටුවේ අදය. දොස්තර රමේෂ් තම පළමු පත් වීම ලබා ගත්තේ රාගල රජයේ රෝහලටය. සවස හතරයි තිහෙන් පසුව ඔහු පෞද්ගලික ප්‍රතිකාර සේවයේ යෙදෙන්නේ තම රාජකාරියට අමතරවය. "ග්‍රේලෑන්ඩ්" වතු යායට යාබදව වූ කුඩා නගරයේ නිවසක ඔහු කුලී ගෙවීමේ ක්‍රමයට නැවතී සිටියේය. ඉවුම් පිහුම් වැඩ සඳහා ගෝපාල් නම් වූ මහලු සේවකයෙක් ද විය.

"ඉතින්, දැන් කොහොම ද ලෙඩාගෙ තත්ත්වෙ කියන්න



Scanned by CamScanner

sinhalaebooks.com

බලන්න."

"මේක දිග කතාවක්, ඩොක්ටර්. ඒකයි මං ඔයාගෙන් විවේක වෙලාවක් ඉල්ලුවේ. මම හිතුවෙ අම්මිත් එක්කම එන්න. ඒත්....."

"කියන්න, මං අහගෙන ඉන්නේ."

"අපේ තාත්ති මැරුණට පස්සෙ අම්මි ලෙඩ වුණා. තාත්ති නැති වෙලා අවුරුදු දහයක් වෙනවා. එදා ඉඳලා අපේ අම්මි මේ වෙනතෙක්ම එකම වචනයක්වත් කතා කරලා නැහැ."

"ඔයාගෙ තාත්තා මැරුණෙ මොනවා වෙලා ද මිස්?"

වෛද්‍යවරයා ඇයට බාධා කළේය. තරුණිය මඳ වේලාවක් ජනේලය දෙස බලමින් නිහඬව සිට දීර්ඝ සුසුමක් හෙළා සෙමින් කතා කළාය.

"අපේ තාත්ති මලේ එල්ලිලා ඩොක්ටර්. එයා නැති වෙන කොට මට වයස අවුරුදු අටයි. වත්තෙ තිබුණු මොනව ද ප්‍රශ්න වගයක් නිසා එහෙම කර ගත්තයි කියලා කතාවක් තියෙනවා. ඒත්, ඒවායේ ඇත්ත නැත්ත කවුරුත් දන්නෙ නෑ. දන්න කෙනෙක් වුණත් මාත් එක්ක කියන්නෙ නෑ. කොහොම හරි තාත්තිගෙ මරණෙන් ඇති වුණු කම්පනය නිසා අම්මිට මෙහෙම වෙන්න ඇති. ඒ දෙන්න ගොඩාක් ආදරෙන් ඉඳලා තියෙනවා. මට, ඇගි අම්මා ඒ බව කිව්වේ. දැන් තියෙන ප්‍රශ්නය තමයි ළඟක දී ඉඳන් අම්මි රෑ නින්දෙන් ඇවිදිනවා. මට බයයි එයා අනතුරක් කර ගනීවි කියලා. ඒකයි මට මේ ප්‍රශ්නෙ මේ ගැන හොඳින් දන්නා කෙනකුට කියන්න හිතුණේ."

"ඒක ගොඩක් හොඳයි මිස්, එහෙම කල්පනා කළ එක. රාත්‍රියට නින්දෙන් ඇවිදින එක රෝගයක්මත් නෙවෙයි. ඒක එක්තරා මානසික තත්ත්වයක් උඩ සිද්ධ වෙන දෙයක්. මේක ශාරීරික හානියක් වෙන තරම් ආබාධයකුත් නෙවෙයි. ඒත් මෙහෙම ඇවිදින කොට කිසියම් අනතුරක් සිද්ධ වෙන්න ඉඩ තියෙනවා. යම් තැනකින් වැටෙන්න පුළුවන්. ඒ වගේම වතුරකට



Scanned by CamScanner

sinhalaebooks.com

වැටෙන්න ඉඩ තියෙනවා. තවත් නොයෙකුත් ප්‍රශ්න ඇති වෙන්න ඉඩකඩ තියෙනවා. ඒක නිසා, මේකට බලපාන මානසික තත්ත්වය හොයා ගෙන ඒකට අවශ්‍ය ප්‍රතිකාර කරන්න වෙනවා. කොහොමටත් මිස්, අපට ඔයාගෙ අම්මත් එක්ක මේ ගැන කතා කරන්නම වෙනවා. ඒත්...."

"ඩොක්ටර් ඒත් කිව්වේ, අපේ අම්මි කතා නොකරන නිසා ද?"

"ඇත්තෙන්ම ඔව්. කතා කරලා හිතේ තියෙන ප්‍රශ්න දැනගන්න පුළුවන්කමක් තිබුණා නම්, මේ කාරණය පහසුයි. ඒත් අපට මේ රෝගියත් එක්ක වෙනත් ක්‍රමයකට ගනුදෙනු කරන්න සිදු වෙනවා. බය වෙන්න එපා. අපි උත්සාහ කරලා බලමු. හැබැයි, මට ඔයාලගෙ ගෙදරට එන්න වෙනවා. අම්මගෙ මේ හැසිරීම බලන්න පුළුවන් නම් තමයි වඩාත්ම හොඳ. මම හෙට අනිද්දා මිස්ලාට පහසු දවසක එන්නම්. එහෙම හොඳයි ද?"

"ඩොක්ටර් කැමති වෙලාවක එන්න. ප්‍රශ්නයක් නෑ නේ ද ඇගි අම්මා?" ලින්ඩා තමා පසෙකින් වාඩි වී සාකච්ඡාව දෙස බලවත් ඕනෑකමෙන් බලා සිටින ඇග්නස්ගෙන් ඇසුවාය. ඇය හිස සලා එය අනුමත කළාය.

"ඩොක්ටර් බෙහෙත් මොනවාවත් උවමනා වෙයි ද?"

"අපි දැනට හිත ටිකක් සන්සුන් වෙන්න පොඩි බෙහෙතක් දීලා බලමු. ඒත් ඒක තාවකාලිකයි."

දොස්තර මහතා දුන් ඖෂධ රැගත් දෙදෙනා ඔහුගෙන් සමුගෙන පිටත්ව ගියහ.

තරුණිය සමග කතා කිරීමෙන් පසුව වෛද්‍යවරයාගේ සිත තුළට නුපුරුදු බරක් ඇතුළු වූවා සේ දැනී ගියේය. ඔහු බෙහෙත් ශාලාව වසා දැම්මේය.

රාත්‍රී කෑමට කැකුළු බත්, මාළු, පරිප්පු හා සම්බෝලයක් පිළියෙල කර තිබුණි. ආහාර මේසයට ඇරීමෙන් පසු ගෝපාල්



Scanned by CamScanner

sinhalaebooks.com

සිමෙන්ති පඩිපෙළේ වාඩි වී බුලත් සපන්නට පටන් ගත්තා පමණි. සැහැල්ලු ඇඳුමකින් සැරසුණු රමේෂ් සාලයේ වූ පුටුවේ වාඩි වී කල්පනාවේ නිමග්න වූවේය.

"සැර්........ඇම්ම කන්නෙ නැද්ද? දැන් ය වෙලා."

"මට තාම බඩගිනි නෑ ගෝපාල්. ඒක නෙවෙයි, මට ගෝපාල්ගෙන් අහන්න දෙයක් තියෙනවා."

"මොකක් ද සැර්?"

"අර, ඉස්සර මේ වත්තේ හිටපු සුපිරින්ටන්ඩන්ට් කෙනෙක් එල්ලිලා මළයි කියනවනේ. ගෝපාල් දන්නව ද ඒ ගැන තොරතුරු?"

ගෝපාල් රතු පාට බුලත් කෙළ පාරක් තේ පඳුරු අතරට විද්දේය. නැවත පිටි අත්ලෙන් මුව පිස දොස්තර මහතා දෙස බැලුවේය.

"සැර්, රත්තරං මහත්තයෙක් තමා ඔය විල්සන් සපරමාදු මහත්තයා. එයා තමයි මේ වත්තෙ වැඩ බලාපු තුන්වැනි සුපිරින්ටන්ඩන්ට්. එයාට කලින් හිටියෙ ජෝර්ජ් කියලා මහත්තයෙක්. එයාටත් කලින් හිටියේ බුවුන් කියලා සුද්දෙක්. දැන් ඉන්නේ ඩර්වින් මහත්තයානෙ. ඔය විල්සන් මහත්තයගෙ දෙවෙනියා විදියට තමා ඩර්වින් මහත්තයා වැඩ කළේ. විල්සන් මහත්තයාලටයි ඩර්වින් මහත්තෙලාටයි දෙගොල්ලන්ටම වත්තේ අයිතිය තිබුණා. ඔහොම කර ගෙන යන කොට වත්තේ ලොකු මුදල් වංචාවක් සිද්ධ වුණා. මගෙ හිතේ ලස්ස ගාණක. අතිත් අයිතිකාරයෝ හිටියේ කොළඹ. කොම්පැනියක් හදාගෙන නොවැ කට්ටියම වත්ත පාලනය කළේ."

"ඉතින් ඉතින්...."

"ඔය වංචා සිද්ධිය හොයන්ට කොළඹින්නුත් කට්ටිය ආවා. ඔය අතරෙදි තමා විල්සන් මහත්තයා ඔෆීසි කාමරේ එල්ලිලා මළේ."

"ඇත්තටම එයා වංචාවට සම්බන්ධ වෙලා ඉඳලා



Scanned by CamScanner

sinhalaebooks.com

තියෙනව ද?"

"අපි කවදාවත් විශ්වාස කළේ නෑ. ඒ වුණත් ලියුමක් ලියලා තිබුණාලුනේ. ෆයිල් වගේකුත් අතුරුදහන් වෙලා. ඒවායේ තමා ඔය හුටපටේ ගැන විස්තර තිබිලා තියෙන්නෙ. කතාව ගියේ විල්සන් මහත්තයා හොරකම් කරලා, ඒක අහුවෙනවට ලියුන් කියුං ටික විනාශ කරලා ලැජ්ජාවට ජීවිතේ නැති කර ගත්තාය කියලා."

"එතකොට ඊට පස්සෙ ද දැන් ඔය ඉන්න ලොකු මහත්තයා සුපිරින්ටෙන්ඩන්ට් වුණේ?"

"ඔව්. ඔව්. මිනිහා හරිම කපටියා. අංකුරා. ලොක්කා වෙන්ට බලාගෙන ඉඳලා තියෙනවා."

"එතකොට ඔය විල්සන් මහත්තයගෙ පවුලේ උදවිය ඔය සිද්ධියට පස්සේ වත්තෙන් යන්න ගියේ නෑ?"

"ඒගොල්ලෝ කොහෙවත් ගියේ නෑ සෑර්. ලොකු මහත්තයා මැරුණාට පස්සෙ නෝනත් ලෙඩ වුණා. වත්තෙ තිබුණු අයිතියෙන් කොටහක් විකුණලා හිඟ මුදල් පියෙව්වාලු. තව ඉතුරු කොටස් තියෙනවනෙ. ඒවායේ ආදායම් ඇති ඔය උදවියට ජීවත් වෙන්ට."

"එතකොට ඔය ලෙඩ වුණු නෝනයි, දුවයි, වැඩකාරයොයි විතර ද ඒ බංගලාවෙ ඉන්නේ?"

"ඔව්, එයාලා විතරයි. ඒ වුණාට සෑර් නෝනගෙ සහෝදරයෝ නිතරම යනවා එනවා. බලනවා. සෝදිසි කරනවා. පුංචි බේබි නම් හරිම ලස්සන සීදේවි දරුවා. මලක් වගේ." ගෝපාල් අවසන් කෙළ වඩිය ද බිමට හෙළා බුලත් හපය "ජරුස් ජරුස්" ගා බිමට ඇම්මේය.

"දැන් ඉතින් සෑර් කෑම කාලා නිඳා ගත්තානම් හොඳා නෙවෙ ද? රෑ අටහමාරත් පහු වෙලා."

"හ්ම්.ගෝපාලුත් කන්න."



Scanned by CamScanner

sinhalaebooks.com

# 02

ඉරිදා දිනයක් වූ බැවින් වතු කම්කරුවන් කිසිවකු පෙනෙන්නට නොමැති වතු යාය දුඹුරු පාටින් වැඩ ඇමූ කොළ පාට අයිසින් කේක් එකක් මෙන් දිස් වෙයි. තැනින් තැන වූ ගල් පර්වත අතරින් ගලා බසිනා දිය දහරාවෝ පරිසරය තව තවත් අලංකාර කරති.

එක් පසෙක වූ අර්ධඋන්නතාකාර කඳු මුදුනේ සුදු පැහැයෙන් ආලේපිත දෙව් මැදුරකි. අනෙක් පස වූ එබඳුම අර්ධඋන්නත කඳු මුදුනේ පැරණි "ග්‍රේලෑන්ඩ් වතු බංගලාව" පිහිටියේය. බොරලු මාවත බංගලාව ආසන්නයේ දී කළුගල් අතුරා සිමෙන්ති යොදා සකස් කළ මාර්ගයක් බවට පත් වේ. ඉදිරිපස වූ ගල්වලින් කරන ලද කුලුනු දෙක බොහෝ කලකින් පිළියම් ලැබූ බවක් පෙනෙන්නට නැත. එක් කුලුනකට සවි කළ විශාල යකඩ ගේට්ටුව මාර්ගයට ඉඩ දෙමින් පසෙකට වී නිසොල්මන්ව සිටී.

කාරය මිදුලටම ගත් රමේෂ් පැරණි බංගලාවේ දර්ශනය මඳ වේලාවක් නැරඹුවේය. බොහෝ කලකින් සායම් ආලේපයක් නොමැති වූවෙන් දුර්වර්ණ වූ බිත්ති සමූහය අඳුරු පරිසරය තවත් අඳුරු කළේය. ඉදිරිපස වූ සඳලු තලයෙන් පහතට නැමුණු පොකුරු සහිත කොළ පැහැති මල් වැල් සමූහය බොහෝ සෙයින් පඳුරු ගැසී සරුසාර ලෙස වැඩී තිබුණි. මීට කලකට පෙර බොහෝ ගරු ගාම්භීර ලෙස පවතින්නට ඉඩකඩ තිබුණු බංගලාව සුවිශාල එකක් විය. මිදුල පුරා අඹ ගස් වැඩී ඇත. සමහර තැන්වල සයිප්‍රස් ගස් වවා තිබුණි. තණකොළ වවා ඇති මිදුලේ ඈත කෙළවරක මැදිවියේ තැනැත්තෙක් වතුර නළයකින් මල් පැළවලට වතුර දමමින් සිටියේය.

කාරය මිදුලට පිවිසෙන හඬට ඔහු හැරී බැලුවේය. කරාමය කරකවා වතුර ගලා ඒම නවතා කාරය ළඟට ආවේය.



Scanned by CamScanner

sinhalaebooks.com

"ගෙදර කවුරුත් නැද්ද අංකල්?"

"ඉන්නවා මහත්තයා. පුංචි නෝනයි, ලොකු නෝනයි දෙන්නම. මහත්තයා කාව හම්බ වෙන්න ද ආවේ?"

"මම ලෙඩා බලන්නයි ආවේ."

"ඕ......මේ අපේ දොස්තර මහත්තයා නොවැ. එන්න එන්න ගේ ඇතුළට. මං පුංචි නෝනට කතා කරන්නම්. වාඩි වෙන්න."

සාලයට ගොඩ වූ රමේෂ් දොස්තර මහතා සැටියේ කෙළවර වාඩි වී වටපිටාව දෙස විමසිල්ලෙන් බැලුවේය. පරණ කාලයේ ඡායාරූප රාශියක් එහි එල්ලා තිබුණි.

"පුංචි නෝනා නානවා. ඉක්මනට එයි. මහත්තයා ටිකක් වෙලා ඉන්නකෝ."

"අංකල් මෙහෙ ද වැඩ කරන්නෙ?"

"ඔව් මහත්තයා. මෙහෙ වැඩට ඇවිල්ලා අවුරුදු පහළොවක් විතර ඇති. පුංචි බේබි පොඩි කාලේ තමයි ආවෙ. එතකොට ලොකු සැරුත් හිටියා නොවැ."

මඳ වේලාවකින් ලින්ඩා සාලයට පිවිසියාය. දිය නෑම නිසා ඇගේ දිගු වරලස නිදහසේ මුදා හැර තිබුණි. ඇය එදා දුටුවාටත් වඩා රූමත් යයි රමේෂ්ට සිතුණි. ඔහු අසුනින් නැගිට ඇයට ආචාර කළේය.

"ඩොක්ටර් ගොඩක් වෙලා ද ඇවිල්ලා? මට සමාවෙන්න ඕනෑ. වාඩි වෙන්න."

"කමක් නෑ මිස් ලින්ඩා. මං ඇවිල්ලා ඒතරම් වෙලාවක් නෑ. කොහොම ද දැන් අම්මට?"

"ඒතරම් වෙනසක් පේන්න නෑ ඩොක්ටර්. ඒත් ඊයෙ රෑ කවදාවත් නැතුව එයා හීනෙන් කතා කළා ඩොක්ටර්."

"මොනව ද කිව්වෙ කියලා ඇහුණ ද ඔයාට?"

"මට හරියටම තේරුණේ නැහැ. කතා කරන සද්දෙ

sinhalaebooks.com

ඇහිලා එනකොටම කතාව නතර වුණා. කාත් එක්ක හරි කතා කරනවා වගේ තමයි ඇහුණේ. හරියට රහසක් කියන්නා වාගෙ"

"ම්.....අපි බලමු ද ලෙඩා?"

"මං අම්මව එක්කගෙන එන්නම්" තරුණිය යන්නට සැරසුණාය.

"එපා මිස්, අපි යමු එයා ළඟට."

දොස්තර මහතා තරුණිය සමග වැරැන්ඩාවේ කෙළවර වූ කාමරය ළඟට ගියේය. එහි දොර බාගෙට වැසී තිබුණි. තරුණිය දොර විවෘත කළාය.

"එන්න ඩොක්ටර්."

කාමරය තුළ මඳ අඳුරක් විය. එහි වූ වියන් සහිත ඇඳෙහි විට්ටමට හේත්තු කළ කොට්ටා කිපයක් මත හේත්තු වූ මැදිවියේ කැනැත්තියක් හිස් බැල්මෙන් තමන් දෙස බලා සිටිනු වෛද්‍යවරයා දුටුවේය. සුදුමැලි වුණු මුහුණෙහි කිසිදු හැඟීමක් නොමැත. දෙඇස් මලානිකය.

"අම්මි, මේ තමයි ඩොක්ටර් රමේෂ්. එයා ඔයා බලන්නයි ආවේ."





Scanned by CamScanner

sinhalaebooks.com

ලින්ඩා තම මවගේ අත අල්ලා ගෙන ඇඳෙහි වාඩි වූවාය. දොස්තර මහතා ඇඳ ළඟම තිබූ පුටුවෙහි වාඩි වූවේය.

"මැඩම්, දැන් කොහොම ද ඔයාට?"

එක වචනයකුදු නොබිණූ ඇය, හිස පමණක් සෙලවූවාය. වෛද්‍යවරයා ඇගේ පපුවේ ගැස්ම හා නාඩි වේගය පරීක්ෂා කර බැලුවේය. ඇස් හා දිව ආදිය ද පරීක්ෂා කර බැලුවේය.

"ඔයා මාත් එක්ක කතා කරන්න කැමති ද මැඩම්?"

වෛද්‍යවරයාගේ ප්‍රශ්නයට ප්‍රතිචාර වශයෙන් සිල්වියා මැතිනිය කළේ මෙතෙක් වේලා තිබූ හැඟීම් රහිත මුහුණට මඳ සිනාවක් නැංවීම පමණි.

"හොඳයි මැඩම්, මං ආයිමත් ඔයා බලන්න එනවා. මං දුන්න බෙහෙත් ඒ විදියටම බොන්න. වැඩිය කල්පනා කරන්න එපා. කාමරෙන් ටිකක් එළියට ගිහිල්ලා මිදුලේ එහෙම ඇවිදින්න. එතකොට ඔය තත්ත්වේ ටිකක් වෙනස් වෙයි. හොඳයි මිස් ලින්ඩා, අපි දැන් යමු. මං ගිහින් එන්නම් මැඩම්."

සිල්වියා හිස සලා මඳ සිනාවක් පළ කළාය. ලින්ඩා වෛද්‍යවරයා ද සමග කාමරයෙන් එළියට ආවාය. ඔවුන් දෙදෙනා සාලයේ වාඩි වී කතා කරන්නට පටන් ගත්හ. ඇග්නස් උණුසුම් කෝපි කෝප්ප දෙකක් හා බිස්කට් රැගෙන විත් දෙදෙනාටම පිළිගැන්වූවාය.

"ඩොක්ටර් ඇත්තෙන්ම මට හිතෙනවා අම්මිට සනීප වෙයි කියලා. කවදාවත් නැතුව අද හොඳට හිනා වුණා. කතා කරන්නත් වගේ හැදුවා."

"ඔව් මිස් ලින්ඩා, අම්මට තදබල රෝග තත්ත්ව මොකුත්ම නෑ. මට හිතෙන විදියට තාත්තගෙ හදිසි මරණය එයාට දරා ගන්න බැරි වුණා. ඒකෙන් ඇති වුණු කම්පනය නිසා තමයි ඔය තත්ත්වෙට පත් වෙන්න ඇත්තේ. දැන් කරන්න තියෙන්නෙ එයාගෙ මනසේ තියෙන ඔය ව්‍යාකූල තත්ත්වය මග හැරිලා යන විදියේ ප්‍රතිකාර කිරීමයි. කාමරේ ඇතුළෙම ඉන්න නොදී



Scanned by CamScanner

sinhalaebooks.com

එළියට එක්ක ඇවිල්ලා පරිසරය රස විඳින්න හුරු කරන්න බලන්න. සුරතල් සතුන් එක්ක, පොඩි දරුවන් එක්ක ඉන්න ඉඩක් ලැබුණොත් ඉක්මනටම අපට හොඳ ප්‍රතිඵල බලාපොරොත්තු වෙන්න පුළුවන්."

"ඔව් ඩොක්ටර්. මං උත්සාහ කරලා බලන්නම්. අම්මිව සනීප කර ගන්න පුළුවන් නම් මං ඕන දෙයක් කරනවා."

"ඒක එහෙම වෙන්න ඕනෑ. මිස් අපි ටිකක් එළියට ගිහිල්ලා කතා කරමු ද?"

"හරි හරි. යමු."

තරුණ යුවළ මිදුලට ගොස් එහි වූ උද්‍යාන පුටුවල වාඩි වූහ. සැඳෑ හිරු රැස් තුරු වදුල තුළින් මිදුලට පතිත වෙමින් තිබුණි. ඈතින් වූ කෝවිලෙන් බෙර හඬක් ඇසේ.

"ඉතින් මිස්. මට දැනගන්න පුළුවන් ද ඔයාගෙ තාත්තගේ මරණය ගැන විස්තර ටිකක්? මොක ද, අම්මට ප්‍රතිකාර කරන කොට මං ඒ ගැනත් දැනගෙන තිබීම වැදගත්. මොක ද අම්මාගේ රෝගයට මූලික හේතුව ඒක නම්."

"මං දන්නා තරමට විස්තර කියන්නම් ඩොක්ටර්."

තරුණිය කතාව ආරම්භ කිරීමට සූදානම් විය. මඳ සුළඟක් හමා ගියේය. ඇඟ හිරිගඩු නංවන ඇටමිදුලුවලට පවා දැනෙන සීතල සහිත ඝන මීදුමකින් අවට පරිසරය වැසී ගියේය. එක තැන සිටින දෙදෙනා පවා හඳුනා ගැනීමට අපහසු වන තරම් වූ ඝන මීදුම නිර්භීත කෙනකුගේ වුව ද හද ගැස්ම නංවන සුලු භීතියක් දැනවූයේය.

"මේ මොන පුදුමයක් ද? කවදාවත් නැති මීදුමක්."

තරුණිය බියෙන් මෙන් තෙපලාය.

"බය වෙන්න එපා. අද ටිකක් ක්ලයිමේට් එක වෙනස්. ඒක නිසා වෙන්න ඇති. ඕක ඉක්මනින් නැති වෙලා යයි."

දොස්තර මහතා එසේ කියා අවසන් වෙනවාත් සමගම



Scanned by CamScanner

sinhalaebooks.com

මීදුම පහව ගියේය.

"මං කිව්වේ, ඒක සාමාන්‍ය සිදුවීමක්. මිස් ලින්ඩා ටිකක් බය වුණා වගේ?"

"හ්ම්, මට ටිකක් අමුත්තක් දැනුණා. ඒත් තනියම නෙවෙයිනේ. ඩොක්ටර් ළඟ හිටි නිසා එහෙමටම බයක් දැනුණෙ නෑ. ඒක නිසා මට කතාව කියන්නත් බැරි වුණා. හරි. මම කොතනින් ද පටන් ගත්තේ?"

"ඔයා පටන් ගන්න හැදුවා විතරයි මිස්."

"ඕ....මට සමාවෙන්න. මේ මීදුම මගෙ ඔළුව අවුල් කළා. අපි. මෙහේ අය නෙවෙයි. මං පුංචි කාලේ අපි හිටියෙ මීගමුවේ; කට්ටුවේ. එහේ තමයි තාත්තිගෙ මුල් ගෙවල් තිබුණේ. මේ වත්තේ අයිතිය අපේ සීයටත් තිබුණා. තාත්ති සීයගෙ එකම පුතා. සීයා ගොඩක් පෝසතෙක්. පොල් ඉඩම්, කඩ සාප්පු ගොඩක් එයාට තිබුණා. ඉතින් අපේ තාත්තිට මේ වත්තේ පාලකකම ලැබුණාට පස්සේ අපි කට්ටියම මෙහාට ආවා. ඒ එනකොට මං හුඟාක් පොඩියිලු. අම්මිගෙ ගම පානදුරේ. ඒ දෙන්නා යාළු වෙලා තමයි කසාද බැඳලා තියෙන්නේ."

"මේ වත්තට තවත් අයිතිකාරයෝ ඉන්නව ද මිස්?"

"ඔව්. තව කීප දෙනෙක්ම. එයාලා සීයගෙ ළඟම නෑදැයෝ. ඒ අය එකතු වෙලා පිහිටුවා ගත්තු කම්පැනි එකකින් තමයි වත්ත පාලනය වුණේ. අර ඉස්සරහින් කන්ද පාමුල තියෙන බංගලාව පේනවා නේද?"

ලින්ඩා ඇඟිල්ල දිගු කර ඉදිරියේ වූ තේ වගාවෙන් යුතු කඳු ගැටයේ පහළින් සුදු පැහැයෙන් පෙනෙන බංගලාව පෙන්වූවාය.

"අන්න ඒකෙ පදිංචි වෙලා ඉන්න ඩර්වින් වික්‍රමසිංහටත් මේකෙ කොටස් තියෙනවා. අනිත් අය ඉන්නේ කොළඹ. සමහර අය පිටරටවල පදිංචියට ගිහිල්ලා. ඉතින් අපේ තාත්ති මේ වත්තේ හොඳට වැඩ කර ගෙන ගිහිල්ලා තියෙනවා. අපි



Scanned by CamScanner

sinhalaebooks.com

දැනුවත්ව නම් කව්රුත් තාත්තිගෙ වරදක් කියන්නෙ නෑ. ඒත් ඔහොම ඉන්න කොට වත්තේ ලක්ෂ ගාණක මුදල් වංචාවක් සිද්ධ වෙලා තියෙනවා. තාත්තිත් මේ ගැන ගොඩක් හිතේ අමාරුවෙන් හිටියේ. දැන් වත්තේ සුපිරින්ටන්ඩන්ට් වෙලා ඉන්න ඩර්වින් අංකල්, එතකොට දෙවෙනියා. එයා තමයි මුදල් අංශයේ වැඩ ගොඩාක් බාරව ඉඳලා තියෙන්නේ, තාත්තිට වෙලාවක් නැති නිසා. ඒත් අන්තිමේ දී මේ වංචාවට තාත්තිට වග කියන්න වුණා. ගොඩක් බිල්වල ෆයිල්ස් නැති වෙලා. බිල් නැති වෙලා. ඔඩිට් එක පිළිගත්තේ, තාත්ති මේවා හිතාමතා කළයි කියලා."

"එතකොට ඩර්වින්ට වරදක් ආවේ නැද්ද?"

"නැහැ. එයා සාක්ෂි දීලා තියෙනවා මේ ගනුදෙනු ඔක්කෝම කළේ එයා නෙවෙයි තාත්ති කියලා. ඒක බොරු කරන්න අවශ්‍ය ලියකියවිලි තිබිලා නැහැ. කොහොමටත් ගනුදෙනුවල වගකීම ප්‍රධානියා බාර ගන්නම වෙනවා. ඉතින් බෝඩ් මීටින් එකට කලින් දවසෙ රෑ තාත්ති මොනවාදෝ ලොකු වාර්තාවක් ලිය ලියා ඉඳලා තියෙනවා. වත්තේ, ඔෆිස් එකේ. පහුවදා උදේ වනතුරු තාත්ති ගෙදර ආවෙ නැත්තේ ඇයි කියලා බලන්න අම්මි ගිහිල්ලා තියෙනවා. එතකොට තමයි තාත්ති එල්ලිලා ඉන්නවා දැකලා තියෙන්නේ. එදා සිහිය නැතුව වැටුණු වෙලාවේ ඉඳලයි අම්මිට අසනීප වුණේ."

තරුණිය දීර්ඝ ලෙස සුසුමක් හෙළුවාය.

"හොඳටම විශ්වාස ද තාත්තගේ මරණය සියදිවි නසා ගැනීමක් කියලා?"

"අවිශ්වාස කරන්න දෙයක් තිබුණේ නැහැ. ලියුමේ තිබුණු අත්අකුරු තාත්තිගෙ වගේමයි. ඒකෙ කියල තිබුණේ, මේ මුදල් එයා අතින් වියදම් වුණා කියලා. ඒ වෙනකොටත් තාත්ති එයාගෙ ගමේ අලුතින් ගෙයක් හද හදා හිටියේ. කතාව ඔප්පු කරන්න ඒකත් සාක්ෂියක් වුණා. ඒත් මම හිතන්නෙ නෑ. තාත්ති එහෙම වංචාවක් කළයි කියලා. එහෙම කරන්න එයාට වුවමනාවක් තිබුණෙත් නැහැ. ඒ වුණත් කරුණු කාරණා සිද්ධ වුණේ එහෙමයි.



Scanned by CamScanner

sinhalaebooks.com

වත්තේ උදවිය අදත් කතා වෙන්නේ මේ මරණයට හේතුව ඔය සිද්ධිය වෙන්න බැහැ කියලා. තාත්ති මටයි අම්මිටයි ගොඩක් ආදරෙන් හිටියෙ. මුදල් ප්‍රශ්න ගැන නම් මං මුකුත් දන්නෙ නෑ. ඒත්, අපි අතහැරලා යන්න එයාට ඕනෑකමක් තිබුණෙ නැහැ. දෙවියෝ තමයි ඇත්ත දන්නෙ, ඩොක්ටර්."

"ඇත්තෙන්ම මිස් ලින්ඩා, මටත් හිතෙනවා මේකෙ අභ්‍යන්තරේ මොනවා හරි නොපෙනෙන ප්‍රශ්නයක් තියෙනව කියලා. අපි තව තොරතුරු ටිකක් සොයලා බලමු. එහෙනම් මං ගිහිල්ලා එන්නම්. මොනවා හරි වෙනසක් තියෙනවා නම් මට කතා කරන්න."

"හොඳයි ඩොක්ටර්, මං වුවමනා වුණොත් කතා කරන්නම්."

වෛද්‍යවරයා තරුණියගෙන් සමුගෙන පිටත් වූයේය. හිරු කඳුවැටියට මුවා වී සැඟවෙමින් සිටියේය. මළහිරු රැස් තේ වතු යාය කෙළවරේ ක්ෂිතිජය මත අමුතු රටා මැව්වේ විස්මය ජනක විසිතුරු චිත්‍රයක් නිර්මාණය කරමිනි.

"තව ඉස්සරහට මොනවා හරි හිතාගන්නවත් බැරි අද්භූත දේවල් සිද්ධ වෙන්න පුළුවන්. ඒත් මගහරින්නත් බෑ. බලමු මොනව ද වෙන්නෙ කියලා."

දොස්තර තමාටම කියා ගත්තේය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 03

තම මවගේ හැසිරීම බොහෝ සේ වෙනස්ව ඇති බව ලින්ඩාට දැනුණි. ඇගේ මලානික දෑස්වල දිලිසෙන දීප්තිමත් බවක් හා නපුරු බවක් ඇති බවකුත්, එම දෑස් නිතරම විමසිල්ලෙන් පසු වන බවකුත් පෙනෙන්නට තිබුණි. එක් දිනක් රාත්‍රියේ ලින්ඩා මධ්‍යම රාත්‍රිය වන තුරු පොතක් කියවමින් සිටියාය. මවගේ නිදන කාමරය ඇත්තේ ලින්ඩාගේ කාමරයට මුහුණලාය. රාත්‍රී දොළහේ සීනු නාදය ඔරලෝසුවෙන් ඇසෙද්දී මවගේ කාමරය දෙසින් කතා කරන හඬක් ඇසිණ. ලින්ඩාගේ පපුව වේගයෙන් ගැහෙන්නට විය. ඇග්නස් නිදා ගත්තේ කුස්සියට යාබදව වූ කාමරයේය. ලින්ඩා ඇඳෙන් නැගිට හෙමින් සීරුවේ සිය මවගේ කාමරය සමීපයට ගියාය. දොර අඩවන්ය. ඇතුළත අඳුරුය.

"ඔව්, ඔව්. මං දැනගෙන හිටියා. ඔයා...... ඔයා නිර්දෝෂයි. උන් ඔක්කොම එකතු වෙලා ඔයා මගෙන් වෙන් කළා. මං දෙවියන්ගෙ නාමෙන් පළිගන්නවා. පළිගන්නවා විලී. විලී මාව දාලා යන්න එපා.......එපා.....එපා.....

හීන් හඬින් කළ කතාව ළතෝනියක් බවට පත් වෙත්ම ලින්ඩා වහාම තම මවගේ කාමරය තුළට පිවිස විදුලි පහන දැල්වූවාය. මව ඇඳේ වාඩි වී තම කෝපාග්නිය පිට වන දෑසින් විවෘත ජනේලය දෙස බලා සිටියාය. මවගේ සියොලඟ දහඩියෙන් තෙත් වී තිබුණි.

"අම්මී, අම්මි ඔයා හීනෙන් බය වුණා ද? අනේ අම්මි ඔයා මොනවා ද මේ කියවන්නෙ?"

ලින්ඩා මේසය මත තිබූ වතුර ජෝගුවෙන් ස්වල්පයක් වීදුරුවට වත් කොට මවගේ මුහුණ වතුරෙන් තෙත් කළාය.

"ආ....... බොන්න වතුර ටිකක්."



Scanned by CamScanner

sinhalaebooks.com

වතුර බීමෙන් අනතුරුව ඈ කුරුසියේ ලකුණ පපුව මත ඇඳගත්තාය. ඇග්නස් ද ශබ්දය ඇසී කාමරයට පිවිසුණාය.

"මොක ද බේබි ලොකු නෝනට?"

"අම්මි හීනෙන් බය වෙලා. ඇත් හරි. කෝකටත් ඔයා අද මේ කාමරේ නිදා ගන්න ඇඟි අම්මා."

ලින්ඩා පසුවදා වෛද්‍යවරයාට කතා කළාය. ඔහු සිටියේ රෝහලේය.

"අම්මි ඊයෙ හීනෙන් දෙඩෙව්වා. මට හොඳටම ඇහුණා. එයා තාත්තිගෙ නමත් කිව්වා. එයා නිර්දෝෂයි කියලත් කිව්වා. තාගෙන්දෝ පළිගන්න කතාවකුත් කියවුණා. මට නම් හරිම බයයි ඩොක්ටර්."

"බය වෙන්න එපා මිස් ලින්ඩා. ඕක සාමාන්‍ය තත්ත්වයක්. එයාට තාත්තාව හීනෙන් පෙනෙනවා ඇති. ඒකයි ඔහොම වෙන්නේ. කොයි එකටත් මම අද හවස එන්නම්."

රමේෂ් තමාගේ දිනපොතෙහි විශේෂ සටහනක් තැබීමට අමතක නොකළේය.

❖ නොවැම්බර් 17 -

***ලින්ඩාගේ මව සිහිනයෙන් දෙඩවීමේ දී කළ ප්‍රකාශය පිළිබඳව පරීක්ෂණය කළ යුතු යැයි මම සිතමි. පසුගිය දිනක ලින්ඩාගේ නිවසේ දී සාකච්ඡා කරද්දී ගලා ආ මීදුම අස්වාභාවික වූ එකකි. එය, යම්කිසි අනතුරක හෝ අද්භූත බලවේගයක ඡායාවක් යයි සැක සිතේ. කෙසේ වුව ද අද සවස ලින්ඩාගේ නිවෙසට ගොස් කරුණු සොයා බලමි.***

දොස්තර රමේෂ් එදා සවස් වරුවේ "ග්‍රේලෑන්ඩ්" වතු බංගලාව කරා යාමට පිටත් වුණි. වේලාව සවස පහයි තිහට පමණ වුවත් සාමාන්‍ය අඳුරු ස්වභාවයක් සහිත සීතල කාලගුණයක් කඳුකරය පුරා දක්නට ලැබුණි.

මෝටර් රථය බොරලු මාවත දිගේ සෙමින් ඇදී යයි. මඳක් ඈතුරේ වූ දේවස්ථානයේ පියස්ස මුදුනේ වූ කුරුස

sinhalaebooks.com

ලාංඡනය කළු පැහැයෙන් දිස් වේ. එක්වරම ඝන මීදුමක් මාර්ගය වසා පැතිරෙන්නට විය. රථය ධාවනය කිරීමට අපහසු වූයෙන් දොස්තර මහතා බ්‍රේක් පැඩලය මත පය සිර කළේය. මීදුම් වලාව මාර්ගය දිගේ පාවී ගොස් වාහනයට ඉදිරියෙන් ගමන් කරන්නට පටන් ගත්තේය. තමාට මාර්ගය පෙන්වන්නාක් මෙන් ගමන් කරන මීදුම් වලාව, දොස්තර මහතාගේ සිත තුළ චකිතයක් ඇති කරවන්නට සමත් වූ නමුත් ඔහු නැවත වාහනය පදවන්නට පටන් ගත්තේය.

ග්‍රේලෑන්ඩ් බංගලාව වෙත ධාවනය වන තුරුම මීදුම් වලා කැටිය මෝටර් රථයට ඉදිරියෙන් පාවී ගියේය. ගේට්ටුවෙන් වාහනය ඇතුළට ගත් පසු එක්වරම ගස් අතරින් ඇදී ගිය මීදුම අතුරුදහන් විය.

'ඒක සාමාන්‍ය දෙයක්. මම බොරුවට බය වෙලා. සීතල කඳුකරයේ මීදුම් වලාවක් කියන්නේ සාමාන්‍ය දෙයක්.'

රමේෂ් කල්පනා කළේය.

'බොරු මනස්ගාත.' ඔහු සිත එකලස් කර ගත්තේය. මඳ සිනාවක් මුවගට නංවා ගත් සුරූපී තරුණිය පෙරමගට ආවාය.





Scanned by CamScanner

sinhalaebooks.com

"සුබ සැන්දෑවක් ඩොක්ටර්. මං ඩොක්ටර් එනතුරු බලාගෙන හිටියේ."

"සුබ සැන්දෑවක් මිස් ලින්ඩා. ඉතින් කොහොම ද?"

"අපි යමු ඇතුළට. එන්න ඩොක්ටර්."

දොස්තර මහතා ග්‍රේලෑන්ඩ් මැඳුරට පිවිසියේය.

"වාඩි වෙන්න. මං කෝපි එකක් හදා ගෙන එන්නම්."

"එපා, තව ටිකකින් බොමු. මම එන්න ලෑස්ති වෙලා තේ එකක් බිව්වා."

"ඕ.....ඒ වුණාට අමුත්තෙක් විදියට ගෙදරකට යනවා නම් තේ නොබී එන්න ඕනෑ. මොක ද අනිවාර්යයෙන්ම ඒ යන ගෙදරින් තේ බොන්නම වෙන නිසා."

තරුණියගේ කියමනට වෛද්‍යවරයා සිනා පහළ කළේය.

"මට ඒක අමතක වුණා. මීට පස්සේ එනකොට මං තේ නොබී එන්නම්, හරිනේ. ඒක නෙවෙයි, දැන් අම්මගෙ අලුත්ම තත්ත්වේ කොහොම ද?"

"ඒක කියන්නමයි ඩොක්ටර්ට එන්න කියලා කතා කළේ. ඊයෙ රෑ මම නින්ද යන්නෙ නැති නිසා පොතක් කියව කියවා හිටියේ. එකපාරටම අම්මිගෙ කාමරෙන් කතා කරන හඬක් ඇහුණා. මම හිමින් සැරේ කාමරේ ළඟට යනකොට අම්මි තවත් කවුද කෙනෙක් එක්ක කතා කරන්නා වාගෙ සද්දෙ ඇහුණා."

"රෑ කීයට විතර ඇති ද ඔය කියන වෙලාව?"

"මං වෙලාව බැලුවා, 12.05 යි හරියටම."

"ඉතින් මොනව ද ඇහුණෙ කියන්න බලන්න."

"විලී.....විලී.....මං දැනගත්තා ඔයා නිර්දෝෂයි. ඔයා නිර්දෝෂයි. ඔක්කෝම එකතු වෙලා ඔයා මගෙන් වෙන් කළා. මම පළිගන්නවා හැමෝගෙන්ම. මාව දාලා යන්න එපා; කියලා හයියෙන් කෑ ගැහුවා. ඒ සද්දෙට ඇගී අම්මත් දුවගෙන ආවා.



Scanned by CamScanner

sinhalaebooks.com

"ඔහොම හීනෙන් දොඩවන එක සාමාන්‍ය දෙයක්. බය වෙන්න දෙයක් නෑ."

"ඒත් ඩොක්ටර් අර පළිගැනීමේ කතාව."

"තමන්ගේ යටි සිතේ තැන්පත් වෙන යම් යම් ආවේගශීලි අත්දැකීම් නින්දේ දී නැවත ඉස්මතු වෙන්න පුළුවන්. ඒවා නැවත අලුත් විදියට නිර්මාණය වෙලා ඒ තැනැත්තා හීනෙන් දකිනවා. මගෙ හිතේ තාත්තාගේ මරණය ගැන අම්මා හිතින් මවා ගත්ත දේවල් මේ විදියට හීනෙන් පෙනෙන්න බොහෝ දුරට ඉඩ තියෙනවා. කොහොමටත් අපි සෙවිල්ලෙන් ඉමු. අපි යමු ද අම්මා බලන්න."

සිල්වියා මැතිනිය සුපුරුදු සෙයාවෙන්ම ඇඳේ විට්ටමට හේත්තු වී හිස් අවකාශය දෙස බලා සිටියාය. වෛද්‍යවරයා හා තම දියණිය කාමරය තුළට ඇතුළු වුවත් ඇය හිස හරවා බැලුවේ නැත.

"අම්මී, මෙන්න ඔයා බලන්න ඩොක්ටර් ඇවිල්ලා."

ඈ සිටි ඉරියව්වෙන්ම ඇස් ගෝල පමණක් දොස්තර දෙසට හැරෙව්වාය. මුහුණෙන් මඳහස පළ කළාය.

"මැඩම් සිල්වියා, දැන් ඔයාට කොහොම ද?"

ඈ හිස සෙලවූවා පමණි.

"මිස් ලින්ඩා, මට අවශ්‍යයි අම්මා එක්ක තනිවම කතා කරන්න."

"කතා කරන්න! අම්මී කතා කරයි ද?" ලින්ඩා විමසුවාය.

"මං ලෑස්තියි අම්මව මෝහනය කරවලා බලන්න. මිස් ටිකක් එළියෙන් ඉන්නවා ද කරුණාකරලා."

"ඇත්තෙන්ම ඩොක්ටර්" ලින්ඩා කාමරයෙන් පිටවූවාය.

දොස්තර මහතා තමා වාඩි වී සිටි පුටුව සිල්වියාගේ ඇඳ ආසන්නයට ගත්තේය. ඔහු සෙමෙන් සිල්වියා ඇමතුවේය.



Scanned by CamScanner

sinhalaebooks.com

"සිල්වියා මැඩම්, කරුණාකරලා මං කියන දේ හොඳින් අහගෙන ඉන්න. ඉතාම අවධානයෙන් මම කියන දේ අහගෙන ඉන්න. ඔයාට මාව හොඳට ඇහෙනවා. ඔයාට මාව හොඳට ඇහෙනවා. මං කියන දේ ඔයාට හොඳට ඇහෙනවා. වෙන කිසිදෙයක් ඔයාට ඇහෙන්නෙ නෑ. මම කියන දේ විතරයි ඇහෙන්නෙ. ඇස් දෙක පියා ගන්න. ඇස් දෙක පියා ගන්න. කරුණාකරලා ඇස් දෙක පියා ගන්න. ඔබට පුදුම සනීපයක් දැනෙනවා. පුදුම සනීපයක්. දැන් නිදිමත දැනෙනවා. නිදිමතයි. නිදිමතයි. ඔබට නින්ද යනවා."

සිල්වියා මැතිනියට නින්ද ගියාය. දොස්තර මහතා නොකඩවාම ඇයව ඇමතුවේය.

"ඔබට මාව ඇහෙනවා. ඇහෙනවා නේද? මං කියන දේ හොඳට ඇහෙනවා. ඔබට මගෙත් එක්ක කතා කරන්න පුළුවන්. මම දැන් ඔබට ඒ ශක්තිය ලබා දෙනවා. තොල් දෙක සොලවන්න. කට අරින්න. දැන් ඔබට කතා කරන්න පුළුවන්. සිල්වියා මැඩම්, ඔයා කතා කරනවා නේද?"

සිල්වියා සෙමෙන් සෙමෙන් තම මුව විවර කරමින් හීන් හඬින් කතා කරන්නට පටන් ගත්තාය.

"ඔව්.ම.....මට ක......කතා කරන්න පුළුවනි. මට කතා කරන්න පුළුවනි."

"ඔබට මතක ද ඔබේ පුංචි කාලෙ........ඉස්කෝලේ යන කාලේ. මං ඔබව ගෙනියනවා ඔබේ අවුරුදු දොළහේ වයසට. දැන් ටික ටික ඔයාගෙ වයස අඩු වේගෙන අඩු වේගෙන යනවා."

දොස්තර මහතා ඇගේ මතකය ළමා කාලයට රැගෙන ගියේය. ඊට පසු නැවත විවාහය හා ඊට පසු කාලයට ඇගේ මතකය ගෙන ආවේය.

"ඔබට මතක ද ඔබේ සැමියා විල්සන් මහතා?"

"හොඳට මතකයි."

"හොඳයි. දැන් ඔබේ ඉදිරියට විල්සන් මහතා ආවොත් ඔබ



Scanned by CamScanner

sinhalaebooks.com

කැමති ද?"

"ගොඩක් කැමතියි. ගොඩක් කැමතියි."

"හොඳයි, මම හෙට එයාට එන්න කියන්නම්. ඔයාට එතකොට එයත් එක්ක කතා කරන්න පුළුවනි. කැමති ද?"

"මම කැමතියි. එයා ගෙන්වන්න."

"එහෙනම් දැන් මම කිව්වාම ඔයා අවදි වෙන්න. අවදි වුණාට පස්සේ ඔයාට මේ දේවල් මොකුත්ම මතක නැති වේවි."

සිල්වියා මැතිනියගේ මෝහනය ඉවත් කොට නැවත ප්‍රකෘති තත්ත්වයට පැමිණවූ දොස්තර මහතා කාමරයෙන් එළියට පැමිණියේය. ලින්ඩා සාලයේ ඔහු බලාපොරොත්තුවෙන් රැඳී සිටියාය.

"ඩොක්ටර් කොහොම ද? අම්මි කතා කළා ද?"

"ඔව්, ඒක සාර්ථකයි. ඇය හොඳින් කතා කළා."

"ඉතින් ඩොක්ටර් මේ ක්‍රමයෙන් බැරි ද එයාව දිගටම කතා කරවන්න?"

"එක පාරටම බැහැ. යම් කෙනෙක් මෝහන නිද්‍රාවට පත් කළාට පස්සේ එයා මෝහනය කරවන තැනැත්තා කියන ආකාරයට හැසිරෙනවා. ඒත් අවදි වෙලා ටික වේලාවකින් එයා පුරුදු විදියටම හැසිරෙනවා. ඒකයි සාමාන්‍ය තත්ත්වේ. ඒ වුණත් සමහර අය දවසක් දෙකක් තුනක් අර යෝජනා කළ දේවල් ඒ විදියටම පිළිපදිනවා. දිගටම පවත්වා ගෙන යන්නෙ නෑ. ඒක නිසයි මේ මෝහන ක්‍රමය තවම සාර්ථක ප්‍රතිඵල දෙන ක්‍රමයක් බවට පත් වෙලා නැත්තේ. හැබැයි යම් යම් තොරතුරු ලබා ගන්න යම් යම් සාක්ෂි ලබා ගන්න මේ ක්‍රමය යොදා ගත හැකියි. මොක ද මේ ක්‍රමයේ දී බොරු කියන්න බැහැ. අවංකවම ඒ පුද්ගලයා ඇත්ත කියනවා. ඒත් සමහර දේවල් අර හීනවල දී වගේ ප්‍රතිනිර්මාණය කරලා කියන අවස්ථා තියෙනවා."

"මටත් ආසයි මෝහනය වෙලා බලන්න ඩොක්ටර්."



Scanned by CamScanner

sinhalaebooks.com

"සුළු දෙයක්නෙ. ඒත් මෝහනය වුණාම කරන දේ තමන්ට පෙනෙන්නෙ නැහැනේ. තමන් ඇස් ඇරගෙන හිටියත් ඉන්නෙ තද නින්දේ."

"එතකොට ඒකත් හීනයක් වගේ ද?"

"ඇත්තෙන්ම එක්තරා විදියක හීනයක් වගේ තමයි. ඒත් තමන් හැබෑහින්ම ඒ දේවලට සහභාගි වෙනවා, කතා කරනවා, හැසිරෙනවා, අනුමත කරනවා, උත්තර දෙනවා. ඒකයි වෙනස."

"මේ ක්‍රමයෙන් අම්මගෙ හිතේ තියෙන ප්‍රශ්න විසඳන්න පුළුවන් වෙයි ද ඩොක්ටර්?"

දෙදෙනා දීර්ඝ වේලාවක් කතා කරමින් සිටියෝය. තේ පැන් සංග්‍රහයෙන් පසු වෛද්‍යවරයා තම නවාතැන බලා පිටත් වූණි. ඔහු රාත්‍රී කාලයේ දී දිනපොතෙහි පහත සටහන තැබුවේය.

❖ නොවැම්බර් 18 -

අද ලින්ඩාගේ මව මෝහනයට පත් කළ හැකි දැයි පරීක්ෂා කර බැලුවෙමි. ප්‍රතිඵල සාර්ථක විය. ඇයගෙන් විල්සන් මහතාගේ මරණය පිළිබඳව ද රහසිගත තොරතුරු දැන ගත හැකිවේ යයි විශ්වාස කරමි. ලින්ඩාට මේ තොරතුරු හෙළි වීමෙන් ඇය මානසික පීඩාවකට පත් වීමට ඉඩ ඇත. ඒ නිසා මම, ඇය මවගෙන් වෙන් කර ප්‍රශ්න ඇසීමට උත්සාහ දැරීමි. කෙසේ වුව ද අදත් පෙර දුටු අද්භූත මිදුම දුටුවෙමි. එය යම්කිසි භූතාත්මයක බලපෑමකින් සිදු වුවා දැයි සැකයක් මා තුළ ඇත. සමහර පුද්ගලයන් මිය ගිය පසු අන්තර් භවයේ දී හෝ භූතාත්මයක් විදියට හෝ තමන්ගේ සමීපතමයන් කරා ළගා වී ඔවුන් ආරක්ෂා කිරීම විද්‍යාත්මකව ඔප්පු වී ඇත. විල්සන්ගේ භූතාත්මය "ග්‍රේලෑන්ඩ්" වතු යායේ සැරිසරනු ඇත්දැයි සෙවිය යුතුය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 04

වඩිවේල් කන්දසාමි ග්‍රේලෑන්ඩ් වත්තේ තේ කම්හලේ මුරකරුවෙකි. ඔහු බොහෝ කලක් මෙම රාජකාරියේ යෙදී සිටියේය. වතු කම්කරුවකු ලෙස සේවයට බැඳුණු හෙතෙමේ වර්තමාන වතු අධිකාරි තැනගේ හොඳ හිත දිනා ගත් කුලුපග සේවකයෙකි. ඒ නිසාමය ඔහුට, මේ මුරකරු රැකියාව ලැබුණේ. ඔහු යටතේ ද සහායකයෝ දෙදෙනෙක් වැඩ කරති. වඩිවේල්ගේ රාජකාරියට අමතරව ඔහු වතු අධිකාරියේ ආරක්ෂකයකු ලෙස ද වැඩ කළේය.

එදින සිය සේවා මුරය නිම කළ වඩිවේල් තම සහායකයාට සේවා මුරය පවරා සටහනක් ද තබා නිවෙස බලා යාමට පිටත් වූවේය. කොන්ක්‍රීට් කරන ලද පාරේ මදක් දුර ගිය පසු බොරලු පාරට පිවිසි ඔහු දෙමංහන්දියේ තිබූ කඩ කාමර කිපය අසල නැවතුණි. වත්තටම අයිති මේ කඩ කාමර බදු දී ඇත. ඒවායින් එකක පවත්වා ගෙන යන රා කඩයෙන් හොඳහැටි සප්පායම් වී නිවෙසට යාම වඩිවේල්ගේ දෛනික පුරුද්දකි.

එදාත් සුපුරුදු පරිදි ඔහු රා බෝතල් කිපයකටම වග කිව්වේය. වීමේකර් සොයිසා ද සමග මගට බට හෙතෙමේ නිවෙස බලා යාම සඳහා ගල් පඩිපෙළේ ඉහළට නැංගේය. සොයිසා මඳ දුරක් ගමන් කොට ඔහුගේ නිල නිවාසය කරා සමුගෙන ගියේය.

කඳු යායේ එහා පැත්තේ වතු බංගලාව ද මෙහා කෙළවරේ දේවස්ථානය ද සැන්දෑ කළුවර විසින් ගිල ගනිමින් පැවතුණි. එක්වරම හමා ආ සීතල සුළඟින් තම සිරුර හිරි වැටී යනු වඩිවේල්ට දැනිණි. රා මතයෙන් හිස භ්‍රමණය වෙමින් පැවතුණි. සීතල සුළඟත් සමග පාවී ආ ඝන මීදුම් වලාවෙන් ඔහු අවට මුළුමනින්ම වැසී ගියේය. තමාගේ සිරුර පවා තමාට නොපෙනී යන තරම් ඝන මීදුම නිසා ඔහුට ගමන් කළ යුතු මාර්ගය පවා වැරදුණි. හිතට හිතෙන අතේ පා තැබූ වඩිවේල්ගේ පා එක්වරම



Scanned by CamScanner

sinhalaebooks.com

තදින් යමක ගැටුණු නිසා ඔහුගේ දෙපා පැටලී ඉන්දවී ගියේය. අතට අසු වුණු යකඩයක් බඳු යමක් තදින් අල්ලා ගත් හෙතෙම සිහි එළවා ගැනීමට උත්සාහ දැරිය.

මීදුම් වලාව එක් අඳුරු ගුළියක් බවට පත් වී ගියේය. ඔහුගේ දෑසට පෙනුණු දසුනින් ඇඟ හිරි වැටී ගොස් වෙරිමත ද තරමක් දුරට සිඳී ගියේය.

වඩිවේල් වාඩි වී සිටියේ එක්තරා සොහොන් කොතක් අබියසය. කලකට පෙර මිය ගිය විල්සන් මහතාගේ සොහොනෙහි ඔහුගේ ඡායාරූපයක් සවි කර තිබුණි. අඳුරු මීදුම තුළින් කළු පැහැති රුවක් මතු වුණි.

කළුම කළු පැහැති ලෝගුවක් වැනි ඇඳුමක් ඇඳ සිටි එම රුව, හිස හා මුහුණ වැසෙන සේ කළු දුහුල් සළුවක් පැලඳ සිටියේය.



රතු පැහැති ගිනි ගුළි දෙකක් බඳු දෙනෙතක් දුහුල් සළුව තුළින් කැපී පෙනුණි. එක්වරම තමන් දෙසට ආ කළු හැඳගත් අවතාරය සිය දෙඅත් ඉහළට ඔසවා වියරු හඬින් සිනාසෙනු



Scanned by CamScanner

sinhalaebooks.com

වඩිවේල් අසා සිටියේ, නොනවත්වා ගැහෙන සිය හදවතේ ස්පන්දනය සමගිනි.

මීදුම් වලාව මෙම රූපයට ආවරණයක් සපයමින් වටේට පැතිරී තිබුණි. එය ද මිනිස් රුවක ආකාරයක් පෙන්නුම් කළේය.

වඩිවේල්ට දෙවියන් සිහියට ආවේය. ඔහු මොනවාදෝ කියන්නට කට ඇරීමට උත්සාහ දැරුවේය. එහෙත් කිසිදු හඬක් මුවින් පිට නොවුණි.

"ලැස්තී වෙයන් වන්දි ගෙවන්ට, ලේවලට ලේවලින්. මම ගොඩක් කල් බලාන හිටියා උඹ ගැන වඩිවේල්. හඃ හඃ හඃ....."

වියරු හඬක් නගමින් ඉදිරියට ආ කළුවන් අවතාරය වඩිවේල්ගේ සිරුර ඔසවා දෑතට ගෙන අහසට ඔසවා වේගයෙන් සොහොන් කොත මත දමා ගැසුවේ ඔහුගේ හිස පොඩි වී රතු ලේ දහරාවෙන් සොහොන් කොත තෙමී යන අයුරිනි.

වචනයකුදු කතා නොකර වඩිවේල් තැළී පොඩි වුණු හිස සහිතව සොහොන මත පෙරළී ගියේය.

මීදුම් වලාව සමගම කළුවන් රුව කන්ද මුදුනට නැග අතුරුදහන් විය.

පසුදා උදෑසන වතු කම්කරුවන් දුටු බිහිසුණු දර්ශනය පිළිබඳ ආරංචියෙන් වතු යායම කම්පා වුණු අතර සියල්ලන්ගේම සිත් භීතියෙන් ඇලළී ගියේය. වඩිවේල්ගේ හිසෙන් ගලා ආ ලේ ධාරාවෙන් සොහොන් කොත මත රතු පැහැති රටාවක් මැවී තිබුණි. බොහෝ කලකට පසු විල්සන් මහතා පිළිබඳ මතකය යළිත් අවදි විය.

මේ සිද්ධියෙන් වතු අධිකාරි ඩර්වින් බොහෝ කලබලයට පත් විය. ඔහුගේ කුලුපග සේවකයාට අත් වූ ඉරණම ඔහුගේ ශෝකයට පමණක් නොව භීතියට ද හේතුවක් විය.

අධිකව මත්පැන් පානය කොට කළ ගමනේ දී සොහොන් කොත මත ඇද වැටීම නිසා හිසට සිදු වූ බරපතළ හානි හේතුවෙන් වඩිවේල් මරණයට පත් වී ඇති බවත්, මෙය හදිසි



Scanned by CamScanner

sinhalaebooks.com

අනතුරකින් සිදු වූ මරණයක් බවත් විවෘත තීන්දුවක් මරණ පරීක්ෂක මහතා විසින් දෙන ලදී. මිනිමැරුමක් බවට කිසිදු සාක්ෂියක් නොවීය.

බොහෝ කාලයක් යන තුරු සවස් කාලයෙන් පසුව මේ සිද්ධිය වූ මාර්ගයෙන් නොයාමට බොහෝ දෙනෙක් වග බලා ගත්තෝය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 05

"අර කවු ද වික්ටර්?"

තමාගේ රිය පසු කර ගිය රථය පදවා ගෙන ගිය පුද්ගලයා වතු අධිකාරි ඩර්වින් හඳුනාගත්තේ නැත.

"ඒ තමයි අර ඩිස්පෙන්සරියේ දොස්තර. මිනිහා අලුතින් ආවේ."

"කොහෙ ද ඔය මනුස්සයා යන්නේ? මට කලිනුත් හම්බ වුණා වගේ මතකයි."

"මගෙ හිතේ පරණ බංගලාවට."

"ඔහෝ.......එහෙනම් මිනිහා පිස්සු ගෑනිට වෙදකම් කරනවා ඇති. මටත් කාලෙකින් යන්න බැරි වුණා ඒක නෙවෙයි වික්ටර්. අර වඩිවේල්ගේ මරණෙ සිද්ධ වුණු විදිය නම් මට එච්චර අල්ලන්නෙ නෑ. හරියටම විල්සන්කාරයාගේ සොහොන ළඟටම මිනිහා කොහොම ද ගියේ? එතෙන්ට යන්ට උවමනාවක් කොහෙත්ම නෑ."





Scanned by CamScanner

sinhalaebooks.com

"ඒක තමයි මටත් තියෙන ගැටලුව සර්. වඩිවේල්ගේ ඔළුව චප්ප වෙලා තිබුණු හැටි මතක් වෙන කොටත් ඇඟ හිරි වැටෙනවා. ඇත් ඒ පැත්තෙන් මිනිස්සු යැමත් අතෑරලාලු."

"මටත් බයයි වික්ටර්. මෙතැන මොකක් හරි ලොකු දෙයක් සිද්ධ වෙනවා."

"සර්, සර් මට ඊයේ මිනිහෙක් පුදුම කතාවක් කිව්වා."

"මොකක් ද? කව් ද කිව්වේ?"

"එදා වඩිවේල් මැරුණු දවසේ යන්නම් බිං කරුවළ වැටීගෙන එන කොට අර දලු මඩුවේ වැඩ කරන සාමෙලුයි, නඩරාජයි දෙන්නා ලැයිමට යන්න ඇවිල්ලා තියෙනවා. පඩිපෙළ දිගේ එන කොට පහළින් ආවලු කළු පාට ඇඳුමක් ඇඳ ගත්තු උස කෙනෙක් දුවගෙන. ඒ දෙන්නා පහු කර ගෙන විදුලි වේගෙන් ඇවිල්ලා නොපෙනී ගියාලු. හරියට අඳුනගන්න බැරි වුණේ ඒ වෙලාවෙම සන මීදුමකින් වැහුණලු. උන් දෙන්නා හරියට බය වුණාලු. ඒ වෙලාවේ සාමෙල් කිව්වලු. ඒ හන්දියේ කඩේ ළඟ ඉන්න පිස්සා කියලා. උගත් අඳින්නේ කළු ගැහිච්ච ඇඳුමනේ."

"ඒක එහෙම වෙන්නත් පුළුවන්. ඉතින් පිස්සාට වුවමනාවක් තියේවි ද වඩිවේල් මරන්න?"

"නෑ.....නෑ.......ඒක අවතාරයක් වෙන්න බැරි ද? මැරුණු විල්සන් මහත්තයාගේ."

එක්වරම ඩර්වින්ගේ පය බ්‍රේක් පැඩලය මත තද වුණි. රථය ගැස්සී නතර විය.

"බය හිතෙන කතා කියන්න එපා බං. අවුරුදු දහයකට කලින් මැරිච්ච එකාගෙ අවතාරේ කොහොම ද දැන් එන්නේ? පිස්සු ද?"

"නෑ මං කිව්වෙ, එහෙම වෙනවටම නෙවෙයි. ඒත් ඇයි වඩිවේලුම මැරුණෙ අර විදියට?"

"අපි ඒක ගැන නොහිතා ඉම්මු වික්ටර්. රා බීලා වැඩි



Scanned by CamScanner

sinhalaebooks.com

වුණා. ලං පාර කියලා හිතාගෙන තේ වත්ත මැදින් ගියා. කකුල් හැප්පිලා වැටුණේ සොහොන උඩට. දුවපු වේගෙට ඔළුව වැදුණා. කුඩු වුණා. එහෙමයි වුණේ."

"හරි....හරි.....එහෙම තමයි වුණේ."

රථය පණ ගැන්වූ ඩර්වින් එය වේගයෙන් පදවන්නට විය.

"කොහොමටත් අපි විල්සන්ගේ නෝනවයි, දුවවයි බලා ගන්න ඕනෑ. ඒක අපේ යුතුකම. ඔය දොස්තරයා සමහර විට ලින්ඩාට වහවැටිලා ද දන්නෙත් නෑ. යස හැඩකාර කෙල්ලනෙ."

"හ්ම් හ්ම්, මටත් ඕක ගැන හිතුණා. ඒකෙත් ඉතින් වරදක් නැහැනේ."

"වරදක් නෑ. ඒත් ඔය දොස්තර ගැනත් සෙවිල්ලෙන් ඉන්න එක හොඳයි. මේ වත්තේ වැඩවලට ඕකුන් ඇඟිල්ල ගහන්න ඉඩ තියෙනවා."

"ඒ ඉතින් මිනිහා ඔය පවුලට සම්බන්ධ වුණොත්නේ."



Scanned by CamScanner

sinhalaebooks.com

# 06

ග්‍රේලෑන්ඩ් බංගලාවේ ගේට්ටුව වසා දමා විශාල ඉබ්බකු දමා ඇත. රමේෂ්ගේ මෝටර් රථය ගේට්ටුව අසලට ළං වෙත්ම මහලු සේවකයා ගේට්ටුවේ යකඩ කුරු අතරින් බලා ඒ වෛද්‍යවරයාගේ රථය බව හඳුනා ගත්තේය.

තම ඉණේ තිබුණු යතුරු කැරැල්ලෙන් එක් යතුරක් ගෙන යකඩ කුරු අතරින් අත දමා ඉබ්බා ගැලවූ ගම්මුදලි වසා තිබූ ගේට්ටුව ඇරියේය. දොස්තර මහතා තමාගේ රිය ගේට්ටුව අතරින් මිදුලට ගෙන අඹ ගස් සෙවණේ නැවැත්විය.

"දැන් ගේට්ටුව නිතරෝම වහලා තියෙන්නෙ මහත්තයා. ලොකු නෝනා එහේ මෙහේ ඇවිදිනවා නොවැ. පුංචි බේබි අලුතින් ඉබ්බෙකුත් ගෙනැල්ලා දැම්මා."

"පුංචි බේබි බංගලාවේ ඉන්නව ද ලොකු උන්නැහේ?"

"පුංචි බේබි පොඩි ගමනක් ගියා. මයෙ හිතේ යාළුවෙක්ගේ ගෙදර. අර ටීමේකර් බංගලාවේ ඩල්සි නෝනලාගේ මොකක් ද උත්සවයක් තියෙනවා නොවැ. අර පුංචි ගෑනු ළමයෙක්ගේ. එහේ තමා යන්ඩ ඇත්තේ. තෑගි පාර්සලයකුත් ඇන්න තමයි කාරෙකට නැග්ගේ. දැන් එනවාත් ඇති. මහත්තයා වාඩි වෙලා ඉන්ඩකෝ."

"හොඳයි. මං මෙහෙන් වාඩි වෙලා ඉන්නම්. මට දන්වලා එන්න බැරි වුණා."

රමේෂ් සාලයේ වූ ඇඳි පුටුවේ වාඩි වූවේය.

"මහත්තයාට මං බොන්න මොකුත් ලෑස්ති කරන්නම්."

"එපා. අපි පස්සෙ බොමු. මෙහෙන් වාඩි වෙන්නකෝ. මං කැමතියි අංකල් එක්ක ටිකක් කතා කරන්න. අපිට කතා කරන්න බැරි වුණානේ."

ගම්මුදලි පඩිය මත වාඩි වුණේය.



Scanned by CamScanner

sinhalaebooks.com



"මේ පුටු තියෙද්දී ඇයි බිම වාඩි වෙන්නේ? මෙහෙන් වාඩි වෙන්න."

"මේ හොඳයි මහත්තයා. කොහේ වුණත් මොකෝ."

"වැඩිහිටියෙක් බිම ඉන්දැද්දි පුටුවක වාඩි වෙලා ඉන්න එක මගෙ හිතට හරි නෑ. ඒකයි කිව්වේ."

"ගණන් ගන්න එපා මහත්තයා. මේක මගේ පුරුද්දනේ. මට ඒකෙන් කිසි අගෞරවයක් වෙන්නෙ නෑ."

"එහෙම හිතෙනවා නම් කමක් නැහැ. මං ඉතින් අංකල්ගෙ නම වත් දන්නේ නෑ නොවැ. කොහොම කියල ද කතා කරන්නෙ?"

"මට ඉතින් ඔය තොයි කවුරුත් කතා කරන්නෙ ගම්මුදලි කියලා. මගේ වාසගම ගම්මුදලි නෙවැ. මුල් නම පුංචි අප්පුහාමි වුණාට ඒ නමෙන් කතා කරන අය අඩුයි. අපේ ලොකු මහත්තයා ඉන්දැද්දිත් මට කතා කළේ "ගම්මුදලි" කියලා. උන්නාන්සෙට මං නැතුවම බෑ. ගම්මුදලි මෙහෙ එනවා. ගම්මුදලි තේ එකක් හදාගෙන එනවා. ගම්මුදලි මං අද රෑ කෑමට එන්නෑ. ඔන්න ඔය වාගෙ කොච්චරවාත්ම ගම්මුදලී, ගම්මුදලී. අනේ අපරාදෙ



Scanned by CamScanner

sinhalaebooks.com

කියන්ට බෑ අපේ මහත්තයා. උන්නාන්සේ මතක් වෙන කොට පපුව වාවන්නෙ නෑ. මොනයම්ම කරුමයක් පඩිසන් දුන්න ද කියලා දෙවියන් වහන්සේ විතරයි දන්නේ."

මහල්ලා විස්සෝපයෙන් සුසුම් ලන්ට පටන් ගත්තේය. තමා බලාපොරොත්තු වූ මාතෘකාව මහල්ලාගෙන්ම ආරම්භ වීම රමේෂ් දොස්තර මහතාගේ සොම්නසට හේතු විය.

"හොඳයි. ගම්මුදලි, එතකොට ඔය විල්සන් මහත්තයා කළයි කියන වංචාව හරියටම උන්නැහේ කළයි කියලා ගම්මුදලි විශ්වාස කරනවා ද?"

"පිස්සු ද මහත්තයා? අපේ මහත්තයාට එහෙම කරන්න කිසිම ඕනෑකමක් තිබුණෙ නෑ. මොනවයින් ද අඩු? මේක කුමන්ත්‍රණයක් හතුරන්ගේ."

"විල්සන් මහත්තයාට හතුරොත් හිටිය ද?"

"අපේ මහත්තයා කාට ද හතුරෝ නැත්තේ. තමුන්නැහේම දන්නවානේ බුදු හාමුදුරුවන්ටත් හතුරෝ හිටියා. අර මොකා ද අජාසත්ත ද දේවදත්ත ද කියලා එකෙක් මහ තඩි ගලක් පෙරළුවාය කියනවානෙ උන්වහන්සේගේ ඇඟට."

"දේවදත්ත"

"එතකොට, ජේසුස් වහන්සේට හතුරුකම් කළේ පිටස්තරයෙක් ද? නෑ. එකපතේ කාගෙන හිටපු තමන්ගේම ගෝලයා ජුදාස්. එහෙව් එකේ මහත්තෙලෑ අපිට හතුරෝ ඉන්න එක අහන්ට දෙයක් ද?"

"ඒ කියන්නේ විල්සන් මහත්තයාටත් හතුරො ඉන්න ඇති."

"නැතුව නැතුව, හැබැයි මහත්තයා උන්නාන්සේ හිතාගෙන හිටියේ තමුන් වටේට ඉන්න හැම එව්වොම පරාණේ දෙන්ට හදන මිත්තරයෝ කියලා. ඒ වුණාට විනේ කැටෙව්වෙත් උන් ටිකම තමා."

"ඒ කියන්නේ විල්සන් මහත්තයා, වත්තේ සල්ලි යාළුවෝ වෙනුවෙන් වියදම් කළාය කියන එක ද?"



Scanned by CamScanner

sinhalaebooks.com

"නෑ. නෑ. මහත්තයා එහෙම එකක් නෙවෙයි. මය වංචාව කළේ වෙන පිරිසක්. අහු වුණේ අපේ ලොකු මහත්තයා. තේරුණා ද? අවසානෙ දී ලොකු මහත්තයාගේ පිට වරද පැටෙව්වෙත් මේ ගොල්ලම කියලයි මගෙ හිත කියන්නෙ."

"ඒ කියන්නෙ වෙන කෙනෙක් හොරකම් කරලා විල්සන් මහත්තයා අහු වෙන විදියට වැඩ කළා කියන එකනෙ. එහෙනම් ඉතින් විභාගයක් පවත්වලා කවු ද වැරදිකාරයා කියලා හොයා ගන්න තිබුණානෙ. එහෙම එකක් කළේ නැද්ද?"

"ඒක කරන්න කලින් තමයි මය අවාසනාවන්ත සිද්ධිය වුණේ මහත්තයා. කොළඹින් පරීක්ෂණේට එන්න කලින් දවසේ තමයි මහත්තයා මළේ. බාගදා විභාගේ පැවැත්තුවා නම් උන්නාන්සේ නිදහස් වෙන්නත් තිබුණා. ඒත් මැරිලාවත් උන්නාන්සේට නිදහස් වෙන්න බැරි වුණේ මය මොනවාදෝ ෆයිල් වගයක් හොරකම් කර ගෙන ගිහිල්ලා තිබුණු නිසා කියනවනෙ."

එවිටම මෝටර් රථයක් ගේට්ටුවෙන් ඇතුළු විය.

"අන්න, පුංචි බේබි ඇවිල්ලා." ගමමුදලි වහාම මෝටර් රථය වෙත ගියේය.

"බේබි, අන්න අර දොස්තර මහත්තයා ඇවිල්ලා." ඔහු ලින්ඩාට කීවේය.

ලින්ඩා මෝටර් රථය මිදුලේ නෙළවර නතර කොට දොස්තර මහතා වෙත ආවාය.

"ඇත් ගොඩක් වෙලා ද ඇවිල්ලා ඩොක්ටර්?"

"නෑ. මං ඇවිල්ලා ටිකක් වෙලා."

"සමාවෙන්න වෙලා ගියාට. මං හිතුවා අද ඩොක්ටර් මෙහෙ එව් කියලා."

"ඒත් මට කියන්නත් බැරි වුණානේ. ඇත් කොහොම ද අම්මගෙ තත්ත්වේ?"



Scanned by CamScanner

sinhalaebooks.com

"පොඩි වෙනසක් දැනෙනවා. මේ දවස් ටිකේම එයාට හොඳට නින්ද ගියා. දෙඩවිල්ල නම් ඇහුණා. ඒත්, වෙනදා තරම් තදබල ගතියක් පෙනෙන්න නෑ."

"හොඳයි, මම කතා කරලා බලන්නම්."

සිල්වියා මැතිනියගේ මුහුණෙහි වෙනදා නොමැති තැන්පත් බවක් දොස්තර මහතාට පෙනිණි. ඇය වෛද්‍යවරයා දෙස කෙළින්ම බලා මඳ සිනාවක් පහළ කළාය.

"මැඩම්, දැන් කොහොම ද ඔයාට? අමුත්තක් දැනෙනවා ද?" ඈ හිස සලා එය අනුමත කළාය.

"අම්මා ඊට පස්සේ නින්දෙන් ඇවිදින්න ගියේ නැද්ද මිස් ලින්ඩා?"

තමා පසෙකින් සිටි තරුණියගෙන් ඇසූ පැනයට ඇය පිළිතුරු දෙන්නට කලින්ම සිල්වියා හිස දෙපසට වනා පිළිතුරු දුන්නාය.

"මම දැනුවත්ව නම් නැහැ ඩොක්ටර්. ඇරත් දැන් ගේට්ටුව නිතරම වහලා තියෙන්නෙ."

"ඒක හොඳයි. ඒත් සෙවිල්ලෙන් ඉන්න. ගේට්ටුවෙන් නොයා යන්න ඕන තරම් තැන් තියෙනවානෙ මිස්. නැද්ද?"

"ඩොක්ටර් අම්මිත් එක්ක කතා කරන්න. මං තේ ටිකක් ලෑස්ති කරන්නම්."

ලින්ඩා වෛද්‍යවරයාට රෝගියා පරීක්ෂා කිරීමට ඉඩ දී ගෙතුළට ගියාය.

වෛද්‍යවරයා මෝහනයේ මූලික පියවර ආරම්භ කිරීමට සූදානම් වූයේය. ඒත් සමගම අඩක් වැසී තිබුණු ජනෙල් පියන් ඉබේටම කිරි කිරි හඬින් විවෘත වනු වෛද්‍යවරයාට දක්නට ලැබුණි. එය සුළඟින් වන්නක් වෙන්නට ඇතැයි ඔහුට සිතුණේ සීතලම සීතල සුළඟක් විවෘත වූ ජනෙල් කවුළුව අතරින් ඇදී ආ නිසාය. සුළඟින් වියන් ඇඳේ වටා වූ රැලි පෙළ සෙලවෙන්නට විය. ජනෙල් තිර අසාමාන්‍ය ලෙස සෙලවෙන්නට



Scanned by CamScanner

sinhalaebooks.com

විය. සිල්වියාගේ දෙනෙත් විශාල වී දීප්තිමත් වී ජනෙල් කවුළුව වෙත යොමු විය. වෛද්‍යවරයා විස්මයටත්, භීතියටත් පත් වූයේය. ඔහුගේ ඇඟෙන් සියුම් දහඩියක් පිට වන්නට විය. ඔහු අසා තිබූ නමුත්, පොතින් පතින් කියවා තිබූ නමුත් මෙවැනි දර්ශනයක් ජීවිත කාලය පුරාවට දැක නොතිබුණි.

ඝන මීදුම් වලාවක් ජනේලය තුළින් කාමරයට ඇදී ආවේය. එය මිනිස් රුවක හැඩය ගෙන සිල්වියාගේ ඇඳ අද්දර සිටගත්තේය. ඡායාරූපයේ දැක තිබුණු විල්සන් මහතාගේ ප්‍රතාපවත් රුව හඳුනා ගැනීමට තරුණ වෛද්‍යවරයාට වෙහෙසක් ගැනීමට සිදු වූයේ නැත. එහි විනිවිද පෙනෙන ස්වභාවයක් විය.

"වද නොදී යනවා මෙතනින්. තුඹටත් මැරෙන්න ඕන වෙලා ද? ඉක්මනට යනවා. නැත්නම් මීදුමට උඹවත් ගොදුරු වෙනවා. මගේ අණ පිළිපැදපන්. අපේ වැඩ අපි බලා ගන්නම්. තේරුණා ද?"

අද්භූත කටහඬකින් මෙසේ කියවුණි. දොස්තර මහතා සිහිසුන්ව එතැනම ඇද වැටුණි. එවිටම ලින්ඩා තේ බන්දේසිය රැගෙන කාමරයට පිවිසුණාය. ඇය දුටුවේ ඇඳ මත වාඩි වී සිටින සිය මව සහ බිම වැටී සිටින වෛද්‍යවරයාය. ඈ, කෑ ගැසුවාය.

"ගම්මුදලි සීයා........ගම්මුදලි සීයා, ඉක්මනට එන්න."

ඇගේ කෑ ගැසීමෙන් ගම්මුදලි හා ඇග්නස් යන දෙදෙනාම කාමරයට දිව ආහ.

"මේ මොක ද මගෙ දෙයියනේ?" කියමින් ගම්මුදලි දොස්තර මහතා ඔසවා ඇඳ මත තැබීය. ලින්ඩා වතුර වීදුරුව ගෙන දොස්තරගේ මුහුණට වතුර ස්වල්පයක් ඉස්සාය. මඳ වේලාවකින් ඔහු ඇස් ඇර බැලුවේය. ඔහුගේ මුහුණ සුදුමැලි වී තිබුණි.

"ඔයාට මොක ද වුණේ ඩොක්ටර්? මොනවාට හරි බය වුණා ද?"



Scanned by CamScanner

sinhalaebooks.com

"ම්.....ම්....... නෑ......නෑ. මේ නිකම් ෆේන්ට් වුණා. ඔළුව කැරකෙන්න වගේ ගත්තා. ඒකයි." වෛද්‍යවරයා කාමරය සිසාරා දෙනෙත් යවමින් බැලුවේය.

"එහෙම කිව්වට මහත්තයා මොනවට හරි බය වෙලා තියෙනවා. ඒ බව මට මූණෙන්ම කියන්න හැකි." ගම්මුදලි සැක සහිතව කීවේය.

"මේ තේ එක බොන්න. එතකොට හරි යාවි."

උගත් වෛද්‍යවරයා තමා ක්ෂණිකව දුටු දෙයින් කම්පා වූවා විනා සිදු වූ දේ ඔහුගේ මනසේ ප්‍රබල කම්පනයකට හේතුවක් නොවීය. අවතාර හා භූතාත්ම පිළිබඳව බටහිර විද්‍යා ප්‍රබන්ධ හා බුදුසමය ඇතුළු අනෙකුත් ආගම්වලින් ඉදිරිපත් කර ඇති තොරතුරු පිළිබඳව ඔහු කියවා තිබුණි. එහෙත් ජීවමාන අවතාරයක් හෝ භූතාත්මයක් සියැසින් දුටු මුල්ම වරට මෙවැනි තත්ත්වයක් ඇති වීම ස්වාභාවික සිද්ධියකි. සාමාන්‍ය පුද්ගලයකු නම් මෙබඳු අවස්ථාවක දී බොහෝ කලක් උමතු ස්වභාවයෙන් පසු වනු ඇත. එහෙත් තමන් දුටු දේ පිළිබඳව වෛද්‍යවරයා තුළ එබඳු ප්‍රබල චිත්ත ස්වභාවයක් නොවීය.

"අපි යමු එළියට. මට ඔයත් එක්ක ටිකක් කතා කරන්න ඕන."

දොස්තර මහතාගේ ඉල්ලීමට අනුව ලින්ඩා ද කාමරයෙන් පිටව ආලින්දයට පැමිණියාය.

"අපි මිදුලට යමු. එතැන නිදහස්. ඇගී අම්මා, ඔයා අම්මිව ටිකක් බලා ගන්න." ලින්ඩා සහ රමේෂ් දෙපළ අඹ ගස් සෙවණේ වූ උද්‍යාන පුටුවල ඉඳ ගත්හ.

"ලින්ඩා, මම ඔයාට ඇත්තම කියන්නම්. ඒත් මේ ගැන හිත කලබල කර ගන්න එපා." දොස්තර මහතා වටපිටාව විමසිල්ලෙන් බැලුවේය. අඳුරු සෙවණැලි ඇති විල්සන් මහතාගේ භූතාත්මය කොහේ හෝ සිට තමන් දෙස බලා සිටිනු ඇතැයි ඔහුගේ සිත කීවේය.



Scanned by CamScanner

sinhalaebooks.com

"කියන්න ඩොක්ටර්, ඇත්තටම ඔයා මොනවා හරි බය හිතෙන දෙයක් දැක්කා නේද?"

"ඔව් මිස් ලින්ඩා. මං ඔයාලගෙ තාත්තා දැක්කා. එයා ආවේ මීදුමක් වගේ. කාමරේ ඇතුළට මීදුමක් වගේ ඇවිත් එයාගෙ නියම ස්වරූපයට පත් වුණා. ඒත් එක්කම එයා මට තර්ජනය කළා."

"මොනවා! අපේ තාත්ති ඔයාට තර්ජනය කළා?"

"ඔව්. මේවා හොයා බලන එක නවත්වන්න කිව්වා. ඒවා එයාලම බලා ගන්නම් කිව්වා. නැත්නම්........."

"නැත්නම්.......?"

"ඔව්. එහෙම කළේ නැති නම් මීදුමට මාවත් ගොදුරු වේවි කියලත් කිව්වා."

"ඩොක්ටර් විශ්වාස කරනවා ද අවතාර. හොල්මන් ගැන?"

"මිනිස්සු මැරුණට පස්සේ අවතාරයක් හරි භූතාත්මයක් හරි බවට පත් වෙන්න පුළුවන්. විද්‍යාත්මකවත්, දාර්ශනිකවත් ඒ බව පැහැදිලි කරලා තියෙනවා. බුද්ධාගමේත්, වෙනත් ආගම්වලත් මරණින් පස්සේ ජීවිතය ගැන විග්‍රහ වෙලා තියෙනවා මිස් ලින්ඩා. සමහර පුද්ගලයෝ මරණින් පස්සේ භෞතික ශරීරය අත් හැරලා ගියාට ආත්මීය ශරීරයකින් ජීවත් වෙනවා. මේ භූත කොට්ඨාස නැවත ශරීරයක් ලැබෙන තුරු භෞතික සිරුරකින් තොරව ජීවත් වෙනවා. සමහරු මීදුමක්, එහෙම නැත්නම් පාරදෘශ්‍ය සිරුරකින් යුතුව ජීවත් වෙනවා.

ඒක විද්‍යාත්මකවත් ඔප්පු වෙලා තියෙනවා. සමහර භූතයෝ ඡායාරූපවල සටහන් වුණු අවස්ථා අන්තර්ජාලයෙන් බලා ගන්න පුළුවනි. ඒ අයට ශබ්ද කරන්න, එහේ මෙහේ ගමන් කරන්න, කතා කරන්න පුළුවන්. ඒ වගේම තවත් අයට හරියට අපි කරන්නා වාගේම තමන්ගේ අතින් පයින් අල්ලන්න පහර දෙන්න පුළුවන්. සමහරුන්ට බැහැ. කරන්න හිතුණට ඒ ඉන්ද්‍රියයන්ට භෞතික දේවල් අහුවෙන්නෑ. ඒවා හරහා යනවා."



Scanned by CamScanner

sinhalaebooks.com

"ඒ තියෙන්නෙ ආත්මයකට වහලා තියෙන කාමරයකට බිත්ති අතරින් හරි දොරෙන් හරි ඇතුළු වෙන්න පුළුවන් ද?"

"පැහැදිලිවම ඒ අයට පුළුවනි. සිරුරේ ස්කන්ධය මොහොතින්ම අඩුයි. දුකයි."

"ඩොක්ටර් කියන්නෙ අපේ තාත්ති ආත්මයක් වෙලා ආවා කියල ද?"

"සියයට දෙසීයක්ම මට විශ්වාසයි මිස් ලින්ඩා. මිස්ටර් විල්සන් තමයි ඒ ආත්මයක් විදිහට ආවේ කියලා."

"ඒත් තාත්ති මැරිලා ගොඩක් කල්?"

"ඒකෙ ප්‍රශ්නයක් නෑ. මේ විදිහට මිය ආත්මම එක තැනකට බැඳිලා ඉඳලා තවත් තැනක් සොයා ගෙන වන්න කල් යන්න ඉඩ තියෙනවා. ඒ වගේම තමන්ට යෝග්‍ය අවස්ථාව උදා වෙන තුරු සිටියා වෙන්නත් පුළුවනි."

"කොහොමවත් ඒ විදිහට හරි තාත්ති මේ ළඟ ඉන්න එක ගැන මට සතුටුයි ඩොක්ටර්."

"ඔව්. එයා මියාලගෙ ආරක්ෂකයෙක් විදිහට කටයුතු කරාවි. ඒත්......"

"ඇයි?"

"එයා කාගෙත් හරි පළිගන්න හදනවා."

"පළිගන්න?"

"ඔව්. එයා කවුරු හරි පළු පස ලුහුබඳිනවා. ලින්ඩා."

"අම්මිගෙ දෙවනිලවලෙනුත් ඒ ගැන කියවුණා ඩොක්ටර්. මට මිය මෙතෙනෙ අම්මිගෙ ජීවිතේට අනතුරක් වෙයි කියලා."

"ඒ ගැන නම් මිය වෙන්න එපා. මියාගෙ තාත්තා ඒකට ඉඩ තියන්නෙ නැති බවට මට විශ්වාසයි. ජීවත් වෙන අපට වැඩිය මොනතරම් දේවල් ඒ අයට කරන්න පුළුවන් බලයක් තියෙනවා. ලින්ඩා. මම මියාගෙ තාත්තට කියනවා මං මියාගේලොකට උදව් කරන්න ලෑස්ති වෙන්නෙත කියලා. ඒ වගේම



Scanned by CamScanner

sinhalaebooks.com

ඔයාගෙ තාත්තට ලැබුණු ඔය අපවාදයෙන් එයා බේරා ගන්න මං උත්සාහ කරන බවත් එයාට කියනවා. එතකොට එයා මට කරදර කරන එකක් නෑ."

"මටත් තාත්ති පෙනේවි ද ඩොක්ටර්?"

"සමහර විට ඔයා බය වේවි කියලයි එයා ඔයාට පෙනෙන්න එන්නෙ නැත්තෙ. ඔයා ඇනුවත් වුණාට පස්සේ එයා පෙනෙන්න ඒවි. මොනවා වුණත් එයා ඔයාලට ආදරෙයිනෙ."

එකෙණෙහිම ඝන මීදුම් වලාවක් පාවී අවුත් දෙදෙනා වසා ගත්තේය. ලින්ඩා වෛද්‍යවරයාගේ අත ඇඩි සේ අල්ලා ගත්තාය.

"බය වෙන්න එපා. මිස් ලින්ඩා. මං ඉන්නවා ඔයා ළඟ."

මීදුම අතරින් මෘදු ස්පර්ශයක් තමාගේ මුහුණෙහි ඇතිල්ලෙන්නාක් සේ ලින්ඩාට දැනුණි. ඇය ඉදිරියේ කාරුණික මුහුණක සේයාවක් මැවී නොපෙනී ගියේය. මීදුම පහ විය.

"ඩොක්ටර්......ඩොක්ටර්. අර මීදුම....... ඒ....."

ලින්ඩා ගොත ගසමින් වෛද්‍යවරයාගේ ඇතම අල්ලා ගත්තාය.

"මිස් ලින්ඩා, අපේ කතාව තාත්තාට ඇහිලා. අනිවාර්යයෙන්ම එයා තමයි ආවේ."

වෛද්‍යවරයාට බයක් නොදැනුණි. පළමු අත්දැකීම නිසා ඔහු තුළ තිබූ බය පහව ගොස් තිබුණි. එහෙත් ලින්ඩාගේ හදවත නොනවත්වාම වේගයෙන් ස්පන්දනය විය.

"බය වෙන්න එපා, ඔක්කොම හරි යාවි." වෛද්‍යවරයා ඇය අස්වැසුවේය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 07

මෙවදා රමේෂ්ට බොහෝ වේලා යන තුරු නින්ද නොආවේය. ඔහු සයනයෙහි වැතිරී එදින සිදු වූ ඒ භයානක සිද්ධිය මෙනෙහි කළේය. මීදුමත් සමග ඇදී ආ විල්සන්ගේ භූතාත්මය සිහි වෙද්දී ඔහුගේ සිත තුළ බියක් ද ඇති විය. මෙය සාමාන්‍ය කෙනකු පිළිනොගන්නා කතාවකි. බොහෝ අවතාර, හොල්මන් පුද්ගලයන්ගේ සිත් තුළ මවා ගන්නා රූප පමණි. රාත්‍රියේ කළුවරට දවල් කාලයේ පෙනෙන ස්වභාවයට වඩා අස්වාභාවිකව රූප නිර්මාණය කිරීමේ හැකියාවක් ඇත. සෙවණැල්ලකට පවා සජීවී බවක් ආරූඪ වී පෙනෙනුයේ තමාගේ සිතේ නිර්මාණය වන දර්ශනවලට අනුරූපවය. එහෙත් මෙය එබඳු වූවක් නොවන බව දොස්තර මහතා හොඳින්ම දන්නේය.



මේ භූතාත්මයට යමක් ස්පර්ශ කිරීමට නොහැකි බව පැහැදිලිය. ඔහුගේ විනිවිද පෙනෙන සුලු පෙනුමෙන්ම ඒ බව



Scanned by CamScanner

sinhalaebooks.com

පැහැදිලිය. එසේ නම් මොහු තමාගේ අරමුණු ඉටු කර ගැනීම සඳහා වෙනත් පුද්ගලයකු උපයෝගී කර ගැනීමට පෙලඹෙනු ඇත. එසේ නම් ඔහු ඒ සඳහා උපයෝගී කර ගන්නේ තමාගේ සමීපතමයන් විය හැක. මෙහි දී වඩාත්ම ඉලක්ක විය හැක්කේ සිල්වියා විය හැක. මක්නිසා ද යත් ඇය විසින් කිසිවකු තුළ සැකයක් නූපදවන බැවිනි. තමාගේ සිතිවිල්ල නිවැරදි නම් වඩිවෙල්ගේ මරණය පිළිබඳව ද අමුතු සැකයක් ඇති වන බව තේරුම් ගිය රමේෂ්ගේ සිත තුළ මහත් කැලඹිල්ලක් ඇති විය. එහෙත් වඩිවෙල් විල්සන්ගේ මරණයට සම්බන්ධ වන්නේ කෙසේ ද?

තමා රහස් පරීක්ෂකයකු සේ කටයුතු නොකළ යුතු යයි රමේෂ්ට වැටහුණි. එහෙත් යම්කිසි අබිරහසක ඇතුළාන්තය විමර්ශනය කිරීමේ කුතුහලයෙන් පොලඹවනු ලැබූ ඔහුගේ සිත, අතීතයත් වර්තමානයත් අතර සංසන්දනාත්මක තුලනය කිරීමක යෙදුණේ ඉබේටම වාගේය.

භූතාත්මය තමා පිළිබඳව විශ්වාසය තැබුවහොත් ඔහු සම්පූර්ණ සිද්ධිය කෙසේ හෝ තමාට ප්‍රකාශ කරනු ඇත. ලින්ඩා පිළිබඳව වූ පැහැදීම ද ඔහු තුළ වූ උනන්දුව වැඩි කළේය. භූතාත්මය විසින්ම අතීතයේ වූ අත්වැරදීම නිවැරදි කර, ලින්ඩා හා ඇගේ මවට සාධාරණය ඉටු කර දෙනු ඇතැයි ඔහුගේ විශ්වාසය විය.

එදින රාත්‍රිය ලින්ඩාට ද නිදිවර්ජිත එකක් විය. ඇය ද තරුණ වෛද්‍යවරයා පිළිබඳව සිතිවිල්ලෙන්ම රාත්‍රියේ මධ්‍යම යාමය වන තුරු ගත කළාය. ඔහු හා තමා අතර සංසාරික බැඳීමක් පවතින්නේ යයි ලින්ඩාට සිතුණි. ඔහු වැදගත් මහතෙකි. සියලුම මුණගැසීම්වල දී ඔහු ඒ බව පෙන්නුම් කළේය.

තම පියාගේ ආත්මය විසින් ඔහු තේරුම් ගන්නා බව ලින්ඩාට පැහැදිලිය. භූතාත්මය පිළිබඳව දැනුවත් වූ මොහොතේ පටන් ලින්ඩා මානසික පීඩනයට ලක් වූවාය. ඇයගේ මානසික හුදකලා භාවය මවගේ රෝගී තත්ත්වය නිසා දෙගුණ තෙගුණ



Scanned by CamScanner

sinhalaebooks.com

විය. වරෙක තමා උමතු විය හැකි යයි ඇයට සිතිණි. ඒ මනස්තාපයෙන් තරමක් දුරට හෝ අස්වැසිල්ලක් ලැබුවේ දොස්තර මහතාගේ සමීප ඇසුර ලැබීමෙනි. තමා මෙලොව තනි වී නැති බව ඇයට සිතුණේ එම ඇසුරෙනි.

"ඇයි පුංචි බේබි, නින්ද යන්නෙ නැද්ද?"

"නෑ ඇගී අම්මා, මට අද හිතට හරි නෑ."

ඇග්නස් මේ දිනවල නිදා ගත්තේ ලින්ඩාගේ කාමරයේය.

"පුංචි බේබි මොනවට හරි බය වෙලා තියෙනවා මේ දවස්වල. මට ඔයාගෙ මූණෙත් ඒ බව පේනවා."

"මං මොනවට බය වෙන්න ද? මට අම්මි ගැන බයයි ඇගී අම්මා."

"අපෙ ලොකු නෝනා ඔය හොඳින් ඉන්නෙ. බේබි ඉතින් ඇයි බය වෙන්නෙ? ඇරත් අර දොස්තර මහත්තයත් බේබිට කැමති හැඩයි. නැද්ද?"

"ඇගී අම්මා කොහොම ද ඒ ගැන කියන්නෙ. ඔයා අනුන්ගෙ හිත් කියවන්න දන්නව ද?"

"ඔව්, මමත් ඔය වයස පහු කළානෙ බේබි"

"හ්ම්.....හ්ම්.... ඔයත් එහෙනම් ඒ කාලෙ හොඳ හැඩට වැඩට ඉන්නැති."

"ඔව් ඔව්. මං පාරෙ යනකොට ඉලන්දාරි හැරී හැරී බලනවා."

"ඒ බලපු අයගෙන් එක්කෙනෙක් ද ඇගී අම්මා තෝර ගත්තේ."

"ඔව් බේබි. ඒත් ඉතින් ඒ මනුස්සයා අකාලෙම මාව දාලා ගියා නොවැ."

"මොනවා කරන්න ද ඇගී අම්මා. ඒක ඔයාගෙ ලබා උපන් හැටි වෙන්නැති. අපි කැමති දේවල් අපෙන් ගොඩාක් ඈත් වෙනවා. ඒකනේ ලෝක ස්වභාවය."



Scanned by CamScanner

sinhalaebooks.com

"ඔව් බේබි. බලන්න, අපේ ලොකු සෑරුයි නෝනයි මොන තරම් ආදරෙන් ද හිටියේ. ඒත් ඉතින්......" ඇග්නස් සුසුමක් හෙළුවාය. සීතල සුළඟක් ජනේලයට ඉහළින් වූ කවුළුවෙන් ඇදී ආවේය. ලින්ඩා දෑස් තදින් පියා ගත්තාය. සැනසිලිදායක බවක් ගතට දැනිණි. ඇයට නොදැනුවත්වම නින්ද ගියාය. ඇගී අම්මාට සිහිනයෙන් කොඳුරන හඬක් ඇසුණි.

"ඇගී, පුංචි බේබි ඇස් දෙක වාගෙ බලා ගනින්. උඹට තේරුණා ද?"

විල්සන් මහතාගේ රුව ඇයට සිහිනයෙන් පෙනිණි. ඇග්නස් තිගැස්සී අවදි වූවාය. පුංචි බේබි නින්දේ පසු වෙයි. ඇයගේ නින්දට බාධා කිරීම නොමැනවයි සිතූ ඇග්නස් ඇය අවදි නොකළාය. විල්සන් මහතා අවතාරයක් වී නිවස අවටම සැරිසැරීමට ඉඩ ඇති බව ඈ සිතුවාය.

☆ ☆ ☆ ☆ ☆ ☆ ☆

සිල්වියා මැතිනියගේ දෙටු සොහොයුරා වූ පතිරණ මහතා, මසකට වරක් "ග්‍රේලෑන්ඩ්" බංගලාවට පැමිණ සිය සොයුරියගේ හා ඥාති දියණියගේ දුක සැප බලා යයි. ඔහු සංචාරක හෝටලයක හිමිකරුවෙකි. ඉරිදා දින උදයේ ඔහු, ග්‍රේලෑන්ඩ් වතු යායට පැමිණියේය. ලින්ඩා සිය මාමණ්ඩිය ආදරයෙන් පිළිගත්තාය.

"දුව කොහොම ද දැන් අම්මාගෙ තත්ත්වේ?" ඔහු මෝටර් රථයෙන් බසින ගමන්ම ඇසූ පළමුවන ප්‍රශ්නය එයයි.

"පහුගිය දවස් ටිකේ එයා හීනෙන් දොඩවන්නයි ඇවිදින්නයි පටන් ගත්තා. අපි ඩොක්ටර් කෙනකුටත් පෙන්නුවා. යමුකෝ අම්මිව බලන්න."

සිය සොහොයුරා දුටු සිල්වියාගේ මුවගට මඳ සිනාවක් ආවාය. ඇය තම දෝතින් සොයුරාගේ අත් අල්ලා ගත්තාය.

"නංගී, දැන් ඔයාට කොහොම ද? අමාරුවක් නැහැ නේ ද?"



Scanned by CamScanner

sinhalaebooks.com

ඔහු ඇසූ ප්‍රශ්නයට සිය නිහඬ බවින්ම පිළිතුරු දුන් සිල්වියා හිස දෙපසට සැලුවාය.

"අපි බදුල්ලට හරි කොළඹට හරි අම්මව එක්ක ගිහිල්ලා ස්පෙෂලිස්ට් කෙනෙකුට පෙන්නමු ද දුව?"

"අම්මි කැමති වෙයි ද කියන්න බෑ මාමෙ. එයා මේ ඩොක්ටර් ළඟට එක්ක යන්නවත් බැරි වුණා. ඊට පස්සේ ඩොක්ටර්ම අම්මි ළඟට ආවා. මගෙ හිතේ එයාට අම්මිගෙ තත්ත්වේ තේරුණා. අපි තව ටිකක් බලමු. මට ඔයත් එක්ක විශේෂ දෙයක් කියන්න තියෙනවා." ලින්ඩා සිය මාමාට කීවාය.

"එහෙනම් අපි එළියට යමු දුව."

ලින්ඩා සිය පියාගේ පුනරාගමනය මාමණ්ඩියට විස්තර කළාය. ඔහු ඒ සියල්ල සාවධානව අසා සිටියේය.

"දුවේ, මේක බලා ඉන්න හොඳ තත්ත්වයක් නෙවෙයි. අපි මොනවා හරි කරන්න වෙනවා. මම දන්න අපේ යාළුවෙකුට මේ වාගේ අත්දැකීමකට මුහුණ දෙන්න වුණා. කිව්වට කවුරුවත් විශ්වාස කරන්නෙත් නෑ."

"ඒ මොකක් ද මාමෙ?"

"ඒ ගොල්ලන්ගේ ආච්චි මැරුණට පස්සෙ තුන් මාසෙ දානයකුත් දීලා ඉවර වෙලා මාසයක් විතර ගිහිල්ලා තියෙනවා. මෙයයි නැඟියි සාලෙ වාඩි වෙලා ටී.වී. බල බලා ඉන්න කොට සුදු පාට ඇඳුමක් ඇඳගෙන නාකි ගෑනු කෙනෙක් ගෙට ගොඩ වෙලා තියෙනවා. බලන කොට ඒ වෙන කෙනෙක් නෙවෙයි, අර මැරුණු ආච්චි. මේ දෙන්නා හොඳටම ඇකලා තියෙනවා. මෙයාලට කිසිම දෙයක් කර කියා ගන්න බැරුව ගල් ගැහිලා ඉඳලා. ආච්චි කෙළින්ම මේගොල්ලන් දිහාවේ රවලා බලලා ගේ ඇතුළට ගියාලු. ඔය පළවෙනි සිද්ධිය.

ඊට පස්සේ මෙයාලා යන යන තැන පස්සෙන් එන්න ගත්තා. නැඟයි ගෙදර අනිත් අයට මෙයාව පේන්නෙ නෑ. මේ දෙන්නට විතරයි පෙනෙන්නෙ. සමහර වෙලාවට ගෙදර දොර



Scanned by CamScanner

sinhalaebooks.com

ජනෙල් රෙදිවලට බලාගෙන ඉන්න කොට ගිනි ඇවිළෙනවාලු. ජනෙල්වල වීදුරු කැඩිලා බිමට වැටෙනවා. කෑම කන්න වාඩි වුණාම හිස් පුටුවක ආච්චි වාඩි වෙලා රවාගෙන බලා ගෙන ඉන්නවා. ඔය විදියට සෑහෙන කලක් මේ අවතාරෙ අර දෙන්නට කරදර කළා. අන්තිමේ දී බොහොම බලගතු කට්ටාඩියෙක්ව ගෙන්නලා භූතාත්මය බෝතලේක සිර කරලා මූදට ගෙනිහින් දැම්මා. අපිත් ඒ විදියට කරමු. මෙහෙම භූතාත්මයක් ගේ ඇතුලේ තියා ගෙන ඉන්න බැහැනේ."

"මම කල්පනා කරලා බලලා කියන්නම් මාමේ."

"කල්පනා කරන්න දෙයක් නෑ දුව. මේක කරන්නම වෙනවා."

පතිරණ මහතා එදිනම සවස ආපසු යාමට පිටත් වූයේය. වත්තේ සීමාව පසු කිරීමට ආසන්න වත්ම ඔහුගේ මෝටර් රථයේ ඉදිරිපස ටයරයක් පුපුරා ගියේය. ඉතා විශාල ශබ්දයක් සහිතව සිදු වුණු මේ පිපිරීම නිසා හෙතෙමේ තිගැස්සී ගියේය. ගැස්සීමත් සමග රථය නතර විය. පතිරණ මහතා කාරයෙන් බැස පිපිරුණු ටයරය පරීක්ෂා කළේය. එය ගැලවීමටත්, කාරයේ ඇති අමතර රෝදය සවි කර ගැනීමටත් සෑහෙන වේලාවක් ගත වනු ඇත. මීදුම නිසා පරිසරය තරමක් අඳුරු ස්වභාවයක් ඉසිලිය. රථයේ ඩිකිය ඇරිය පතිරණ මහතා මුරිච්චි ගලවන උපකරණය අතට ගෙන රෝදය ගැලවීමට පටන් ගත්තේය. ටික වේලාවකින් රෝදය ගැලවීමට හැකි විය. ජැක්කුව මත රථය සමබර විය. ඩිකියේ තිබූ අමතර රෝදය දෙස බැලූ ඔහුට දෙවියන් සිහි විය. එහි ද හුළං නැත. කරකියා ගත හැකි දෙයක් ගැන ද සිහියට නොආවේය. ආපසු පයින්ම බංගලාවට ගොස් බංගලාවේ මෝටර් රථයේ අමතර රෝදය ගෙන ඒම විනා කළ යුතු දෙයක් නොතේරුණි.

පතිරණ මහතාගේ උදව්වට දෙවියන් විසින් එව්වාක් මෙන් වත්තේ වැඩ ඇරී එන කම්කරුවෙක් මාර්ගය දිගේ එමින් සිටියේය. ඔහුගේ හිස මුළුමනින්ම කළු පැහැති තුවායක් වැනි



Scanned by CamScanner

sinhalaebooks.com

රෙද්දකින් වසා ගෙන සිටියේ අධික සීතල නිසා වන්නට ඇත. පරණ දිගු කලිසමක් හා කබායක් වැනි ඇඳුමකින් සැරසී සිටි හෙතෙම කාරය වෙත ළඟා වෙත්ම පතිරණ මහතා ඔහු ඇමතුවේය.

"බලන්නකෝ වෙච්ච වැඩේ. කාර් එකේ ටයර් එක පිපිරුණා. ස්පෙයා වීල් එකෙත් හුළං බැහැලා. හරිම වැඩේ. විල්සන් මහත්තයාගෙ බංගලාව තියෙන තැන ඔහේ දන්නවා නේද?"

අමුත්තා හිස සැලුවේය.

"ඔහේට පුළුවන් නම් මේ ටයර් එක අරගෙන ගිහිල්ලා ලින්ඩා මිස්ට කියලා එයාගෙ වාහනේ ස්පෙයා වීල් එක අරගෙන එන්ඩ. මං ඉල්ලන ගාණක් දෙන්නම්. කැමති ද? මේක ලොකු උදව්වක්. මං සිල්වියා නෝනගෙ අයියා."

මඳ සිනාවක් පහළ කළ අමුත්තා කිසිදු කතා බහකින් තොරවම ටයරය ඔසවා කරට ගත්තේය. ආපසු හැරී පාර දිගේ වේගයෙන් ගමන් කළේය.

"යාන්තම් ඇති, එහෙමවත් කෙනෙක් මුණගැසුණු එක."

පැය බාගයකින් පමණ ටයරය රැගත් අමුත්තා කාරය වෙත ළඟා විය. ඔහුට ස්තුති කළ පතිරණ ටයරය සවි කිරීමට පටන් ගත්තේය.

"අද හරිම සීතලයි නේද?"

"හ්ම්........" අමුත්තා කිවේ එපමණකි.

"ඔහේ මේ වත්තේම ද පදිංචිය?"

"ඔව්, මේ ළඟම"

"කොහොම ද දැන් වත්තේ තත්ත්වය. විල්සන් මහත්තයා ඉන්න කාලෙට වඩා හොඳ ද?"

මේ ප්‍රශ්නයෙන් අමුත්තා කලබල වූවා සේ පෙනුණි.

"වරදක් නෑ. මිනිස්සු කවිරුත් එකයි මහත්තයා." අමුත්තා

පිළිතුරු දුන්නේය.

ටයරය සවි කර අවසන් වෙත්ම සහ මීදුමත් පැතිරෙන්නට විය. අමුත්තා නොපෙනෙන ගාණටම එය ප්‍රදේශය වසා ගත්තේය.

අත පත හා කාරයේ දොර සොයා ගත් පතිරණ එහි වාඩි වී අමුත්තා ඇමතුවේය. මීදුම අතරින් ඔහුගේ රුව ඡායාවක් සේ පෙනුණි.

"ඔහේට බොහොම ස්තූතියි. මේක තියා ගන්න මහත්මයාට." පතිරණ මහතා රුපියල් සීයේ නෝට්ටු දෙකක් අමුත්තාට දුන්නේය.

"එපා, සල්ලි එපා. මට සල්ලිවලින් වැඩක් නෑ මහත්තයා."

පතිරණ මහතා බලෙන්ම වාගේ එම නෝට්ටු අමුත්තාගේ අතේ තැබිය. ඔහුගේ අත් අයිස් මෙන් සීතලව තිබුණි.

"ඔහේට හොඳටම සීතලයි වාගේ. ගෙදර ගියාම හරි යයි. ඔහේත් එක්කම යන්න පුළුවන්. නගින්න."

වාහනයේ ඉදිරි දොරින් අමුත්තා කාරයට ගොඩ වුණි. කතාවකින් තොරවම වාහනය ඉදිරියට ඇදී ගියේය.

දෙමං හන්දිය පසු කරද්දී ලැයිම්වල එළිය පෙනුණි. කම්කරුවා මෙතැනින් බසිනු ඇතැයි සිතූ පතිරණ මහතා, වාහනයේ බ්‍රේක් පැඩලය මත කකුල තබමින් රථයේ වේගය අඩු කළේය. අමුත්තාට බසින්නට දොර හැර දෙන්නට ඒ දෙස හැරී බලත්ම ඔහු දුටු දෙයින් විස්මයට පත් වුණි. ඔහුගේ රුධිර පීඩනය අධික වන්නට විය. සියොලඟම සීතල වී හිරි වැටී ගියේය. අමුත්තා එහි සිටියේ නැත. ඔහුට දුන් මුදල් නෝට්ටු දෙක පමණක් එම ආසනය මත විය.

සිහිය එළවාගත නොහැකි වූ පතිරණ මහතා දැස් පියා ගෙනම ස්ටියරිං වීලය මත හිස තබා ගෙන මද වේලාවක් නිසොල්මනේ සිටියේය.

රථයට පසු පසින් ඇසෙන්නට වූ හෝන් හඬින් තිගැස්සී

sinhalaebooks.com

පියවි සිහිය ලැබූ පතිරණ මහතා, තම රථය පාර අයිනට ගත්තේය.

"හලෝ මිස්ටර් පතිරණ. මොක ද මේ වාහනේ පාර මැද නතර කර ගෙන? නින්ද ගියා ද?"

ඩර්වින් මහතා සිය රථයේ සිටම පතිරණ ඇමතුවේය.

"ඕ....... ඩර්වින් මහත්මයා, මගේ ඔළුව ටිකක් රිදෙන්න ගත්තා. මගෙ හිතේ ප්‍රෙෂර් එක වැඩි වෙලා වෙන්නැති. දැන් හොඳයි."

"ප්‍රශ්නයක් නැහැනේ. අපි යන්න ද එහෙනම්?"

"හොඳයි හොඳයි, ඩර්වින් මහත්මයා."

ඩර්වින්ගේ රථයට ආසන්නයෙන්ම පතිරණ මහතා තම රථය පැදෙව්වේය. තවමත් ප්‍රකෘති තත්ත්වයට පත් නොවූ මනස තුළ මහත් වික්ෂිප්ත බවක් ඇත. කම්කරුවකු ලෙසින් පැමිණියේ කිසියම් භූතාත්මයක් බව ඔහුට දැන් පැහැදිලිය. 'මේ තරමින් බේරීමට ලැබීම තමාගේ පෙර වාසනාවකැ'යි ඔහුට සිතුණි. කම්කරුවකු ලෙසින් දුටු අමුත්තාගේ මුහුණ පැහැදිලිව නොපෙනුණත් එහි හැඩය හා උඩු රැවුල සිහි වෙත්ම ඔහුට යම් පුද්ගලයකු මතක් විය. ඒ අනෙකකු නොව, ඔහුගේ මස්සිනා වූ විල්සන්ය.

Scanned by CamScanner

sinhalaebooks.com



විල්සන් මහතාගේ එකොළොස් වන අනුස්මරණය යෙදී ඇත්තේ විසිපස් වෙනිදාටය. එදිනට වැඩිහිටි නිවාසයකට දානය පිරිනැමීම නොකඩවා සිදු කෙරෙන චාරිත්‍රයකි. දානයෙන් පසු ලින්ඩා ඇතුළු පිරිස විල්සන් මහතාගේ සොහොන් කොත අබියස මල් තබා පහන් දල්වති. සිල්වියා මහත්මිය ද එම කටයුත්තට සහභාගී වේ. පවුලේ හිතවතකු වශයෙන් පෙනී සිටි ඩර්වින් මහතා ද මල් පොකුරක් තබා තම මිතුරා සිහි කිරීමට අමතක කරන්නේ නැත.

රමේෂ් දොස්තර මහතා ද ප්‍රථම වතාවට මෙම කටයුත්තට සහභාගී වීමට ඇරයුම් ලබා සිටියේය. ලින්ඩාගේ පවුලට ඇති හිතවත්කම් ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගැනීමට තරුණ වෛද්‍යවරයා සිතුවේය. ඔහු තම මිතුරු වෛද්‍යවරයකුගේ වෑන් රථය මේ සඳහා ලබා ගත්තේ පිළියෙල කර ගත් දානය සහිත භාජන රැගෙන යාම පිණිසය.

දහවල් ආහාර පිරිනැමීමෙන් පසුව පිරිස ආපසු වත්ත බලා ගියහ. සවස පහන් දැල්වීම සඳහා ද සොහොන් කොත වෙත යාමට රමේෂ් ඉදිරිපත් වුණි. රමේෂ් නගරයෙන් අලංකාර මල් පොකුරු කීපයක්ම ගෙනාවේය.

මළ හිරු බසිනා හැන්දෑවේ දී පිරිස සොහොන අබියස පහන් දැල්වූහ. ඩර්වින් මහතා තමා ගෙන ආ මල් පොකුර තබා තම මිතුරා සිහිපත් කොට ආපසු ගියේ සෙසු අය මදක් ප්‍රමාද වන බව ප්‍රකාශ කළ නිසාය. පහන් නිවී යාම වැළැක්වීම සඳහා සිල්වියා, ලින්ඩා හා රමේෂ් දැල්වූ පහන්වල තිර එකට එක් වන සේ යා කළහ. විශාල වූ ආලෝකයක් සහිතව පහන් දැල්ල දීප්තිමත්ව දැල්විණ. එකෙණෙහිම ඇදී ආ සීතල සුළඟ හා මීදුම් වලාවක් විසින් සොහොන් කොත වසා ගන්නා ලදී. ලින්ඩා තම මවගේ අත එක් අතකින් ද, රමේෂ්ගේ අත අනිත් අතින් ද



Scanned by CamScanner

sinhalaebooks.com

අල්ලා ගත්තාය. හෙමිහිට මුමුණන හඩක් අවටින් ඇසිණි. මඳ සුළඟ හා මුසු වුණු මල් සුවඳ හොඳින් දැනිණි. ඔවුන්ගේ සිරුරුවලට අමුතුම ආකාරයේ ජීවයක් දැනිණි. මඳ වේලාවකින් ආ සුළඟින් මීදුම් වලාව අහසට නැග නොපෙනී ගියේය. එහෙත් පුදුමයකි!



ඔවුන් තැබූ මල් පොකුරු අතරින් එකක් ගිනි ගෙන දැවෙමින් පැවතුණි. ඒ, ඩර්වින් සොහොන මත තැබූ මල් පොකුර විය.

ලින්ඩා හා සිල්වියා සොහොන ළඟ දණ ගසා ගත්හ. ඔවුහු දෑත් එක් කොට තම පියා හා සැමියා වෙනුවෙන් නැවතත් යාච්ඤා කළහ. සිල්වියා තම දෙතොල් පමණක් මිමිණුවාය. හීන් කෙඳිරියක් වැනි ශබ්ද වැලක් තොල් අතරින් නික්මුණි.

"තාත්ති, මං ඔයාට හැමදාමත් ආදරෙයි. ඔයා අපි ළඟ ඇත්තටම ඉන්නවා. අපිව දාලා යන්න එපා. අපිව රැක ගන්න තාත්ති." ලින්ඩා හීන් හඬින් මිමිණුවාය.

"අපි යමු දැන් පුංචි බේබි." ඇග්නස් සිල්වියාගේ දෙවුරෙන්



Scanned by CamScanner

sinhalaebooks.com

අල්ලා නැගිට්ටුවාය.

පිරිස සොහොන් බිමෙන් නික්ම බංගලාව බලා ආ...ය. එදින රාත්‍රී භෝජනය සඳහා නැවතීමට රමේෂ්ට සිදු වුණි. ආපසු එන ගමනේ දී කිසිදු අමුතු සිදුවීමක් නොසිදු විය.

එදින රාත්‍රියේ නැවත සිල්වියා සිහිනෙන් ඇවිද ගියාය. රාත්‍රී එකොළහ හමාර වදිද්දී දොර ඇරෙන හඬින් ලින්ඩා අවදි වූවාය. ඇය තම මවගේ කාමරය වෙත යද්දී අවතාරයක් ලෙසින් හීන් සීරුවේ සාලය දිගේ ගොස් වැරන්ඩාවේ ගමන් කරන සිය මවගේ රූපය දුටුවාය.

ඇය ඉදිරිපස දොර ඇරීමට අත තබත්ම ලින්ඩා ඇයගේ අත අල්ලා ගත්තාය.

"අම්මී කොහේ ද මේ යන්නේ?"

"ය.....තු....ර..... ගන්න. ඒක මට ඕනා."

"මොන යතුරක් ද අම්මී?"

"රහස තියන තැන යතුර මට ඕනා."

"අපි යමු. යතුර හොයා ගමු පස්සේ."

ලින්ඩා තම මව ආපසු කාමරයට ඇරලුවාය. ඇග්නස් අවදි වූයේ ඉනික්බිතිවය. ලින්ඩා තම මව සිහිනයෙන් මෙන් කියූ දේ ගැන යළිත් මෙනෙහි කළාය.

පසු දින සවස් වරුවේ ලින්ඩා හා ඇග්නස් රමේෂ්ගේ බෙහෙත් ශාලාවට ගියහ.

රෝගීන් දෙදෙනෙක් පමණක් ප්‍රතිකාර ගැනීමට ඒ වේලාව වන විට තමාගේ වාරය පැමිණෙන තෙක් සිටියහ. ඒ දෙදෙනා බෙහෙත් ගෙන නික්ම යාමෙන් පසුව ලින්ඩා කාමරයට පිවිසුණාය. ලින්ඩා ආසනයේ වාඩි වන තෙක්ම රමේෂ් ඇය හඳුනා ගත්තේ නැත. ඇය දෙස බැලූ රමේෂ් පුදුම විය.

"ඕ........ මිස් ලින්ඩා, මම හිතුවේ තවත් ලෙඩෙක් කියලා. සමාවෙන්න."



Scanned by CamScanner

sinhalaebooks.com

"ලෙඩෙක් තමයි. බෙහෙත් ගන්න ආවේ."

"මොකක් ද අමාරුව? හිතේ ලෙඩක් ද ගතේ ලෙඩක් ද?"

"ම්......... ඒක කියන්න අමාරුයි. හිත නිසා ගත ලෙඩ වෙනවලු. ගත නිසා හිත ලෙඩ වෙනවලු. මං හරි නේද?"

"ඔයා මටත් වැඩිය ලෙඩ ගැන දන්නවනෙ මිස්."

"මට ඔය 'මිස්' කැල්ල නම් එපා වෙලා. කරුණාකරලා මිස් කෑල්ල නැතුව 'ලින්ඩා' කියලා කියනවා නම් මං කැමතියි ඩොක්ටර්."

"එහෙම ද ලින්ඩා? එහෙනම් මං ඔන්න ඒ විදියට කිව්වා. මටත් ඔය ඩොක්ටර් කෑල්ල එපා වෙලා ඉන්නේ. කරුණාකරලා රමේෂ් කියලා කිව්වා නම්."

"සමාවෙන්න ඩොක්ටර්. නෑ නෑ, රමේෂ්."

දෙදෙනාටම සිනහා ගියේය.

"ඉතින් කියන්න ලින්ඩා මොකක් ද ප්‍රශ්නෙ?"

ලින්ඩා, තම මවගේ සිහිනෙන් ඇවිදීමත්, යතුරක් ගැන කිසූ දෙයත් වෛද්‍යවරයාට කීවාය. කල්පනාවෙන් යුතුව ඇයට සවන් දුන් වෛද්‍යවරයා,

"ලින්ඩා, මේකෙ මොකක් හරි රහසක් තියෙනවා. මං හිතන්නේ ඔයාගෙ තාත්තා අම්මට කියපු දෙයක් වේ. යතුරක් ගැන අපි ටිකක් හොයලා බලමු. කොහොමටත් මම ඉරිදා එන්නම්. අපි නිදහසේ කතා කරලා බලමු. මොකක් ද මේ යතුරේ ප්‍රශ්නය කියලා. එහෙම හොඳයිනේ?"

"ඔව්. අපි එහෙම කරමු. මට තනියම මේ ගැන මොනවත් හිතා ගන්න බැරි තැනයි ඔයා හොයා ගෙන ආවේ."

ලින්ඩා හා ඇග්නස් පිටත්ව ගිය පසු රමේෂ් යතුරේ ප්‍රශ්නය ගැන කල්පනා කළේය. යතුරක් නම් යතුරකින් ඇරිය යුතු යමක් මෙයට සම්බන්ධ විය යුතුය. කාමරයක දොරක් පෙට්ටගමක් හෝ සේප්පුවක්, අල්මාරියක් මෙම රහසට ගේ



Scanned by CamScanner

sinhalaebooks.com

ඇති බව ඔහුගේ දැනුමට වැටහුණි. සමහර විට විල්සන් මහතාට අයත් විශේෂ ලියකියවිලි හෝ වස්තුවක් ඉහත කී භාණ්ඩයක හෝ ස්ථානයක සඟවා තිබෙන්නට ඉඩ ඇත.

සමහර භූතාත්ම තමාගේ ජීවතුන් අතර සිටින බිරිඳ හා දරුවන්ට මුදල් ආදිය ලබා දුන් අවස්ථා පිළිබඳව වාර්තා වී තිබේ. එක් පුද්ගලයෙක් මිය ගොස් භූතාත්මයක් ලබා ගෙන තමාගේ දුව ආරක්ෂා කර තිබේ. එමෙන්ම ඇය විශ්වවිද්‍යාලයට තේරෙන තුරුම දිනපතා මුදල් පසුම්බියක් මේසය මත තැබූ බවත්, දියණිය විවාහ වූ පසු භූතාත්මය පිටව ගිය බවත් රමේෂ්ගේ මිතුරකු විසින් ද ප්‍රකාශ කර තිබුණි.

එක්තරා පුද්ගලයකු මිය ගියේ අබිරහස් අන්දමටය. හදිසියේ අතුරුදන් වූ මෙම පුද්ගලයා කොහේ හෝ යන්නට ඇතැයි නෑදැයෝ සිතූහ. ඔහුගේ බිරිඳ වෙනත් විවාහයක් ද කර ගත්තාය. අවුරුදු ගාණකට පසු, එම මිය ගිය තැනැත්තාගේ සොහොයුරියකට ආරූඪයක් ඇති විය. ඇය ආරූඪයෙන් තම සොහොයුරා මරා දමා වැළලූ ස්ථානය පිළිබඳව කියුවාය. වැඩිහිටියන් මේ බව පොලීසියට දැන්වූ පසු පොලිස් නිලධාරීන් පැමිණ ඒ ස්ථානය හාරා බැලූ විට මළ තැනැත්තාගේ කොටස් හා ඇඳුම් සොයා ගන්නට හැකි විය. අවසානයේ බිරිඳ හා අනියම් සැමියා විසින් ඔහු මරා වළ දමා ඇති බවට තොරතුරු හෙළි විය. රමේෂ් මේ බව පුවත්පතකින් කියවා තිබුණි. විල්සන් මහතාගේ දිවි නසා ගැනීම පිටුපස කිසියම් රහසක් ඇති බවට තමා තුළ වූ සැකය යතුරක් පිළිබඳව වූ ප්‍රකාශයෙන් සනාථ වන බව ඔහුට කල්පනා විය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 09

"මොනව ද පුංචි බේබි, මේ ගේ පෙරළ පෙරළා හොයන්නේ?" ලින්ඩා ගෙයි තිබූ ලාච්චු හා අල්මාරිවල තිබූ ලොකු කුඩා යම් යම් දේවල් සොයමින් විමසද්දී ඇග්නස් ඇසුවාය.

"ඇගී අම්මා, මේ යතුරක් ගැන හොයන්නේ."

"යතුරු නම් බේබි මේ ඕන තරම් තියෙන්නේ, බංගලාවේ හැම තැනම."

"ඒකත් ඇත්ත."

ලින්ඩාට කියවුණි. වැඩකට නොගන්නා යතුරු ඕනෑ තරම් ගබඩාවේ ඇති ලාච්චු හා පෙට්ටගම්වල තිබුණි. එනිසා යතුරු සෙවීම පලක් නොවන බව ලින්ඩාට වැටහුණි.

රමේෂ් එදින පැමිණියේය.

"රමේෂ්, මේ යතුරු හෙවිල්ල වැඩකට නෑ. පරණ යතුරු ඕනෑ තරම් තියෙනවා."

"මමත් ඒ ගැන කල්පනා කළා. අපි හොයන්න ඕන යතුර නොවෙයි."

"එහෙනම්?"

"යතුරු නැති වෙලා අරින්න බැරි මොනවා හරි තියෙනව ද කියලා. එතකොට ඒකට ගැළපෙන යතුර හොයා ගන්න පුළුවන් වෙයි."

"හරියටම හරි. එහෙම තමයි වෙන්න ඕනෑ."

"මේ බංගලාවේ යතුරු නැති වෙලා අරින්න බැරි කාමර මොකුත් තියෙනව ද?"

"මං දැනුවත්ව නම් නැහැ."



Scanned by CamScanner

sinhalaebooks.com

"එතකොට අල්මාරි, කබඩ්, සේප්පු?"

"ම්....... නෑ. එහෙම දේවලුත් නෑ."

"එහෙනම් මේ වෙන තැනක තියෙන දෙයක් ගැන කියන්නේ. සමහර විට නිධානයක් ගැන ද දන්නෙත් නෑ. ඔයාට වාසනාව පෑදෙන්න වගේ යන්නේ."

"මොන පිස්සු ද රමේෂ්? ඇරත් නිධාන තියෙන්නේ ගල් පර්වතවල. එහෙම නැත්නම් ගල් ගෙඩි ඇතුලේ කියලයි මං අහලා තියෙන්නේ."

"ඉතින් ළමයෝ, ගල් දොර අරින යතුර ඔයාලගෙ තාත්තට හම්බවෙන්න ඇති. එයා ඒක දූට දෙන්න තමයි හොයන්නේ."

"ඇයි ඉතින් ඒක එයාටම දෙන්න පුළුවන්නේ."

දෙදෙනාම සිනහ වෙන්නට විය. වෙනදාට වඩා දෙදෙනා අතර කතාබහ ළෙන්ගතු ස්වරූපයක් ගත්තේය. දෙදෙනාටම රහසේ කිසියම් ආදරණීය හැඟීමක් දෙසිතේම පහළ වන බව ප්‍රත්‍යක්ෂය. එහෙත් ඒ බව ඉඟියෙන් හෝ පළ නොකිරීමට දෙදෙනාම ප්‍රවේසම් වූයේ, දෛවය විසින් ඒ අවස්ථාව සලසන තුරු ඉවසා සිටීම මැනවයි සිතා සිටි නිසා විය හැක.

"තේ බොන්න."

ඇග්නස් තේ සහ කළු දොදොල් අඩංගු බන්දේසිය දෙදෙනා ළඟ තැබුවාය.

තේ බොමින් සිටිය දී කළු දොදොල් කැබැල්ලේ තෙල් මාත්තු කිරීම සඳහා ගෙනැවිත් තිබූ දැන්වීම් පත්‍රිකා කීපය රමේෂ් කියවා බැලුවේ පුරුද්දට මෙනි. ඔහු කුඩා කල සිටම අතට අසු වන ඕනෑම කොළ කැබැල්ලක් කියවා මිස වීසි කිරීම නොකළේය. කඩයක දී පවා අත පිසීමට ලැබෙන කොළය කිනම් එකක් දැයි ඔහු කියවා බැලුවේය.

අතට ගත් දැන්වීම් පත්‍රිකාව අලුත්ම එකකි. එය රෝනියෝ කර ඇත.



Scanned by CamScanner

sinhalaebooks.com

"ලින්ඩා, මේ බලන්න. මේකෙ තියෙන දේ?"

"මොනව ද? ආ...... ඔය අපේ වත්තේ පාවිච්චි කරපු බඩු විකුණන වෙන්දේසිය ගැන කියන ලීෆ්ලට් එකනෙ. ඔයාටත් ඕන නම් මොනවා හරි ගන්න පුළුවන් ලාබෙට."

"හරි, මමත් අනිවාර්යයෙන්ම යනවා. හෙටනේ දිනේ. ඔය ලට්ට ලොට්ට මොනවා හරි ගන්න බැරියැ. මගේ ඩිස්පෙන්සරියටත් ඔය කබඩ්, රාක්ක වගේ දේවල් උවමනායි."

"එහෙනම් මාත් එන්නම්."

"ඔව් ඔව්. බඩු උස්සන් එන්නත් කෙනෙක් එපායැ මට."

"ඇයි, අපි ඉස්සුවොත් ඉස්සෙන්නෙ නැති වෙයි ද රමේෂ්?"

"ඉස්සෙයි අපූරුවට. කොන්ද කැඩෙයි."

"එහෙම ද හිතං ඉන්නේ?"

"බංගලාවල හැදුණු කෙල්ලෝ එහෙම තමයි. සියුමැලියි."

"මේ මේ බොරු එපා. මං එහෙම හැදිච්ච පියරු බබෙක් නෙවේ."

"මම විහිළුවට කිව්වෙ ළමයෝ. තරහ වෙන්න එපා."

බොහෝ වේලාවක් කතාබහ කිරීමෙන් පසු රමේෂ් ආපසු ආවේය.

එදින රාත්‍රියේ රමේෂ් නින්දේ පසු වෙද්දී සිහින දකිමින් සිටියේය. එක සිහිනෙක ඔහු, කළු කබායක් හැඳ ටයි පටියක් ද පැළඳ සිටි පුද්ගලයකු දුටුවේය. ඔහු කරකැවෙන පුටුවක වාඩි වී සිටියේය. ඔහු නොනවත්වාම තම පුටුව මත කරකැවෙමින් දිග සුරුට්ටුවකින් දුම් වළලු පිට කළේය. එක්වරම සුරුට්ටුව වෙනුවට ඔහු අත වූයේ දිග මහත යතුරකි. එය ඉදිරියට දිගු කළ පුද්ගලයා,

"මේක අරගන්න. සේප්පුව අරින්න. මාව නිදහස් කරන්න."



Scanned by CamScanner

sinhalaebooks.com



යනුවෙන් පවසා නොපෙනී ගියේය. රමේෂ තිගැස්සී අවදි විය. මේ සිහිනය විල්සන් මහතාට සම්බන්ධ බව ඔහු සිතුවේය. තමන්ගේ මේ පිළිබඳව ඇති උනන්දුව නිසා ඇති වූ මානසික තත්ත්වයකින් මෙබඳු දේවල් පෙනෙන්නේ යයි ඔහු සිතුවේය. වතුර වීදුරුවක් බිව් රමේෂ්, නැවත ඇස් පියා ගත්තේය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 10

වික්ටර් හා ඩර්වින් දෙදෙනා එදා "සෙරන්ඩිබ්" අවහන්හලේ දී මුණගැසුණේ එදිනට ඩර්වින්ගේ පණස් වැනි උපන්දිනය යෙදී තිබුණු බැවිනි. මධුවිත ද තොල ගෑ දෙදෙනා රාත්‍රී හතට පමණ අවන්හලෙන් පිට වී ග්‍රේලෑන්ඩ් වත්ත බලා පිටත් වූහ.

"වික්ටර්, අර දොස්තරයා දැන් ඉන්නේ පරණ බංගලාවෙම කියලා මට ආරංචියි."

"හ්ම්.....හ්ම්..... මමත් කීප වතාවක්ම දැක්කා, මිනිහා බංගලාවට යනවා එනවා. මගෙ හිතේ එයා ලින්ඩත් එක්ක සම්බන්ධකමක් තියෙනවා."

"මමත් හිතනවා එහෙම. මොක ද එදා විල්සන්කාරයාගේ මෙමෝරියල් එක දවසෙත් මිනිහා ඇවිල්ලා හිටියා. ඒ දෙන්නාගෙ හැසිරීමෙනුත් මට හිතුණා එහෙම දෙයක් ඇති කියලා."

"අපිට මොකෝ. අපිටත් තියෙන්නෙ හිත හොඳකම පෙන්නගෙන ඉන්න එකනේ. ඒකෙන් අපිට හානියක් වෙන්නෙ නෑනේ."

"මහ ගෑනිට කතා කර ගන්න බැරි එකේ මොනවා වෙන්න ද? විල්සන්කාරයා මැරෙන කොටම එහෙම වුණු එක නම් කියලවත් කර ගන්න බැරි වැඩක්."

"ඒක හරි. ඇරත් උන්ට මොනවට ද ඔය හැටි බූදලයක්. කෙල්ලට ඇවැද්දට ඔය තියෙන හරිය මදැයි."

වික්ටර් සිනහවෙන් යුතුව කීවේය. ඩර්වින් ද ඊට අනුබල දෙමින් සිනාසුණේය.

"එහෙනම් මං බහින්නම් සර්, ළඟටම ආවා දන්නෙම නැතුව."



Scanned by CamScanner

sinhalaebooks.com

වික්ටර්ගේ බංගලාවට යන මාර්ගය අසල ඩර්වින්ගේ රථය නතර විය. ඩර්වින්ගෙන් සමු ගත් වික්ටර් රථයෙන් බැස්සේය.

රථය නැවත පෙරට ඇදුණි. වංගුව ළඟ දී පාර නොපෙනෙන තරමට පැතිර පැවති ඝන මීදුම නිසා මඳ වේලාවක් රථය නවතා ගැනීමට ද ඩර්වින්ට සිදු වුණි.

වාහනය තුළ ද ලේ පවා මිදෙන සුලු සීතලක් ඇතිණ. ඩර්වින්ගේ උරහිසේ සීතල යමක් ස්පර්ශ වනු ඇතී ඔහු පසුපස හැරී බැලුවේය. එක්වරම දුටු දෙයින් ඔහුගේ සිරුර සලිත වී ගියේය. දහඩියෙන් සිරුර තෙත් වුණි. ඇඟ වෙව්ලන්නට විය. පසුපස අසුනේ පුද්ගලයෙක් වාඩි වී සිටියේය. ඔහු, කළු කබායක් හා කළු කලිසමක් හැඳ සුදු ටයි පටියක් පැලඳ ගෙන සිටියේය. රතු පැහැති දෙනෙතින් තමා දෙස බලමින් විලිස්සූ එම පුද්ගලයා අනිකකු නොව, කලකට පෙර මිය ගිය විල්සන් මහතාය.

කෑ ගැසීමට මුව විවර කළත් මුවින් කිසිදු ශබ්දයක් පිට නොවුණි. ගැහෙන්නට වූ ඩර්වින් මහතා කටින් සෙම දමමින් රියදුරු අසුන මත වැටුණි. පසුපසට ගිය රථය ඉවුරේ හැපී නතර විය.

තේ කුඩු පටවා ගෙන කොළඹ බලා ගිය වත්තේ ලොරියක් ආපසු එමින් සිටිය දී වතු පාලකයාගේ මෝටර් රථය අනතුරකට පත්ව ඇති බව එහි සිටියවුන් විසින් දක්නා ලදී. සිහිසුන්ව සිටි ඩර්වින් රෝහල වෙත ගෙන යාමට ඔවුහු කටයුතු කළහ. දින දෙකකින් පමණ ඔහු පියවි තත්ත්වයට පත් වූවේය. ආපසු බංගලාවට පැමිණි ඩර්වින්ට යන්ත්‍ර මන්ත්‍ර දන්නා අයකු ලවා ආරක්ෂාවක් ද කරවන්නට යෙදුණි. වික්ටර් හා ඔහුගේ කතා බහෙන් දෙදෙනාම අවතාරවලට ඇති භය පැහැදිලි විය.

"මට හිතා ගන්න බැරි වුණා. මතක් වෙන කොටත් තව ඇඟ හිරි වැටෙනවා, මිනිහා හිටපු විදිය දැක්කම."

"ඒ වුණත් සර්, මේක සර්ගෙ හිතින් මවා ගත්ත දෙයක් වෙන්න බැරි ද?"



Scanned by CamScanner

sinhalaebooks.com

"මමත් ඒක මගේ ඇස් දෙකට දකිනකම්ම අවතාර, හොල්මන් ගැන විශ්වාස කළේ නෑ වික්ටර්. කිව්වට කව්රුත් විශ්වාස කරන්නෙත් නෑ මේක. වත්තේ තැන් තැන්වල දී ඔය විල්සන්ගෙ අවතාරෙ දැක්කාය කියලා එක එක්කෙනා කියන කතා මම හිතුවේ බොරුවට ගොතලා කියන ඒවා කියලා."

"කෝකටත් අපි ප්‍රවේසම් වෙන්න ඕන සර්. හැබෑ මිනිස්සු එක්ක ගනුදෙනු බේර ගන්න විදියට අමනුස්සයෝ එක්ක බැහැනේ."

"හෙට වෙන්දේසියට කටයුතු ලෑස්ති ද වික්ටර්?"

"ඔව් සර්. බඩු ටික ඔක්කෝම පිළිවෙළ කළා. අර සේප්පුව උස්සන එකයි අමාරු වුණේ. ඒක ගන්න කෙනාටත් අරන් යන්න වෙන්නේ අමාරුවෙන්."

"පරණ යකඩ ගන්න කෙනකුට හැර ඒකෙන් කාටවත් වැඩක් නෑනේ. යතුරක් නැති සේප්පුවකින් වැඩක් තියේවිය. ඕවට යතුරු කපන්නත් බෑ. කපා ගත්තත් රහස් අංකය නැතුව අරින්නත් බැහැ. ඇරත් ඕකෙ වටිනා කියන කිසිම දෙයක් නෑ. පඩි ගෙවලා ඉවර වුණාට පස්සේ ආයි පඩි දවසට කලින් දවස වෙනකම් ඕක හිස්."

"ඒක නම් කව්රුත් ගන්න එකක් නෑ මගෙ හිතේ. ඉතිරි වුණොත් ඔය අයිනකට වීසි කරලා දාමු. දිරලා යන්න."



Scanned by CamScanner

sinhalaebooks.com

# 11

වෙන්දේසියට පෙර දින රාත්‍රියේ දී කර්මාන්ත ශාලාවේ රාත්‍රී මුරකරු නාදන් සැප පහසු පුටුවක වාඩි වී කළු සුරුට්ටුවක් උරන්නට වූයේ සීතල මග හරවා ගන්නටය. කන් දෙක වැසී යන සේ මෆ්ලර් එකක් බැඳ ගෙන සිටියත් දෙපතුල්වලට තදින්ම සීතල දැනිණි. ඔහු වාඩි වී සිටියේ වෙන්දේසියට තබා තිබූ කාර්යාලීය පුටුවකය. එය බොහෝ කලකට පෙර මිලදී ගත් එකක් වූ අතර දැනට තැනින් තැන කුෂන් රෙද්ද දුර්වර්ණ වී තිබුණි. ඔහු ඉදිරියේ වූයේ වෙන්දේසි භාණ්ඩ රාශියකි. පැරණි රාක්ක, මේස, ෆයිල් කැබිනට්ටු, වතුර මෝටර් හා බොහෝ දේවල් ඒ අතර විය.

සුරුට්ටු දුම්වලින් සිරුර රත් වෙන විට නාදන්ගේ ඇස් ඉබේටම පිය වෙන්නට පටන් ගත්තේය. එහෙත් හදිසියේම ඉදිරිපසින් යමක් බිම වැටෙනු ඇසීමෙන් නාදන් අවදි විය. ඔහු පුටුවෙන් නැගිට අවට සොයා බලන්නට පටන් ගත්තේය. විදුලි පහන් දැල්වෙන නිසා පෙරළුණු, බිඳුණු යමක් දක්නට නැත. කළු පාට බළල් තඩියෙක් යකඩ තහඩුවලට උඩින් පැන ගියේය. තම සෙවීම අත්හැර දැමූ නාදන් ආපසු ආවේය. වෙන්දේසි භාණ්ඩ අතරින් තමා පෙර සිටි තැනට ආ නාදන්ට දෙවියන් සිහි විය. තමා වාඩි වී සිටි පුටුවේ වාඩි වී සිටි පුද්ගලයා තමා දෙස බලා සිටිනු ඉවසා සිටිය නොහී හෙතෙමේ, එම ස්ථානයෙන් පලා ගියේ අවසිහියෙනි. කලකට පෙර මිය ගිය විල්සන් මහතා සැප පුටුවේ වාඩි වී සිටියේය.

පසුවදා උදේ තේ පඳුරු අතර වැටී සිටි නාදන් කම්කරුවන් විසින් සොයා ගන්නා ලදී. බීමත්කම නිසා වෙරිමරගාතේ ඔහු වැටී සිටින්නට ඇතැයි ඔවුහු සිතූහ. තමා දුටු දේ ගැන ඔහු කිසිවකුට නොකීවේ ඔවුන් එය විශ්වාස කිරීමට මැළි වන බව දන්නා නිසාවෙනි.



Scanned by CamScanner

sinhalaebooks.com

වෙන්දේසියට පැමිණි බොහෝ දෙනා අවට පදිංචිකරුවන් හා වත්තේම සේවක මහත්වරුන්ය. දොස්තර රමේෂ් හා ලින්ඩා මෙනෙවිය ද පැමිණ සිටියහ.

ලින්ඩා කෙරෙහි පැමිණි පිරිස බොහෝ සැලකිලි දැක්වූහ. ඇය හා කතා කිරීමට උනන්දු වූහ. ඇගේ මෑණියන්ගේ දුක සැප විමසා බැලූහ. වික්ටර් හා එම මහත්මිය ද ඩර්වින් ද ඇය හා කුලුපගව කතා කළහ.

"මිස් ලින්ඩා, මොනව ද දැන් තෝර ගන්නේ?"

ඩර්වින් මහතා ද ඇගෙන් විමසුවේය.

"තාම මොකුත් තෝර ගත්තෙ නෑ අංකල්. බලමු, මොනවා හරි හම්බවෙයි ද කියලා." ඈ පිළිතුරු දුන්නාය.

දොස්තර මහතා හා කැටුව ඇය භාණ්ඩ සමූහය පරීක්ෂාවෙන් බැලුවාය.

"මොනවා ගන්න ද කියලා මට නම් හිතා ගන්න බෑ. වැඩකට ඇති දෙයක් නෑ." ලින්ඩා පැවසුවාය.

"මම නම් අර රාක්ක දෙකයි, ලියන මේසෙයි, පුටුවයි වෙන් කර ගත්තා. ඔයාට හොඳ නැද්ද අර ටයිප්රයිටරය?"

"මට මොනවා ටයිප් කරන්න ද රමේෂ්? ඊට වඩා හොඳයි මේ පරණ සේප්පුව." ඇය එතනම තිබූ යකඩ සේප්පුව දෙස බැලුවාය.

"ඔව් ඔව්. මේක හොඳයි මාළු ටැංකියක් තියන්න." රමේෂ් කීවේය.

"රමේෂ්, මේ බලන්න!"

"මොකක් ද?"

"මේ, මේ......... අලවලා තියෙන කොළ කෑල්ල පේනව ද?"

දුර්වර්ණ වී ගිය දුඹුරු පැහැති කඩදාසියක ඉංග්‍රීසියෙන් සටහනක් ලියා තිබුණි. එහි අත්සනක් ද විය.



Scanned by CamScanner

sinhalaebooks.com

"මේ අකුරුයි, අත්සනයි අපේ තාත්තිගේ. බලන්න මොනවා ද ලියලා තියෙන්නෙ කියලා."

"ම්..... මේක පොඩි සටහනක්, ගිණුම් විස්තරයක් ගැන. දිනය 200...."

"අපේ තාත්ති මැරුණු දිනය ඒ. එයා එදාමයි මේක අලවලා තියෙන්නේ. රමේෂ්, මට ඕන මේ සේප්පුව."

ඔවුහු වෙන්දේසිය භාරව සිටි ප්‍රධාන ලිපිකරුවා වෙත ගොස්, තමන්ට තොග අංක 48 යටතේ ඇති සේප්පුව අවශ්‍ය බව කියා සිටියහ.

"මිස්, මේ සේප්පුවට යතුරක් නැහැ. සෙකියුරිටි පින් නම්බර් එකත් නෑ. අපි මේක පරණ යකඩවලට විකුණන්නයි ඉන්නේ. මිස්ට මේකෙන් ප්‍රයෝජනයක් නැති වෙයි." ප්‍රධාන ලිපිකරු කීවේය.

"කමක් නෑ, මට දෙන්න. ගාන කීය ද?"

"මේකෙ යතුර තිබුණා නම් මිස් රුපියල් විසිදාහක් විතර වටිනවා. ඒත් දැන් අපි මිල නියම කරලා තියෙන්නේ එක්දහස් දෙසීයකට."

"හොඳයි, මේ සල්ලි ගන්න."

ලින්ඩා එක්වරම මුදල් ගෙවා රිසිට් පතක් ලබා ගත්තාය.

දොස්තර මහතාගේ කැබ් රියෙන් ගෙනෙන ලද සේප්පුව බංගලාවේ දී සේවකයන් විසින් බිමට බා සාලයට ගෙන යන ලදී. සාලයේ තැන්පත් කළ සේප්පුව මත ලින්ඩා රෝස මල් බඳුනක් තැබුවාය. තාත්තාගේ අත් අකුරු සහිත සටහන ඇති මේ යකඩ සේප්පුව ඇයට තමාගේ පියා පිළිබඳව මතකය අවදි කරවන්නක් විය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 12

මාතර සිට ගෙන්වා ගන්නා ලද මන්ත්‍රාචාර්යයා සහ පතිරණ මහතා රැගත් මෝටර් රථය රාගල බලා එන විට සවස් විය. අවශ්‍ය පූජා ද්‍රව්‍ය නගරයෙන් මිලට ගත් පතිරණ මහතා අතුරු පාර දිගේ ග්‍රේලෑන්ඩ් වතු යාය බලා රථය පදවන්නට පටන් ගත්තේය.

"මහත්තයා, අපි ගෙදරට යන්න කලින් ඔය කියන මහත්තයා වළ දැමූ තැනට යන්න ඕනෑ. එතැන පොඩි සාත්තුවක් තියෙනවා කරන්න. නැත්නම් වැඩේ ටිකක් අමාරු වෙනවා."

මන්ත්‍රාචාර්යවරයාගේ ඉල්ලීමට අනුව වතු යාය ආරම්භ වන ස්ථානයේ දෙමං සන්ධියේ තුඩුරින් පිහිටි, විල්සන් මහතාගේ සොහොන් කොතට ආසන්නයේ රථය නැවතිණි. ජප කරන ලද නූලක් හා ගල් කැට කිපයක් අතින් ගත් කට්ටාඩි මහතා (මන්ත්‍රාචාර්යයා) සොහොන අබියසට ගොස් ගල් වළලා දමා රතු පැහැති නූලක් එය වටා ඇද ගැට කිපයක් ගැසුවේය.

"දැන් හරි, අපි යමු මහත්තයා."

දෙදෙනා ආපසු පිටත් විය. ඩර්වින්ගේ රථය අනතුරට ලක් වූ ස්ථානයට රථය සේන්දු වත්ම ඈඩි මීදුම් වලාවක් මාර්ගය අවහිර කරන බව පතිරණට පෙනිණ. එය සීත කඳු රටේ සාමාන්‍යයෙන් දක්නට ලැබෙන කාලගුණ තත්ත්වයක් නිසා තමාගේ රථයේ මීදුම් ලාම්පු දල්වන ලදී. එහෙත් ඒවා ක්‍රියාත්මක නොවිණි. එක්වරම දැල්වී, විදුලි බුබුළු ඇවී ගියේය. ඝන මීදුමින් මාර්ගය වැසී යද්දී රථය කෙළින්ම ගොස් ඉවුරේ වැදී නතර විය.

"චඃ ... කුත් පේන්නෙ නෑ. වාහනේට මොනවා වුණා ද පෙනෙන්නේ ... නෑ." පතිරණ කලබලයට පත්ව සිටියේය.



Scanned by CamScanner

sinhalaebooks.com

"ඕක තව ටිකකින් හරි යාවි මහත්තයා. අපි බහින්නෙ නැතුව ඉම්මු බලන්න."

ඈතින් නරි රංචුවක හූ හඬ ඇසුණි. මාවවුලන් කීප දෙනකුගේ කන් රිදවන හඬින් පතිරණගේ හදවත ගැස්සුණි.

කට්ටාඩියා මන්ත්‍රයක් ජප කරන්නට පටන් ගත්තේය. එසැණින්ම මීදුම අතුරුදහන් විය. වේලාව සවස හයයි පණස් පහක් බව පතිරණ දුටුවේය. ඩබල් කැබ් රථයේ ඉදිරිපස, ඉවුරේ ඇනී තිබුණි. යතුර කරකවා රථය පණ ගන්වා රිවස් ගියරයට දැමීමෙන් පසු රථය පසුපසට ධාවනය කළ හැකි විය.

රථය හරවා ගත් පතිරණ මහතා බංගලාව බලා පැදවූයේ ගැහෙන හදවතිනි.

"මහත්තයා, මේ වැඩේ ලේසි නෑ. භූතාත්මය දැන් ඉඳම්ම වැඩ පටන් අරගෙන වගේ. කමක් නෑ. මම ඔය වගේ දේවලට බය නෑ. ඔයිට වැඩි ලොකු උදවිය එක්ක මම සෙල්ලම් කරලා තියෙනවා."

කට්ටාඩි මහතා උදම් ඇනුවේය.

රාත්‍රියේ දී මන්ත්‍ර යාගය පටන් ගන්නා ලදි. විශාල පිදේනි තටුවක් සකස් කළ කට්ටාඩියා දුම්මල ගසමින් මන්ත්‍ර ජප කිරීම ආරම්භ කළේය. ගම්මුදලි ආවතේව කටයුතු කළේ හොඳ පළපුරුදුකාරයකු මෙනි. රෑ දොළහ පමණ වන තෙක් මන්ත්‍ර ජප කිරීම කළ කට්ටාඩියා පරල වන්නට වූයේය. හිස දෙපසට සලමින් දොඩවන්නට පටන් ගත්තේය. ගම්මුදලි මන්ත්‍රකරුගේ අණ පරිදි සුවඳ දුම් අල්ලන්නට විය.

"මට කරදර කරන්න එපා. මං දැන්ම යන්නෙ නෑ. මට මේක ඉවර කරලාම යන්න ඕන. ඊට පස්සේ මම යනවා. ඉවර කරන්න ඉඩ දීපල්ලා. නැත්නම්......... නැත්නම් මම, මං ආදරේ කරන දෙන්නවත් අරගෙනම යනවා. මීට පස්සේ කරදර කළොත් උඹවත් ඉවර කරනවා. දැන් පලයන්. මාව නැති කළවුන් නැති කරන්න මට ඉඩ දීපල්ලා. එතකල් මං යන්නෙ නෑ......."



Scanned by CamScanner

sinhalaebooks.com



මෙසේ දෙඩවූ මන්ත්‍රකරු සිහිසුන්ව ඇද වැටුණේය. ඔහු කියා තිබූ පරිදි ගම්මුදලි විසින් වතුර ස්වල්පයක් ඔහුගේ මුහුණට ඉසින ලදී. මඳ වේලාවකින් මන්ත්‍රකරු පියවි තත්ත්වයට පත් වුණි.

ලින්ඩා මන්ත්‍රකරුගේ කියමනෙන් තැති ගත්තාය. කුමක්දෝ මහා විපතක් ඉදිරියේ දී සිදු වන බව ඇයට වැටහිණි. සිහිය ලැබූ මන්ත්‍රකරු තමා අවසිහියෙන් ප්‍රකාශ කළ දේ ගම්මුදලි හා පතිරණ මහතාගෙන් විමසා දැන ගත්තේය.

"ඒ කතා කළේ මැරුණු අයගෙ භූතාත්මය. එයා ඈන්ම යන්න කැමති නෑ. මොන විදියට හරි භූතයා අල්ලන්න පුළුවනි. ඒත් එක්කම නෝනටයි, දුවටයි අනතුරක් වෙන්න ඉඩ තියෙනවා. ඒක නිසා අපි මේ වැඩේ අතඇරලා දාමු මහත්තයෝ, කාගෙත් හොඳට."

"ඔව්, ඒ විදියට කරමු. අපිට බෑ මේ අයට අනතුරක් වෙන්න ඉඩ තියන්න."

"මහත්තයා, මගෙ ජීවිත කාලෙම ගෙවුණේ මේ වැඩවලටම තමයි. මගෙ ගුරුතුමා කිව්ව පළවෙනි කාරණාව



Scanned by CamScanner

sinhalaebooks.com

තමයි, පළමුවෙන්ම තමන් ආරක්ෂා වෙන්න කියන එක. ඒත්, උන්නැහේටම ඒක අමතක වෙලා අකාලේ මරුමුවට ගියා. එදායින් පස්සේ භූතයොත් එක්ක වැඩ කරන කොට බොහෝම ප්‍රවේසමෙන් තමයි කරන්නේ. සමහර භූතාත්ම හරිම දරුණුයි, බලගතුයි. මෙයත් එහෙම කෙනෙක්."

"ඒ වුණාට ගුරුන්නාන්සේ අපේ මස්සිනා මැරෙන්න කලින් හරිම හොඳ කෙනෙක්. කිසිම නරක නපුරු දෙයක් කරපු කෙනෙක් නෙවෙයි. නැද්ද දූව?" පතිරණ මහතා තමා ඉදිරියෙන් සිටින ලින්ඩාගෙන් විමසුවේය.

"ඒක හරි. අපේ තාත්ති හරිම අහිංසකයි. කා ගැනවත් අහිතක් හිතුව කෙනෙක් නෙවෙයි. හැමෝටම අනුකම්පාවයි."

"හරි නෝනේ. ඒ වුණත් මළාට පස්සේ එයා හිටපු කෙනා නෙවෙයිනේ. මේ භූතාත්මෙට, එයාට කරදර කරපු කාගෙන් හරි පළිගන්න වුවමනා වෙලා තියෙනවා. ඒගොල්ලෝ තාම ජීවතුන් අතර ඉන්නවා. හිතුණොත් භූතයකුට යමක්, එයා ඒක කරන එක කරනවා. මං දන්නා ගෙදරක කෙනෙක් මළේ ගෑනු මනුස්සයාගෙ අනියම් පුරුෂයා අතින්. ඒ මිනිහා මැරිලා යකෙක් වෙලා ඇවිත් අර දෙන්නගෙන්ම පළිගත්තා, බොහොම දරුණු විදියට. ඒ විතරක් නෙවෙයි, ඒ දේපළ අදත් පාළුවට ගිහින්."

"එහෙනම් අපිට බලා ඉන්න වෙයි වෙන දෙයක් වෙන්න කියලා."

"ඔව් දූව. අපි බලමු මොනව ද වෙන්නෙ කියලා. ඔය දෙන්නට කරදරයක් නැත්නම් මට කමක් නෑ." පතිරණ මහතා පැවසුවේය.

"මේ දෙන්නට මං ආරක්ෂක නූල් දෙකක් දාන්නම් මහත්තයා. කිසිදේකට බය වෙන්න එපා. ඇරත් මේ භූතාත්මෙන් මේ නෝනලාට කිසිම අනතුරක් නෑ. ආරක්ෂාවට තමයි එයා ඉන්නේ."



Scanned by CamScanner

sinhalaebooks.com

පසුව උදෑසන මන්ත්‍රකරු හා පතිරණ මහතා පිටත්ව ගියහ. ලින්ඩා සිදු වූ සියල්ල දෙස්තර මහතාට කීවාය.

"මට මුලින්මත් ඔය බව දැනුණා. ඔයාගෙ තාත්තාට කාගෙන් හරි පළිගන්න උවමනා වෙලා තියෙන බව. මට සැකයි වඩිවේල්ගේ මරණෙත් මේ සිද්ධියට සම්බන්ධයි කියලා. බලන්න, මිනිහා මළේ හරියටම තාත්තගෙ සොහොන ළඟ දී. ඔළුව අසාමාන්‍ය විදියට පුපුරලා කෑලි විසිරිලා තිබුණේ. ස්වාභාවික වැටීමකින් කවදාවත් ඒ විදියට සිද්ධ වෙන්න බෑ. ගොඩාක් උසකින් වැටුණා නම් හරි. නමුත් කකුල හැප්පිලා වැටීමෙන් ඒ විදියට සිද්ධ වෙන්න බැහැ. හරියට කව්රු හරි උස්සලා පොළවේ ගැහුවා වගේ."

"මටත් ඕකම හිතුණා රමේෂ්. ඒ වුණත් තාත්ති ගැන මට එහෙම හිතන්න බෑ. එයා මළාට පස්සෙවත්......... ඔයාට මතක ද එදා අපේ දානේ දවසෙ සිද්ධිය?"

"මොකක් ද? අර මීදුම් වලාව වෙලාවේ......."

"ඔව්. මීදුම ආපු වෙලාවේ ඩර්වින් අංකල්ගෙ මල් පොකුර ගිනි ගත්තු එක තමයි. ඔයාට හිතෙන්නෙ නැද්ද ඩර්වින් අංකල්ගෙනුත් පළිගන්න උවමනාවක් තියෙන බව?"

"සහතිකයි, ඒ කියන්නෙ ඩර්විනුත් මේ සිද්ධියේ කොහේ හරි ඉන්නවා." ඒ වෙලාවේම ගම්මුදලි එතැනට පැමිණියේ තේ බන්දේසියක් ද ඇතුවය.

"මං පුංචි බේබිලාට තේ ගෙනාවා. මහත්තයට සීනි දැම්මෙ නෑ."

"හොඳයි, හොඳයි. ගම්මුදලි මාමට බොහොම ස්තුතියි."

"ඒක නෙවෙයි පුංචි බේබි, මං කියන්නමයි හිටියේ. මේක මට අමතක වෙලා තිබුණු කාරණාවක්. මේන් බලන්න,"

ඔහු ඉණේ ගසා ගෙන තිබූ යමක් ලින්ඩා අත තැබුවේය. ඒ, තරමක් දිග යතුරක් සහිත යතුරු රඳවනයකි.

"මේක පරණ යතුරක්නෙ. ඉතින් මොකක් ද මේ යතුර?"



Scanned by CamScanner

sinhalaebooks.com

දොස්තර මහතා ඇසුවේය.

"මහත්තයා, මේක මට හම්බ වෙලා අවුරුදු ගණනාවක් වෙනවා. හරියටම කියනවා නම් අපේ ලොකු මහත්තයා මැරුණු දවසේ."

"මොනවා! තාත්ති මැරුණු දවසේ? ඒ කොහොම ද ගම්මුදලි මාමා?"

"බේබි, මහත්තයාගේ කලිසමේ එක සාක්කුවක තිබිලා මේ යතුරු කැරැල්ල පොලිස් මහත්තයෙක් මට බාර දුන්නා. ලොකු නෝනට සිහිය නෑ. පුංචි බේබි පුංචියි. ඉතින් මමයි එතැන මහත්තයා වෙනුවෙන් ඒ වෙලාවේ හිටියේ. මං මේක අරගෙන පොකට් එකේ දාගත්තා. ඊට පස්සේ බංගලාවට ඇවිල්ලා මගෙ කාමරේ පෙට්ටගමට දැම්මා. ආයි මතකයක් වුණේ නෑ. ඊයේ මං පරණ ඇණ වගයක් අවුස්සන කොට මේක දැක්කා. මට මේක දැක්ක ගමන් මතක් වුණේ අර පුංචි බේබිලා වෙන්දේසියෙන් උස්සන් ආපු යකඩ පෙට්ටිය. ඒකෙ යතුර නෑ කිව්වනෙ. සමහර විට ඇලා බලන්ඩ, මේක හරි යාවි. මට මේකෙ හැටි පාටින් දැනුණා, මේක එසේ මෙසේ දොරක එකක් වෙන්ට බෑ කියලා."

දොස්තර මහතා යතුර අතට ගත්තේය.

"හරි, අපි බලමු ඒකට හරි යාවි ද කියලා. හැබැයි ප්‍රශ්නයක් තියෙනවා. යතුර හරි ගියත් ඒකෙ රහස් අංකය නැත්නම් අරින්න බෑ."

"බලමු, යතුර හරි යාවි ද කියලා. යතුර හම්බ වුණා වගේම අංකයත් හම්බ වෙයි. සමහර විට වටිනා දෙයක් තියෙනව ද දන්නෙ නෑ. ඇයි ඔයාට මතක නැද්ද අර තාත්තිගෙ කතාව? යතුරක් ගැන කියවුණා නේද?"

"ම්........ හරි. එහෙනම් මේකයි යතුර. රහස ඇත්තෙ සේප්පුවේ."

දෙදෙනාම සාලයේ තබා තිබුණු සේප්පුව කරා ගියහ.



Scanned by CamScanner

sinhalaebooks.com

යතුර, යතුරු සිදුරට මනා සේ ගැළපුණි. දොස්තර මහතා යතුරු සිදුරට යතුර දමා කරකවා බැලුවේය. පුදුමයකි! එහි අංක සඳහන් කර තිබූ දර්ශකය ඉබේම කරකැවී 55634155 අංකය වැටෙද්දී සේප්පුවේ දොර විවර විය. අඳුරු මීදුම් වලාවක් සේප්පුව තුළින් නිකුත් වී වාසුළියක් මෙන් පාවී ගියේය. තරුණ යුවළගේ හදවත් බියපත් වූ නමුත් ඔවුහු නොසැලී සිටියේ මෙය අලුත් අත්දැකීමක් නොවූ බැවිනි.

"මේක ද මේ රහස?"

ලින්ඩා සේප්පුවේ ඇතුළත තිබූ රතු පාට රිබන් පටියකින් බඳින ලද රෝස පාට වූ විශාල ලිපිගොනුවක් ඇතුළත් ෆයිල් කවරය අතට ගත්තාය.

"මේ තියෙන්නේ ගිණුම් සටහන්. මෙන්න බිල්පත්. ඔහෝ.......... අතින් ලියපු වාර්තාවක්."

"රමේෂ්, ඒ තාත්තිගෙ අකුරු."

"අපි මේක විවේක ඇතුව කියවලා බලමු. මොනවා හරි වැදගත් දෙයක් මේකෙ තියෙන්න ඕන."

"තාත්තිගෙ භූතාත්මෙ මේ සේප්පුවේම තමයි ඉඳලා තියෙන්නේ."

"ඔව් ලින්ඩා. එයාගෙ ජීවිතය වගේම මේ ෆයිල් එකත් වටිනවා කියන එකයි ඒකෙන් කියන්නේ."

සේප්පුවෙන් හමු වූ ලිපිගොනුවේ වූයේ වත්තේ ගනුදෙනු ඇතුළත් ගිණුම් වාර්තාය. ඒ තුළ ඉන්වොයිස් ඇතුළු බිල්පත් රාශියක් ද විය. එහි වූ වැදගත්ම ලිපිය වූයේ විල්සන් මහතාගේ අත් අකුරින්ම ලියන ලද විශේෂ වාර්තාවකි. එහි සඳහන් වූයේ වත්තේ අලාභයට සම්බන්ධ සියලුම බිල්පත් හා ගිණුම් විස්තරය. ඒ සියලුම ගනුදෙනු ඔහුගේ අනුදැනුමකින් තොරව එවකට සහකාර වතු පාලකයාව සිටි, දැනට වතු පාලකයා වන ඩර්වින් මහතා විසින් කරන ලද ඒවා විය. අස්ථානගත වී තිබුණු අදාළ තොරතුරු විශ්වාස කටයුතු මාර්ගයකින් තමා වෙත ලැබුණු



Scanned by CamScanner

sinhalaebooks.com

බවත්, ඒ අනුව සියලුම ගනුදෙනුවල වගකීම ඩර්වින් විසින් භාර ගත යුතු බවත් එහි සාක්ෂි සහිතව සටහන් කර තිබුණි. මෙම වාර්තාව ඊට පසු දින පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා පිළියෙල කරන ලද්දක් බවත් පැහැදිලිවම පෙනෙන්නට තිබුණි.

"ලින්ඩා, දැන් අපි මේ ෆයිල් එකට මොක ද කරන්නේ?"

සියලුම තොරතුරු සටහන් කියවා බැලූ රමේෂ් ලින්ඩාගෙන් ඇසුවේය.

"රමේෂ්, මොනවා නොකළත් මගෙ තාත්තිගෙ නිර්දෝෂීකම ඔප්පු වුණු එකම මගේ හිතට ලොකු සැනසුමක්."

"ඒත් ලින්ඩා, මේක අපි විතරක් දැනගෙන බැහැ. කව්රුත් දැනගන්න ඕනෑ, විල්සන් මහත්තයගෙ අත වරදක් නැහැ කියලා. අනිත් අතට මේකෙන් හෙළි වෙනවා, තාත්තගෙ මරණය පිටුපස මේකෙ හෙවණැල්ලක් තියෙන බව. අපි ඒකත් හොයා ගන්න ඕනෑ. තාත්තා දඬුවම් දෙන්න කලින් මේ අයව නීතිය හමුවට ගෙනියන්න පිළිවෙළක් හොයා ගන්නත් ඕනෑ."

"ඒ වුණත් රමේෂ්, මෙච්චර කල් ගත වෙලා අපි කොහොම ද ඒක ඔප්පු කරන්නේ?"

"ඒකත් ප්‍රශ්නයක් තමයි. ඒ දවස්වල කිසිම සැකයක් තිබිලා නැහැනේ. ඇරත් දැන් කිසිම සාක්ෂියකුත් නැහැ. ඒක නිසා නීති මාර්ගයෙන් කටයුතු කරන්න බැහැ. හැබැයි වංචා සිද්ධියේ නියම වරදකාරයන් කවුරුන් ද කියලා ලේසියෙන් ඔප්පු කරන්න මේ ෆයිල් එකේ තියෙන විස්තර සෑහෙනවා. අපි ඉස්සෙල්ලාම නීතිඥයෙක් මාර්ගයෙන් මේ තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට දන්වමු."

"ඔව්, එහෙම කරමු. හැබැයි මේක කාටවත් දැනගන්න අරින්න නරකයි."

"ඔව්, ඔව්. මෙහෙම ෆයිල් එකක් අපිට ලැබුණු බව දැනගත්තොත් ඩර්වින්ලා කලබල වෙනවා. ආයි සැකයක් නෑ."



Scanned by CamScanner

sinhalaebooks.com

"නියම වංචාකාරයා කවුරු ද කියලා දැනගත්ත දවසට වත්තේ අයට පුදුම හිතෙයි. අම්මිටත් ගොඩක් සතුට දැනෙයි නේද රමේෂ්?"

"එහෙම වෙන්න එපායෑ. ඕගොල්ලන්ට සාධාරණය ඉටු වෙනවා නිසැකයි."

"තාත්ති මැරිලත් අපට කොච්චර ආදරෙයි ද බලන්න රමේෂ්."



Scanned by CamScanner

sinhalaebooks.com

# 13

මේ අතර සිල්වියා මැතිනියගේ ස්වභාවයේ වෙනසක් දක්නට ලැබුණි. මෙතෙක් නොතිබුණු සොම්නස් සහගත බවක් ඇයගේ මුහුණෙන් පළ විය. ලින්ඩා හා රමේෂ් යුවළගේ දර්ශනය ද ඇයට රසඳුනක් විය. එක් දිනක් රමේෂ් ලින්ඩාට තම අදහස කෙළින්ම ප්‍රකාශ කළේය.

"ලින්ඩා, මම හැමදාම මෙහේ යන එන එක ඔයාලට හොඳ මදි. දැනටමත් මිනිස්සු අමුතු විදියට අපේ දිහා බලන්නේ. මම කැමතියි ඔයාව බඳින්න. ඔයාගෙ කැමැත්ත දැනගන්න මම කැමතියි."

ලින්ඩා විළිබර විය. මේ ප්‍රශ්නය කෙදිනක හෝ රමේෂ්ගේ මුවින් පිට වේ යයි ඇය අපේක්ෂාවෙන් සිටියා...

"මම අකමැති වෙයි කියලා ඔයා හිතනව ද?"

"නෑ. එහෙම එකකට නෙවෙයි. ඒත් ඉතින්......"

"ඒ කිව්වේ, මාව බඳින්න බලා ගෙන වෙන කවුරු හරි ඇති කියල ද? මේ....... මස්සිනා කෙනෙක්වත්."

"කියන්න බැහැනේ."

"එහෙම කෙනෙක් නෑ රමේෂ්. හැමදේටම ඔයා විතරයි මට ඉන්නේ. ඔයා කැමති ඕනම වෙලාවක මං ලෑස්තියි."

ලින්ඩා රමේෂ්ගේ දෙඅත අල්ලා ගත්තාය.

"අපි අම්මිටත් මේ ගැන කියමු රමේෂ්. එයා සතුටු වෙයි."

"ඇයි ඔයාගේ තාත්තා, එයාත් කැමති වෙයි."

"සත්තකින්ම රමේෂ්. එයා අපිට ආශිර්වාද කරයි." සීතල මීදුම් වලාවක් ඔවුන් දෙදෙනා වසා ගත්තේය. එහි නැවුම් මල් සුවඳක් ද විය.



Scanned by CamScanner

sinhalaebooks.com



ලින්ඩා - රමේෂ් දෙදෙනා සිල්වියා හමුවට ගියහ. මුලින්ම කතා කළේ ලින්ඩාය.

"අම්මි, ඔයාට කියන්න දෙයක් තියෙනවා. මේක ඇහුවම ඔයා ගොඩක් සතුටු වෙයි."

ඇයගේ වදන් හොඳින් සවනට යොමු කළ සිල්වියා මැතිනිය මඳහස පළ කරන මුවින් ඒ දෙදෙනා දෙස බැලුවාය.

ඇය ඉතා චුවමනාවෙන් සවන් දී සිටියේ තම දූවණියගේ මුවින් පිට වනුයේ කෙබඳු දෙයක් දැයි අසනු රිසියෙනි.

"අම්මි, මේ රමේෂ් කැමතියි මාව කසාද බඳින්න. මමත් ඒකට කැමතියි. එයා කැමතියි මේ ගැන අම්මිගෙ අදහස දැනගන්න."

සිල්වියා මැතිනියගේ මුහුණෙහි කලාතුරකින් දක්නට ලැබෙන ප්‍රසන්න පෙනුමක් ඇති විය. ඇයගේ දෙනෙත් දීප්තිමත්ව බබළන්නට විය. ඇය තම දෑත් ඔසවා දෙදෙනාගේ අත් වෙත වෙතම අල්ලා ගත්තාය. ලින්ඩාගේ හා රමේෂ් දොස්තර මහතාගේ දකුණත් දෙක එකට යා වෙන සේ තබා ඒ මත සිය මුහුණ ළං කොට සිප ගත්තාය.



Scanned by CamScanner

sinhalaebooks.com

"තුඹලාට දෙවි පිහිටයි!" යන වදන් ඇගේ මුවින් පිට වූයේ දෙදෙනාම විස්මයට පත් කරමිනි.

"මොනවා......! අම්මි කතා කළා. ඔයාට ඇහුණ ද රමේෂ්? ඔයාට ඇහුණ ද?"

"ඔව් ලින්ඩා, මට ඇහුණා. එයා කිව්වා 'තුඹලාට දෙවි පිහිටයි' කියලා."

"ආයිමත් කතා කරන්න අම්මී. ආයිමත් වතාවක් කතා කරන්න." ලින්ඩා කොතරම් ආයාචනා කළත් සිල්වියා මැතිනිය එක වචනයකුදු කතා නොකළාය.

"ලින්ඩා, අපේ විවාහය ගැන ඇහුවාම අම්මගෙ හිතේ ප්‍රබල කම්පනයක් ඇති වෙන්න ඇති. ඒකයි ඒ විදියට වචන කීපයක් පිටවෙන්න ඇත්තේ." දොස්තර මහතා පැවසුවේය.

☆ ☆ ☆ ☆ ☆ ☆ ☆

එවරඩ් පෙරේරා නීතිඥ මහතා විසින් රමේෂ් හා ලින්ඩා විසින් බාර දෙන ලද ගිණුම් තොරතුරු ඇතුළත් ලිපිගොනුවට අදාළ තොරතුරු ග්‍රේලෑන්ඩ් වතු යායේ මව් සමාගම වෙත ඉදිරිපත් කිරීමේ වගකීම බාර ගන්නා ලදී. ලිපිගොනුවේ මුල් පිටපත් සුරක්ෂිත ලෙස තබා ගන්නා ලෙසට අවවාද කළ නීතිඥ මහතා, එහි ඡායා පිටපත් පමණක් තම භාරයට ගත්තේය.

සතියකට පසුව ඩර්වින් මහතාට ලැබුණු ලිපියකට අනුව දන්වා තිබුණේ, වැවිලි සමාගම විසින් පසුගිය කාලයේ සිදු වූ මූල්‍ය වංචාව පිළිබඳව පරීක්ෂණ නැවත විභාග කිරීමට කටයුතු කර ඇති බවයි. මේ සඳහා විගණන පරීක්ෂක සමාගමේ පරීක්ෂකයන් පිරිසක් ග්‍රේලෑන්ඩ් වතු යායට පැමිණෙන බවට ද දැනුම් දී තිබුණි.

වතු පාලක ඩර්වින් මහතා මේ දැනුම් දීමෙන් බොහෝ කලබලයට පත් වූවේය. ඔහු වහාම වික්ටර් සොයා ගියේ තමාගේ රහස් කුමන්ත්‍රණ සියල්ලටම වික්ටර්ගේ උදව් ලැබුණු නිසාය.

"හරිම ප්‍රශ්නයක් තමයි, මට ලියුම එනකම්ම හිතා



Scanned by CamScanner

sinhalaebooks.com

ගන්නවත් බැරි වුණා. මුන්ට ආයිමත් මේක අදින්න ඕන වුණේ ඇයි කියන එකයි මට තියෙන ප්‍රශ්නෙ."

ඩර්වින් තම මිතුරාට ලිපිය පෙන්වූයේය.

"අපි ඔය කේස් එකේ තොරතුරු ඔක්කොම පුච්චලා දැම්මානේ සර්. අර බිල්, වවුචර්, ඉන්වොයිස් ඔක්කොම."

"ඒ වුණාට අපි ළඟ තිබුණෙ ඒවායේ මුල් පිටපත් නෙවෙයිනෙ වික්ටර්. අපි ගනුදෙනු කරපු තැන්වල ඒවායේ මුල් පිටපත් තිබුණා වෙන්න පුළුවනි. කවුරු හරි මේ තොරතුරු හොයා ගෙන කම්පැනියට දන්නලා තියෙනවා වෙන්න පුළුවනි."

"මේවා හොයන්න කාට ද වුවමනාව තියෙන්නේ? කවුරු හරි හොයනවා නම් ඒ විල්සන්කාරයාගේ පැත්තෙන් වෙන්න ඕනෑ. අර ගෑනිටයි කෙල්ලටයි එහෙම කරන්න ඕනෙ නෑ. පුළුවන්කමකුත් නෑ."

"ඒ වුණත් වික්ටර්, ඒගොල්ලන්ගේ නෑදැයෝ මේ ගැන හෙව්වා වෙන්න පුළුවන්."

"මේ........ මට නම් ඔක්කෝටම වැඩිය සැක අර දොස්තර ගැන. මිනිහා දැන් බංගලාවෙමයි ඉන්නේ."

"ඇත්තම තේන්නම්. මට මිනිහා ගැන අමතක වුණා. සමහර විට එයා මේකෙ කොහේ හරි ගෑවිලා ඇති. හොඳයි බලමුකෝ, පරීක්ෂණ පටන් ගත්තහම අපට දැනගන්නැහැකි කවු ද මේක ඇද්දේ කියලා. ඊට පස්සේ හෙමිහිට උන් ගැනත් බලා ගමු."

"ඔව් සර්. නැත්නම් සර්ගෙ බෙල්ලයි කැපිලා යන්නේ."

"බලමු, මේ ඩර්වින්ගේ බෙල්ල එහෙම කැපිලා යන්නෙ නෑ."

ඩර්වින් තම වීදුරුවේ තිබුණු වයින් එකපාරටම උගුරට හලා ගත්තේය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 14

විවාහය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කොට තෙමසකින් ලින්ඩා හා රමේෂ් යුවළගේ විවාහ මංගල්‍යය සිදු විය. මෙය ඉතා චාම් උත්සවයක් විය. දෙපාර්ශ්වයේ නෑදෑ හිතවතුන් කීප දෙනකුගේ සහභාගිත්වයෙන් පැවති උත්සවය අවසානයේ දී නව යුවළ මධුසමය ගත කිරීම සඳහා නුවරඑළිය බලා පිටත් වූහ.

සිල්වියා මැතිනිය වෙනදාට වඩා සතුටින් කාලය ගත කරන්නට විය. දින කීපයකට පසු, ලින්ඩා රමේෂ් යුවළ ආපසු බංගලාවේ පදිංචියට පැමිණියෝය.

දින, සති, මාස ගත විය. මේ අතර වතු සමාගමේ ගණකාධිකාරී නිලධාරියෙක් ඇතුළු පිරිසක් ගිණුම් පරීක්ෂණ සඳහා පැමිණියෝය. ඔවුන් ඉදිරිපත් කළ තොරතුරු අනුව, මීට දසකයකට පමණ පෙර ග්‍රේලෑන්ඩ් වතු යායේ සිදු වූ මූල්‍ය වංචාව පිළිබඳව සිද්ධියට අලුත් අර්ථකථනයක් ලැබුණි. රුපියල් ලක්ෂ ගණනාවකට අදාළ තොරතුරු වැරදි ලෙස ගිණුම් ගත කොට ඇති බවත්, වර්තමාන පාලක ඩර්වින් මහතා මේ සම්බන්ධව වගකිව යුතු බවත් පරීක්ෂණයට අනුව හෙළි වුණි.

"මෙය අධිකරණයට යා යුතු ප්‍රශ්නයක්. ඔබතුමන්ලා විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු නිවැරදි බවට මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුයි. මේවා ව්‍යාජ පිටපත් බව අපේ විශ්වාසයයි."

ඩර්වින් මහතා වෙනුවෙන් පරීක්ෂණයට සහභාගි වූ නීතිඥයා කරුණු ගෙනහැර පෑවේය.

"අපි, මුල් පිටපත් සියල්ල ඉදිරිපත් කරනවා. ඒවා අප සතුව තිබෙනවා." වතු සමාගමේ නිලධාරියා පැවසුවේය.

"හොඳයි, එහෙනම් ඒවා උසාවියට ඉදිරිපත් කරන්න. අපි මේ සම්බන්ධව නඩුවක් පවරනවා." ඩර්වින් මහතා පැවසුවේය.



Scanned by CamScanner

sinhalaebooks.com

ඔහු කිවූ ලෙසම මීළඟ සතියේ දී අධිකරණය ඉදිරියේ නඩුවක් පැවරිණි. චංචා චෝදනාවට තමන් නිර්දෝෂී බවට ඩර්වින් මහතාගේ පාර්ශ්වය විසින් වතු සමාගමට විරුද්ධව නඩුව පවරා තිබුණි.


"අපි නඩු දිනයට ෆයිල් එක ඉදිරිපත් කරනවා" යනුවෙන් රමේෂ් හා ලින්ඩා විසින් සමාගමේ නීතිඥයා වෙත දන්වන ලදී.

පරීක්ෂණය හමාර වූ දින රාත්‍රියේ ඩර්වින් හා වික්ටර් අතර විශේෂ රහසිගත හමුවකි.

"හිතුවෙවත් නැති දෙයක් වුණේ. අපි කල්පනාවෙන් වැඩ කළේ නැත්නම් මට හිරේ යන්න වෙන්නේ, වික්ටර්."

"ඔව් සර්, ඒක හැබෑව. අපි කොහොම හරි ෆයිල් එක අපේ අතට ගන්න ඕනෑ. මට හිතා ගන්න බැරි, මේක මෙච්චර දවස් කොහේ ද තිබුණේ කියන එක."

"ඕක අරුන්ගේ බංගලාවෙ තියෙන්න ඇත්තේ. විල්සන්කාරයා මේ ෆයිල් එක අපිට නොදැනෙන්න හැංගුවා. අපි විනාශ කළේ නියම ලියකියවිලි ටික නෙවෙයි, වික්ටර්."





Scanned by CamScanner

sinhalaebooks.com

"ඒත් සර්, මෙසෙ උඩ තිබුණු ඔක්කෝම ෆයිල් ටික පිච්චුවානේ."

"නෑ. මිනිහාට සැකයක් තියෙන්න ඇති, කොයි වෙලාවේ හරි අපි ෆයිල් එක ගන්න එන බව. ඒක නිසා ඌ ඒක හැංගුවා. අනුමානයක් නෑ වික්ටර්, මතක ද අර ඔෆිස් එකේ තිබුණු පරණ සේප්පුව? අන්න ඒකෙ තමයි ඕක තියෙන්න ඇත්තේ."

"එදා කලබලේට අපිට ඒක ඇරලා බලන්න බැරි වුණා."

"අරින්නෙ කොහොම ද මිනිහෝ, ඒකෙ යතුර තිබුණෙ නැති කොට. ඇරත් අපි විල්සන්කාරයාව මරන්න ඇඟලුවට මේ උලව් ෆයිල් කෙහෙල්මලක් ගැන හිතුව ද?"

"අපි හිතුවෙ සර්, විල්සන්කාරයා පරලොව ඇරියම ඔක්කොම ඉවරයි කියලනේ. මූ මැරිලත් අපෙන් පළිගත්තා එහෙනම්."

"තාම පළිගත්තෙ නෑ වික්ටර්. ඌ පටන් ගත්තා විතරයි. අපි පරිස්සම් නුණොත් ඔක්කොම සූං. අවතාරවලින් බේරෙන්න කලින් නීතියෙන් බේරෙන්න ඕනෑ. අපි මේ ෆයිල් එක කොහොම හරි අරගන්න ඕනෑ. ඒක දැන් තියෙන්නේ අරුන්ගෙ බංගලාවේ. මරලා හරි ගන්න ඕනෑ."

"විල්සන්කාරයාගේ දුවත් ගාණට වැඩියි. අපි කෙළින්ම මේකට අත නොදා කාට හරි බාර දෙමු සර්."

"වික්ටර් දන්න කවුරු හරි ඉන්නව ද?"

"බලමු, මං දන්න කීප දෙනෙක් ඉන්නවා. උන්ට බාර දුන්නොත් ආයි කිරි ගහට ඇන්න වගේ තමයි."

☆ ☆ ☆ ☆ ☆ ☆ ☆

දොස්තර මහතා සුපුරුදු ලෙස තම පෞද්ගලික බෙහෙත් ශාලාවේ රාත්‍රී හත වන තුරු ප්‍රතිකාර කළේය. ඔහු හත හමාර වන විට මෝටර් රථයට නැඟී බංගලාව වෙත එන්නට පිටත් වූණි.

වැසි කාලය ආරම්භව තිබූ බැවින් සවස් කාලයේ දී වර්ෂාව



Scanned by CamScanner

sinhalaebooks.com

පැවතීම නිසා මීදුම ද අධිකය. මීදුම මැදින් රථය පැදවීම ඉතා ප්‍රවේසමෙන් කළ යුතු විය. තමා එන තුරු ලින්ඩා ආලින්දයට වී බලා සිටින අයුරු රමේෂ්ට මැවී පෙනිණි. පාර දිගේ බොර පැහැති ජල ධාරාවෝ ගලා බසිති. තැනින් තැන කුඩා දියඇලි සෑදී සුදු පෙණ කැටි නගමින් ගලා හැළෙයි. හදිසියේම රථය නැවැත්වීමට සිදු විණි. විශාල ගල් කැට කීපයක් පාරේ මැද පාර ඇසිරෙන සේ වැටී ඇත.

රමේෂ් රථය නවතා වාහනයෙන් බැස්සේය. ඔහු වැස්සට තෙමෙමින්ම ගල් ඉවත් කිරීමට පහත් වූවා පමණි. එක්වරම තම හිසට වැදුණු පහර නිසා බිම ඇද වැටුණි. තමා අත් කීපයකින් ඉහළට එසවෙනු ඔහුට යාන්තමින් දැනුණි.

ලින්ඩා තම ස්වාමියා මේ තරම් ප්‍රමාද වීම ගැන කනස්සලු විය. ඈ පැයක් වැඩිපුර කල් ගත කරමින් බලා සිටියාය. එහෙත් ඔහුගේ පැමිණීමක් නැත.

"ගම්මුදලි සීයා, දැන් බලා හිටියා ඇති. අපි ගිහිල්ලා බලමු මහත්තයා ඇයි ප්‍රමාද කියලා."

"පුංචි බේබි කෝල් කරලා බැලුව ද? අද ලෙඩ්ඩු වැඩි ද දන්නෙ නෑනේ."

"මං කතා කරලා බැලුවා. ෆෝන් එක ගන්නෙ නෑ. ඒ කියන්නේ එයා එතනින් ඇවිල්ලා කියන එක."

"එහෙනම් බේබි ඉන්න, මං ගිහිල්ලා බලන්නම්."

"සීයා පයින් යන්න එපායැ. අපි දෙන්නම කාරෙකෙන් යමු."

ලින්ඩා රථය පණ ගැන්වීමට සූදානම් වූවා පමණි. විදුලි පන්දම් එළියක් සහිතව දුවගෙන එන දෙදෙනකුගේ සේයාවක් පෙනිණි.

"කව්(...) හරි දුවගෙන එනවා. බලමු, මොකක් හරි පණිවිඩයක් (...)න්න පුළුවන්."

මෙසේ පැවසූ ලින්ඩා රථයෙන් බැස්සාය.



Scanned by CamScanner

sinhalaebooks.com

"පුංචි බේබි...... පුංචි බේබි, හරි වැඩේ.......හරි වැඩේනේ."

ඔවුහු හති දමමින් පැවසූහ.

"මොකක් ද වෙලා තියෙන්නේ?"

"දොස්තර මහත්තයගෙ කාරෙක පාරෙ තියෙනවා. ඒත් මහත්තයා නෑ."

"මොනවා! මොනව හරි අකරතැබ්බයක් වෙලා තියෙනවා. අපි ඉක්මනට යමු සීයා. ඔය දෙන්නත් නගින්න."

ලින්ඩා පිරිස ද නංවා ගෙන රථය පැදෙව්වාය. පාර මැදම දොස්තර මහතාගේ මෝටර් රථය නවතා තිබුණි. ඉදිරියෙන් පාරේ වූ ගල් කිපයත්, ඇරුණු ඉදිරිපස දොර සහිත මෝටර් රථයත් දුටු ලින්ඩාට ක්ෂණිකවම සිදු වී ඇති දෙය වැටහී ගියාය.

"කව්රු හරි දොස්තර මහත්තයව බලෙන් අරගෙන ගිහිල්ලා තියෙනවා. මේ ගල් පාර මැද ආලා තියෙන්නෙ වාහනේ නතර කරවන්න." ලින්ඩා පැවසූ දේ පිරිස අනුමත කළහ.

"පුංචි බේබි, අපි දැන්ම පොලීසියට යන්න ඕන."

"ඔව් ගම්මුදලි සීයා. අපි දැන්ම පොලීසියට ගිහිල්ලා කියමු."

ගම්මුදලිත්, ලින්ඩාත් පොලීසියට ගොස් රමේෂ්ගේ අතුරුදහන් වීම ගැන පැමිණිලි කළහ. රාත්‍රියේම පොලිස් නිලධාරීහු සිද්ධිය සිදු වූ ස්ථානයට පැමිණ පරීක්ෂණ කටයුතු ආරම්භ කළහ.

"පැහැරගෙන යාමක් කියලා හිතන්න පුළුවන්. ලින්ඩා මහත්මියට සැක කරන්න පුළුවන් කව්රු හරි ඉන්නව ද?" පොලිස් නිලධාරියා ලින්ඩාගෙන් ඇසුවේය.

"විශේෂයෙන් සැක කරන්න පුළුවන් කෙනෙක් ගැන කියන්න නම් බැහැ ඉන්ස්පෙක්ටර්. ඒත්, පහුගිය කාලේ වත්තෙ පරීක්ෂණ වගයක් තිබුණා. ඒවට අපි කෙළින්ම මැදිහත් වුණා. සමහරවිට...."



Scanned by CamScanner

sinhalaebooks.com

"මොන වගේ පරීක්ෂණයක් ද මිස්?"

"මීට අවුරුදු ගණනාවකට කලින් වත්තේ මුදල් වංචාවක් වුණා. ඒ නිසාම අපේ තාත්ති එල්ලිලා මැරුණා. ඒ වංචාවට සැක කළේ තාත්තිව. ඒත්, මෑත කාලෙ දී වත්තෙන් අතුරුදහන් වෙච්ච ෆයිල් වගයක් අපට හම්බ වුණා. ඒවායේ තොරතුරුවලට අනුව වංචාවට අපේ තාත්තිව සම්බන්ධ නැති බව ඔප්පු වුණා."

"එතකොට කව් ද ඒකට සම්බන්ධ අය?"

"ඒ කාලේ සහකාර වතු පාලකයා වෙලා හිටපු; දැන් වත්තේ පාලකයා විදිහට වැඩ කරන ඩර්වින් මහත්තයා තමයි මේකට වගකියන්න ඕනෑ. ඒත් එයා ඒක පිළිගත්තේ නෑ. බෝඩ් එක ගත්ත තීරණයට විරුද්ධව නඩුවක් ෆයිල් කළා උසාවියේ."

"නඩුව නාම ඇහුණෙ නැහැ?"

"නෑ ඉන්ස්පෙක්ටර්, තව සතියක් තියෙනවා නඩු දිනේට. එදාට තමයි අපි අර ෆයිල් එකේ තියෙන ලියුම්වල මුල් පිටපත් ඉදිරිපත් කරන්න සූදානමින් හිටියේ. ඒත්......"

"එතකොට, දැන් ඔය කියන ෆයිල් එක තියෙන්නෙ ඕගොල්ලෝ ළඟ ද?"

"ඔව් ඉන්ස්පෙක්ටර්."

පොලිස් පරීක්ෂකතුමා මඳක් වෙලා කල්පනා කළේය. ඔහු යම්කිසි නිගමනයකට එළඹුණා සේ පෙනිණි.

"මට හිතෙනවා මේ පැහැරගෙන යාමට ඔය කියන සිද්ධිය සම්බන්ධ වෙලා ඇති කියලා. ඒත් අපිට කෙළින්ම කෙනකුව අත්අඩංගුවට ගන්න බැහැ. සැක කරන එක වෙනම දෙයක්. අපි බලමු. මොනවා හරි ආරංචියක් ලැබුණොත් වහාම මට දන්වන්න." මෙසේ පැවසූ පොලිස් පරීක්ෂකවරයා ආපසු ගියේය.

පසු දින ද ගත වී ගියේය. දොස්තර මහතා පිළිබඳව කිසිදු ආරංචියක් නැත. වත්තේ මේ ආරංචිය පැතිරී යත්ම නිලධාරීහු ද කම්කරුවෝ ද කැලඹුණහ. රමේෂ්ගේ හිතවත්තු



Scanned by CamScanner

sinhalaebooks.com

බංගලාවට පැමිණ ලින්ඩා අස්වැසුහ. එහෙත් ලින්ඩාගේ සිත තුළ වූ කම්පාව යටපත් කිරීමට ඔවුන් සමත් වූයේ නැත.

සිල්වියා මැතිනියට ද ස්වකීය නිවසේ පැවති මෙම [illegible] වැටහී ගියාය. ඇය ද විමසිල්ලෙන් පසු වූවාය. ලින්ඩා [illegible]න් පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිය දෑස් ඇය වෙත [illegible]මු කළාය.

"ඇයි මොක ද වුණේ?" ඇය සෙමින් ඇසුවාය. ඉ[illegible]ගිට මෙසේ වචන කිපයක් මිමිණීම කලක සිට ඇය කළේ කිසියම් කම්පනයකට [illegible]සුව පමණි.

"අම්මි, රමෙෂ්ව කව්දෝ අරගෙන ගිහිල්ලා. තාම ආරංචියක් නැහැ."

සිල්වියා දෑස පියා ගත්තාය. ලින්ඩා කාමරයෙන් පිටවූ වහාම අඳුරු මීදුම ජනේලයෙන් කාමරයට ඇතුළු විය. මීදුම ඡායාවක් බවට පත් වී ඇඳ අසලට සේන්දු විය. සිල්වියා දෑස් හැරියාය.

"එයා අරගෙන ගිහිල්ලා විල්සන්. එයා හොයා ගන්න ඕනෑ. යන්න, එයාව හොයා ගන්න." ඈ හෙමිහිට තොල් මතුළාය.

මීදුම් ඡායාව යළි සිහින් දුමාරයක් බවට පත් වී ජනේලයෙන් පිටව ගියේය.

රාත්‍රියේ ලින්ඩා නිදිවර්ජිතව ගත කළාය. ගම්මුදලි ද ඇග්නස් ද ඇය සමග පසු වූයේ කම්මුල්හි තබා ගත්තා අත් සහිතවය.

මඳ වේලාවකින් දුරකථනය නාද විය. ලින්ඩා රිසීවරය අතට ගත්තාය.

"හලෝ, ඔය දොස්තර මහත්තයාගෙ නෝනා ද?" ගොරහැඩි කටහඬකින් අමතනු ඇසිණි. ඇය කලබල වූවාය.

"ඔව්. කව් ද කතා කරන්නේ?"



Scanned by CamScanner

sinhalaebooks.com

"කව්රු වුණත් කමක් නෑ. ඔහේගෙ දොස්තර දැන් අපි ළඟ ඉන්නේ. බේර ගන්න ඕන නම් මම කියන විදියට වැඩ කරපන්."

"හරි, ඔහේලට මොනව ද ඕනෑ? ඇයි එයාව පැහැර ගෙන ගියේ?" ඇය ගැහෙන හදවතින් යුතුව විමසුවාය.

"නෝනා, අපි එයාව පැහැර ගෙන ගියේ අපි එක්ක වෙස් අදින්න නෙවෙයි තේරුණා ද? මුලින්ම මම කියන එක අහනවා. මේ විදියට වැඩේ නොකෙරුණොත් දොස්තරගේ මිනිය තමයි ඔහේට බාර ගන්න වෙන්නේ. තේරුණා ද?"

ලින්ඩා සසල වූවාය. එහෙත් ඒ බව නොපෙන්වීමට ඇය දිරිය ගත්තාය.

"හරි, ඉක්මනට කියනවා. මොනව ද මම කරන්න ඕනෑ?"

"හදිස්සි වෙන්ඩ එපා නෝනා. අපි රිලැක්ස් එකේ මේ ප්‍රශ්නෙ විසඳා ගනිමු. මේක බොහෝම කල් ගත වුණු ප්‍රශ්නයක්නෙ. හැබැයි මුලින්ම, පළමු වෙනි කොන්දේසිය; මේ කතාව ගැන පොලීසියට කියන්න බෑ. කිව්වොත් දන්නවනේ ඒ ගමන්ම දොස්තරගේ බෙල්ල කඳින් වෙන් වෙයි."

"ඉක්මනට කියපන් නරුමයෝ. මං කාටවත්ම කියන්නෙ නෑ. උඹට මොනව ද ඕනෑ? සල්ලි කීයක් ඕනෙ ද?"

"සල්ලි.......... හෙඃ හෙඃ හෙඃ........ සල්ලි මගේ බල්ලටවත් එපා. සල්ලි නෙවෙයි, අර ෆයිල් එකයි මට ඕනෑ. වත්තේ ගනුදෙනු තිබුණු ෆයිල් එක, ඔක්කොම විස්තර සහිතව ඔරිජිනල්ම එක. තේරුණා ද?"

"එතකොට ඔහේ වැඩ කරන්නේ ඩර්වින්ට ද?"

"නෝනා, මගේ සේවය ඕනෑම කෙනකුට මං සපයනවා. නෝනා වුණත් වැඩක් බාර දුන්නොත් මං කිරි ගහට ඇන්න වගේ කරනවා. කියන්න කාගෙ හරි බෙල්ල කපන්න ඕනෑ ද?"

"මට කාගෙවත් බෙලි කපන්න ඕන නෑ මිනිහෝ. මගෙ මහත්තයව බේරලා එවපල්ලා. ඔය උලව් ෆයිල් එක මං දෙන්නම්.



Scanned by CamScanner

sinhalaebooks.com

කියාපන් කොහේට ද ගේන්න ඕනෑ?"

"අන්න එහෙම එන්ඩ නෝනෙ. අද රෑ දහයට කෝවිලේ නුග ගහ යටට මම එනවා. ඊට කලින් ෆයිල් එක ගෙනැල්ලා පුල්ලෙයාර් පිළිමේ යට තියන්ඩ, තේරුණා ද? හැබැයි කාටවත් මේ ගැන කට හොල්ලන්ඩ බෑ."

කතා කළ අය රිසීවරය තබනු ඇසිණි. ලින්ඩා සුසුමක් හෙළුවාය.

"නෝනා මොක ද මේ වෙන්නේ?" ගම්මුදලි ඇසුවේය.

"මුකුත් නෑ සීයා. කාටවත්ම මේ ගැන කියන්න එපා. එහෙම වුණොත් මහත්තයට කරදරයක් වෙයි."



Scanned by CamScanner

sinhalaebooks.com

## 15

රාත්‍රිය ළඟා වන තුරු ලින්ඩා නොඉවසිල්ලෙන් පසු වුණි. දොස්තර මහතා ගැන අලුත් තොරතුරු පිළිබඳව පොලිසිය විමසුවත්, ඈ දුරකථන පණිවුඩය ගැන කිසිවක් නොකීවේ තම ස්වාමියාගේ ජීවිතයට හානියක් සිදු වේ යැයි සිතූ බැවිනි.

ඩර්වින් මහතා ද වික්ටර් ද තවත් බොහෝ නිලධාරීහු ද පැමිණ තොරතුරු ඇසුවෝය. ඩර්වින් මහතා ද දොස්තර සොයා දීමට හැකි සෑම දෙයක්ම කරන බව ප්‍රකාශ කළේය. ඔවුන්ගේ කතා බහේ ද සැකයක සේයාවකුදු නොවීය.

රාත්‍රී හත වන විට ලින්ඩා සේප්පුව හැර ෆයිල් එක අතට ගත්තාය. ඇයට මෙය පමණක් නොව, සිය ස්වාමියාගේ ජීවිතය වෙනුවෙන් කැප කළ නොහැකි වස්තුවක් නැත.



"ගම්මුදලි සීයා, අපි ගමනක් යමු ද?" ඇගේ ඉල්ලීමට
ුව ගම්මුදලි සීයා මෝටර් රථයට නැග්ගේය. ඔහු බංගලාවේ



Scanned by CamScanner

sinhalaebooks.com

තිබූ කාණු දෙකේ තුවක්කුව ද අතට ගත්තේය. අඳුර කපා ගෙන යන ලාම්පු එළිය දිගේ ලින්ඩා රථය පැදෙව්වේ යාන්ත්‍රික ගැහැනියක මෙන්ය. ඇයගේ සිතුවිලි සිර වී ඇත. තුග ගහ යට පුල්ලෙයාර් වෙනුවෙන් ඉදි කළ කුඩා කෝවිලකි. කුඩා කුටියක් වූ මෙහි ඉදිරිපස පොල් ගැසීමට තැබූ විශාල කළු ගලකි. එතැනම උල් තුනක් සහිත ආයුධයකි. ඇතැම් අය විසින් මෙහි රතු පාට රෙදි පටිවල එතූ පඬුරු බැඳ තිබුණි. මේ ගල මත කපුරු පත්තු කිරීම ද පහන් දැල්වීම ද කළ නිසා නිතරම කළු පැහැති තෙල්වලින් වැසී පැවතුණි.

ලින්ඩා කෝවිල අසල රථය නවතා ලිපි ලේඛන සහිත ෆයිල් කවරය ගම්මුදලි අතට දුන්නාය.

"සීයා, මේක අන්න අර පිළිමේ උස්සලා ඒක යට තියන්න."

"උන් එහෙම ද කිව්වේ?"

"ඔව්."

"මේකත් අරගෙන උන් මහත්තයාව නුදුන්නොත් මොක ද කරන්නේ?"

"මට ඒ ගැන කල්පනාවක් නැති වුණා සීයා. කමක් නැහැ, ඕක එතනින් තියන්න. උන් මේක ලැබුණම මහත්තයාව එවාවි."

"නෑ....... නෑ, මේක තමයි අපට තියෙන එකම තුරුම්පුව නෝනා. උන් ඕනෑම දෙයක් කරාවි මේක ගන්න. ඒක හින්දා මං කියන දේ කරන්න. මේවා තේරුම් ගන්න නෝනා පුංචි වැඩියි. අපට තවම වෙලා තියෙනවා."

"සීයා, මොකක් කරන්න ද මට කියන්නෙ?"

"අපි ගනුදෙනුවක් කරන්න ඕනෑ. නෝනා ෆයිල් එක දෙනවා මහත්තයා ළඟට ගන්නවා. මහත්තයා දුන්නොත් තමයි ෆයිල් එක එයාලට ලැබෙන්නෙ, ඒකයි කොන්දේසිය."

"ඒකට ඉතින් ආයිමත් සැරයක් උන් එක්ක කතා කරන්න ඕනෑනේ. අපි ළඟ ටෙලිෆෝන් අංකයක් නැහැනේ."



Scanned by CamScanner

sinhalaebooks.com

"අපි දැන් ආපහු යමු. අනිවාර්යයෙන්ම දහය වෙන කොට උන් කතා කරනවා. සමහරවිට ඊට කලින්."

"අනේ මන්දා."

ලින්ඩා ආපසු රිය පණ ගන්වා ගෙන බංගලාව බලා පැදෙව්වාය. ඈ දුරකථනය අසලම රැඳී සිටියේ කොයි මොහොතේ හෝ යළිත් නාඳුනන පුද්ගලයාගෙන් ඇමතුමක් ලැබෙන තුරුය. හරියටම නවය වන විට දුරකථනය නාද විය.

"හලෝ නෝනා, මං ඉස්සරලා කතා කරපු කෙනා මේ කතා කරන්නේ. නෝනලා මොක ද කෝවිල ළඟට ගිහිල්ලා ආපහු හැරිලා ආවේ? ප්‍රශ්නයක් ද?"

"ඔහේ ඒකත් බලාගෙන හිටිය ද?"

"මං වැඩ කරන්නෙ හුඟක් දුරට කල්පනා කරලා නෝනා. කොහොම ද අපේ වැඩේ කෙරෙන්නෙ නැද්ද?"

"ෆයිල් එක දෙනවා. හැබැයි ඒත් එක්කම දොස්තර මහත්තයා අපට බාර දෙන්න ඕනෑ."

"ඔහෝ......... ගොඩක් දුර දිග බලලා තියෙනවා එහෙනම්. හොඳයි, හරියටම කියපු වෙලාවට ෆයිල් එක ගේන්න. මහත්තයව එතැන්ට ගේනවා. එතෙන්ට එන කොට තනියම එන්න මතක තියා ගන්න ඕනෑ. තේරුණා ද?"

නාඳුනන පුද්ගලයා ඇමතුම අවසන් කළේය.

☆ ☆ ☆ ☆ ☆ ☆ ☆

රමේෂ්ට සිහිය එන විට ඔහු සිටියේ පාළු කාමරයක් තුළය. ඔහු ඇස් හැර බැලුවේය. කුඩා ගබඩා කාමරයක් ලෙස පෙනුණු එහි නොයෙකුත් සුන්බුන් ගොඩ ගසා තිබුණි. කැඩුණු ලී පෙට්ටි, දැල් ආවරණ, ලී රාක්කවලින් අවට පිරී තිබුණි. මේ නම් තේ වත්තේම ගබඩා කාමරයක් බව එහි තිබූ අබලි ද්‍රව්‍යවලින් රමේෂ්ට පැහැදිලි විය.

ඇඟට පණ නැති බවක් දැනුණත් ඔහු දෑත් බිමට ගසා



Scanned by CamScanner

sinhalaebooks.com

වාරු ගෙන ඉඳ ගත්තේය. සැර සුරුට්ටු දුමක් ආඝ්‍රාණය වෙමින් පැවතුණි. කුටියේ ඉහළ වූ දැල් ආවරණ සහිත කවුළුවෙන් වලාකුළු සහිත අහස පෙනිණි. මෙය සැන්දෑ වෙලාව වෙන්නට ඇතැයි ඔහු අනුමාන කළේය. එසැණින්ම සංගුව පිඹින හඬ ඇසිණි. අනුමානයක් නැතිවම මේ නම් තේ වත්තම යයි රමේෂ් සැක හැර දැනගත්තේය.

ඔහු නැගිටින්නට උත්සාහ ගත්තේය. හිස් මුදුනෙහි බලවත් වේදනාවක් දැනිණි. අත ගා බැලූ විට එහි ප්ලාස්ටරයක් අලවා ඇති බව අතට දැනිණි. පාර මැද තිබූ ගල් ගෙඩිය ඇහිළීමට පාත් වීමත් සමග හිසට බලවත් පහරක් වැදුණු බවත්, එවිටම ඇස් නිලංකාරව තමා ඇද වැටුණු බවත් ඔහුට සිහිපත් විය.

නැගිටීමට උත්සාහ ගනිද්දී අසල තිබූ රාක්කය සෙලවී, ඒ මත තිබූ හිස් බෙලෙක්කයක් හඬ නගමින් බිම පතිත විය. සැණෙකින් කළු පැහැති කමිසයක් හා නිල් පැහැති කොට කලිසමක් ඇඳ ගත්, කළු පැහැති වලසකුගේ සිරුරක් බඳු, දිගැටි මවිල් සහිත කෙටි බාහු යුවළක් හා කකුල් සහිත මිනිසෙක් සුන්බුන් අතරින් ඉදිරියට ආවේය. ඔහුගේ මුවෙහි ඇවිළෙන දිග සුරුට්ටුවක් විය.

"හ්ම්......... සිහිය ආවා එහෙනම්." ඔහු සෙමින් කීවේය.

"මේ........ මම මේ කොහේ ද ඉන්නේ? කවු ද මාව මෙහේට ගෙනාවේ? ඔහේ කවු ද?"

රමේෂ්ගේ ප්‍රශ්න වැලට පිළිතුරු දීමට මොහු ඉක්මන් නොවුණි. රාක්කයේ තබා තිබූ වතුර බෝතලය හා පත්තර කඩදාසියෙන් එතූ පාර්සලය අසල තිබූ පුටුව මත තැබූ මිනිසා,

"මේක කාලා වතුර බොනවා, ප්‍රශ්න අහන්න එපා." කියමින් තමාගේ ඉණේ ගසා සිටි දිග දිලිසෙන තලයක් සහිත පිහියක් අතට ගෙන එයින් ඔහුගේම බෙල්ල සූරන්නට පටන් ගත්තේය.

"ඇයි මාව මෙහෙට ගෙනාවේ කියපං?" රමේෂ් ශබ්ද නගා කතා කළේය.



Scanned by CamScanner

sinhalaebooks.com

“කෑ ගහන්ඩ එපා මහත්තයා, මේ අහලකවත් කව්රුත් නෑ. පැනලා යන්න හදන්න එපා. එහෙම වුණොත් කරදර වෙයි.” කියමින් කළු පැහැති මිනිසා ඉදිරියට ගොස් වාඩි විය.

තමා පැහැර ගෙන එන්නට ඇත්තේ ඩර්වින් විසින් බව රමේෂ්ට වැටහිණ. ලින්ඩා තමා සොයා ළත වෙනු ඇත. එය ඔහුගේ බලවත් සිත් තැවුලට හේතුවකි. මෙතනින් පැන යාමට උත්සාහ කිරීම ද අනතුරුදායකය. තමාගේ රැකවලෙහි යෙදෙන තැනැත්තා මිනීමරුවකුගේ පෙනුම ඇත්තෙකි.

ඔහු වතුර බෝතලය ගෙන බීගෙන බීගෙන ගියේය. කල්පනාවේ නිරත වෙමින්ම ඔහු බිම තිබූ ගෝණිය මත යළිත් දිගා වුණි. ක්‍රමයෙන් අවට පරිසරය අඳුරු වෙන බව රමේෂ්ට දැනිණි. මුරකාරයා ඉටිපන්දමක් දැල්වූ බව එහි ආලෝකයෙන් පෙනිණි.

නිඳිමතින් ඇස් පිය වී ගෙන එද්දී එළියේ කෙරෙන කතා බහක් ඇසුණු නමුත් කියන දේ කිසිවක් හරියාකාරව ඇසුණේ නැත. කතා බහ නැවතුණි. ඉටිපන්දමක් අතින් ගත් මුරකරු දොස්තර මහතා ළඟට පැමිණියේය.

“මහත්තයා නැගිටිනවා, මේ බත් එක කාලා තව ටිකකින් යමු.”

“කොහේ ද මාව ගෙනියන්නේ?”

“ඒවා මං දන්නෙ නෑ. මට කියපු දේ විතරයි මං දන්නේ.”

ඉටිපන්දම පුටු ඇන්දෙහි සවි කළ මිනිසා නැවත ඔහු සිටි තැනට ගොස් අලුත් සුරුට්ටුවේ දුම් වළලු ගුවන්ගත කිරීමට පටන් ගත්තේය.

නිරාහාරව සිටීමෙන් තමා තවත් දුර්වල වන බව සිතූ දොස්තර මහතා නිහඬවම බත් පාර්සලය අතට ගෙන කන්නට පටන් ගත්තේය. ඔහුට ලින්ඩා මතක් විය. ඇය තමා ගැන සිතමින් නිරාහාරව සිටිනු ඇත. එහෙත් ඇය සාමාන්‍ය ගැහැනුන් මෙන් හඬා වැලපෙමින් නොසිට තමා වෙනුවෙන් මේ වන



Scanned by CamScanner

sinhalaebooks.com

විටත් අවශ්‍ය කටයුතු කර ඇති බව ඔහුට විශ්වාසය.

වේලාව කීයදැයි කිව නොහැක. තමා අත තිබූ අත් ඔරලෝසුව ද නැත. එය මොවුන් තමා ගෙන එද්දී කොහේ හෝ වැටෙන්නට ඇත. මුරකරු පැමිණියේය.

"මහත්තයා, එනවා යන්න. ඊට කලින් මේ රෙදි කෑල්ලෙන් ඔහේගේ මූණ බඳින්න ඕනෑ."

කියමින් කළු පැහැති රෙදි පටියකින් රමේෂ්ගේ ඇස් බැන්දේය. උරහිසින් අල්ලා ගත් රමේෂ් ඉදිරියෙන් යද්දී මුරකරු පසුපසින් ගමන් කළේය. අතරමග නතර කර තිබූ මෝටර් රථයක දොර හැරෙනු රමේෂ්ට ඇසිණි.

"හරි ද?"

"හරි සර්." කියමින් මුරකරු රමේෂ් රථය තුළට නංවා වාඩි වීමට සලස්වා තමා ද ඔහු ළඟින් වාඩි වී දොර වසා ගනු ඇසිණි.

එතැන් සිට මෝටර් රථය වංගු සහිත පාරක ගමන් කරන බව රමේෂ්ට දැනිණි.



Scanned by CamScanner

sinhalaebooks.com

# 16

මේ අතර ලින්ඩා කෝවිලට නුදුරේ වංගුව ළඟ දී මෝටර් රථය නතර කළාය.

"සීයා, මං මේක අරගෙන යනවා. ඔයා කාරෙකට වෙලා ඉන්න."

"නෝනා බය නැතුව යන්න. මොනවා හරි කලබලයක් වුණොත් නෝනා බිමට පාත් වෙන්න. ඉතිරි හරිය මං බලා ගන්නම්."

ගම්මුදලි අමතර පතරොම් කීපය ද සාක්කුවේ ඇති බව සැක හැර දැනගත්තේය. මෝටර් රථයෙන් බිමට බට ලින්ඩා කෝවිල දෙසට අඳුරේම ගමන් ගත්තාය. ගම්මුදලි බිමට පහත් වෙමින් හොඳින්ම කෝවිල දර්ශනය වෙන ස්ථානයකට ගොස් තේ පඳුරකට මුවා වී තුවක්කුවේ ඉලක්කය ගත්තේ ඕනෑම අවස්ථාවකට මුහුණ දීමේ අධිෂ්ඨානය ඇතුවය.

කළු පැහැති රුවක් කෝවිල අබියස පෙනී ගියේය.

"හරි ද?" ඔහු ලින්ඩාට අත දිගු කළේය.

"කෝ මහත්තයා?"

"අර ඉන්නේ."

රමේෂ්ගේ දේහ ලක්ෂණවලට සමාන රුවක් අඳුරේම කෝවිලේ බිත්තියට හේත්තු වී සිටියේය. ඔහු නිසැකවම රමේෂ් බව ලින්ඩා හඳුනා ගත්තාය. ඈ මුහුණ ආවරණය කර ගෙන සිටි අය අතට ෆයිල් කවරය දුන්නාය. ඔහු එය ඇගෙන් ඩැහැ ගෙන හොඳින් පිරික්ෂා බලා අඳුරේ නවතා තිබූ මෝටර් රථයට නැග දොර වසා ගත්තේය.

ලින්ඩා රමේෂ් වෙතට පැන ඔහුගේ ඇස් වසා බැඳ තිබූ රෙදිකඩ ලිහා ඇමුවාය.



Scanned by CamScanner

sinhalaebooks.com

"රමේෂ්, ඔයා හොඳින් ද?" ඇය ඉකිබින්දාය.

"ඔව් ලින්ඩා. මට කරදරයක් නෑ. මොක ද වුණේ?"

"ගෙදර යමු රමේෂ්, ඔක්කොම විස්තර කියන්නම්."

ඈ දොස්තර මහතාගේ අත අල්ලා ගත්තාය. ගම්මුදලි තුවක්කුව මානා ගෙනම ඉදිරියට දුව ගෙන ආවේය.

"අපේ මහත්තයාට කරදරයක් නෑ නේද?"

"නෑ සීයෙ, මට කරදරයක් නෑ. ඒත් මං හිතුවේ උන් මාව මරා දාවි කියලා."

"එහෙම එකක් වුණා නම් මං එකෙක් දෙන්නෙක් මෙතනම බාවනවා. මහත්තයා මම කෝකටත් ලැස්ති වෙලයි ආවේ, අපේ පුංචි බේබි වෙනුවෙන් පණ දෙන්න වුණත්."

"බොහොම ස්තූතියි සීයා." ලින්ඩා පැවසුවාය.

මේ අතර අඳුරේ තිබූ වාහනය පිටත් වුණි.

"අන්න අරුන් යනවා." ගම්මුදලි තම තුවක්කුව ඒ දෙසට මැනුවේය.





Scanned by CamScanner

sinhalaebooks.com

"එපා, ඔහේ ගියාවේ. අපි මොනවට ද අපරාධ කරන්නේ."

දොස්තර මහතා ගම්මුදලි වැළකුවේය. අඳුරේම ගමන් ගත් රථය වංගුව ගනිද්දීම මහ හඬක් නගමින් පාර අයිනේ තිබූ ගල් කුළෙහි වැදී, ප්‍රපාතයට පෙරළී ගොස් අඩි සියයකටත් වඩා ගැඹුරු හෙළ පාමුලින් ගලා යන ඔය මැද තිබූ ගල් තලාව මත පතිත වී ගිනි ගුළියක් බවට පත් විය.

"මෙලොව දී ම කරුමේ පල දෙනවාය කියන්නේ ඔන්න ඕකට." ගම්මුදලි කිවේය.

"අපරාදේ, ෆයිල් එකත් පිච්චෙන්න ඇති. ඒක ගත්තේ අර වික්ටර් කියන එකා. මට හැඩරුවෙන්ම කියන්න පුළුවනි." ලින්ඩා සුසුමක් හෙළුවාය.

තිදෙන ආපසු බංගලාවට ගියෝය. සිල්වියා මැතිනිය නිසොල්මනේ ඇඳේ නිඳා ගෙන පසු විය. ඔවුන්ගේ මවිතයට හේතු වූයේ ලින්ඩාට වැසීමට අමතක වීමෙන් ඇරදා ගිය සේප්පුව තුළට ඔවුන්ට අහිමි වූ ලිපිගොනුව පැමිණ තිබීමය.

"මේක නම් අදහගන්න බැරි දෙයක්!" ඈ පැවසුවාය.

"පුදුම වෙන්න දෙයක් නෑ. ඒ ඔයාගෙ තාත්තාගෙ වැඩක්." දොස්තර මහතා පැවසුවේය.

පසු දින මේ සිද්ධිය නැරඹීමට ජනතාව ඇදී එන්නට පටන් ගත්හ. අඟුරු බවට පත්ව තිබූ මළ සිරුරු දෙකෙන් එකක් වික්ටර්ගේ බවට හඳුනා ගන්නා ලදී. වතුරෙහි ගෑවී තිබුණු ඔහුගේ එක් කකුලක් පිලිස්සී නොතිබුණු බැවින් ඔහු ඇඳ සිටි කලිසම් කොටසකුත්, සපත්තුවකුත් නොපිලිස්සී ඉතිරිව තිබුණි. අනෙක් සිරුර හඳුනා ගත නොහැකි විය. හදිසි අනතුරක් නිසා සිදු වූ මරණ ලෙස මේ සිද්ධිය පොලිස් පොතෙහි වාර්තා විය.

වික්ටර්ගේ මරණයෙන් පසුව ඩර්වින් මහතා අධික ලෙස බියට පත් වුණි. මරණය කොයි මොහොතේ හෝ තමා ලුහුබැඳ එන බව ඔහුට නිසැකය.

ඔහුට නින්ද නොආවේය. වික්ටර්ගේ මරණයේ කටයුතු



Scanned by CamScanner

sinhalaebooks.com

අවසන් වී තිවසට පැමිණි ඩර්වින්, තම කාමරයේ දොර තදින් වසා ගෙන ඒ තුළටම වී සිටියේය. විල්සන්ගේ අවතාරය මේ වත්තේ සෑම තැනම සැරිසරයි. මීදුම් වලාවක් බඳු එම අමනුෂ්‍යයා ජනෙල් කවුළුවක් තුළින් හෝ ඇතුළු වී සිය සීතල අත්වලින් තම ගෙල සිර කර මරා දමනු ඇතැයි ඩර්වින් කල්පනා කළේය.

එදා රථය අනතුරට ලක් වීමේ සිද්ධිය ඇතින් සිට නැරඹූ අය සත්‍යයෙන්ම සිදු වූ දේ නොදනිති. වික්ටර් ලින්ඩා අතින් ලිපිගොනුව ගෙන කාරයේ ඉදිරිපසට ගොඩ වී රථය පැදවීමට පටන් ගෙන පසුපස අසුනේ සිටි සිය සගයා දෙස හැරී බැලුවේ ඔහුගේ නිහඬ බව නිසාය. එවිට ඔහු දුටු දෙයින් ත්‍රස්ත වීම නිසා රථය පාලනය කරගත නොහැකි විය. සිය සගයාගේ අසලින් තවත් අමුත්තෙක් වාඩි වී සිටියේය. ඔහුගේ ඇස් ගිනි ගෙන දිලිසෙන්නාක් මෙන් රත් පැහැ ගැන්වී තිබුණි. ඔහු අන් කිසිවකු නොව, මිය ගිය විල්සන්ය.

පාලනයෙන් තොර රථය ගල් කුළෙහි වැදී ප්‍රපාතයට පෙරළී ගියේ ඊට පසුවය. ලිපිගොනුව සේප්පුව තුළට වැටුණු ආකාරය තවත් රහසකි.

රාත්‍රී වැඩ මුරය ඇරී ගෙදර යන රාජා සින්නමුත්තු ගල් පඩිපෙළ බැස එද්දී පහළින් පඩිපෙළ නැග වේගයෙන් එන කළු පැහැති දිග ලෝගුවක් වැනි ඇඳුමක් ඇඳ ගත්, හිස කළු ලේන්සුවකින් වසා ගත් අයකු තමාගේ ඇඟෙහි වැදෙමින්ම වේගයෙන් දුවගෙන යනු දුටුවේය. ඔහු තිගැස්සී ගියේය. මෙය අවතාරයක් හෝ හොල්මනක් වෙන්නට ඇතැයි ඔහු සිතුවේය. එහෙත් අවතාරයක් නම් තමාගේ ඇඟෙහි හැපෙන විට එය තමාට හොඳටම දැනීමට ඉඩක් තිබිය නොහැක. එමෙන්ම, එම අය ළඟින් විලවුන් සුවඳක් ද වහනය වූ බව ඔහුට මතකය. ලේන්සුවට යටින් කැරලි සහිත කෙස් කලඹක් ද තිබූ බවත්, මුහුණ මඳක් සුදුමැලි බවත්, එය පිරිමියකුට වඩා ගැහැනියකගේ මුහුණට සමාන බවත් ඔහුට ප්‍රත්‍යක්ෂය.



Scanned by CamScanner

sinhalaebooks.com

එහෙත් මේ බව ඔහු කිසිවකුට කීවේ නැත.

☆ ☆ ☆ ☆ ☆ ☆ ☆

දොස්තර රමේෂ් තමා තුළ ඇති වූ ව්‍යාකූලත්වය පහව යන තුරු දින දෙකක් පමණ බංගලාවේම ගත කළේය. ඔහු තමාගේ දින පොතෙහි මේ සටහන ලිවීමට අමතක කළේ නැත.

❖ මාර්තු 13 -

**මගේ පැහැර ගෙන යාමට ඩර්වින් කෙළින්ම සම්බන්ධ බව පැහැදිලිය. ඔහුගේ අරමුණ අධිකරණය හමුවට අප සතු ලිපිගොනුව ඉදිරිපත් කිරීම වැළැක්වීමය. වික්ටර්ගේ මරණයට ලින්ඩාගේ පියාගේ අවතාරය සම්බන්ධ වන බව මගේ හැඟීමයි. එමෙන්ම වික්ටර්ට බාර දුන් ලිපිගොනුව ආපසු සොප්පුවට ආවේ ද ඔහුගේ බලයෙනි. ඒ සඳහා සිල්වියා මැතිනියගේ සහාය ඔහු ලබා ගත් බව සැක සිතීමට හැක. ඔහුගේ නූත බලය ඇය කෙරෙහි ආවේෂ කොට ඒ තුළින් තමාගේ අරමුණු කරා යන බව මගේ අදහසයි. විල්සන් මහතාගේ පීළඟ බිල්ල ඩර්වින් බව සිතිය හැක. එහෙත් එය කවරදා කුමන අයුරින් සිදු වේ දැයි දැන්ම තීරණය කිරීමට නොහැක.**



Scanned by CamScanner

sinhalaebooks.com

# 17

නඩු දිනය දවසේ ඩාර්වින් අධිකරණයට ඉදිරිපත් නොවුණි. ඔහු අසනීපයෙන් පෙළෙන බවට වෛද්‍ය සහතිකයක් නීතිඥයා මාර්ගයෙන් උසාවියට ඉදිරිපත් විය. ලින්ඩා මහත්මිය විසින් තමා සතුව තිබූ ලිපිගොනුව අධිකරණයට ඉදිරිපත් කරන ලදී. නඩු විභාගය කල් තැබිණි.

මේ අතර නඩුවේ තීන්දුව ලැබෙන තුරු වැවිලි සමාගම විසින් ඩාර්වින් වත්තේ පාලක තනතුරින් තාවකාලිකව ඉවත් කර ඒ වෙනුවට වෙනත් අයකු පත් කරන ලදී. මේ සිද්ධියෙන් වඩාත් කම්පනයට පත් වූ ඩාර්වින් සිය බංගලාව තුළට වී හුදකලාවෙම පසු වූයේය.

සැන්දෑ වෙන විට මත්පැන් පානය පටන් ගත්තා ඩාර්වින්, මධ්‍යම රාත්‍රි වන තුරු එම කටයුත්තෙහිම යෙදුණි. තමන්ගේ අපරාධ පිළිබඳව ඔහුට සිහිපත් විය.

ස්ත්‍රීන්ට හා සුරාවට ලොල් වූ හෙතෙමේ ලැබෙන ලැබෙන ධනය නාස්ති කළේය. අන්තිමේ දී වතු යායේ ආදායම් ද වංචා කළේය. තමා අත තිබූ මුදල් ගනුදෙනුවලට අදාළ තොරතුරු වංචනිකව වෙනස් කොට මුදල් ලබා ගත්තේය. විල්සන් මහතා විසින් කීප වතාවක්ම අවවාද කළත් ඔහු ඒවා පිළිගත්තේ නැත. අවසානයේ දී ගිණුම් වාර්තා හා තොරතුරු සියල්ල ගිනි තබා විනාශ කළේය. මේ සඳහා වික්ටර්ගේ සහාය ද ලැබුණි.

සියලුම ගනුදෙනුවල වගකීම විල්සන් මහතා පිට පැටවුණේ අදාළ ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වූ නිසාවෙනි. එහෙත් පසුව අදාළ සමාගම්වල හිතවතුන්ගේ මාර්ගයෙන් එම විනාශ කළ ලියවිලිවල මුල් පිටපත් ලබා ගැනීමට ඔහු සමත් විය. ඩාර්වින් ක්‍රියාත්මක වූයේ මේ බව හෙළි වීමෙන් පසුවය. තමාගේ නිර්දෝෂීභාවය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී හෙළි කිරීමට ඔහු සූදානම් වනු දුටු ඩාර්වින්ගේ සිත නපුරු



Scanned by CamScanner

sinhalaebooks.com

චේතනාවලින් පිරුණි. වික්ටර් හා එක් වී මේ සම්බන්ධව ගත යුතු පියවර කුමක් දැයි සාකච්ඡා කෙරිණි.

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර දින රාත්‍රියේ විල්සන් මහතා මධ්‍යම රාත්‍රිය වන තුරු කාර්යාලයේ කිසියම් කටයුත්තක නිරත වී සිටියේ තමාගේ පසුපසින් හඹා එන අනතුරක් පිළිබඳව සංඥාවක් හෝ නොදැනය.

ඩර්වින්ට සිනමා පටයක් මෙන් සිය මනසේ සිදු වූ සිද්ධීන් පිළිබඳ මතකය ඇඳී ගියේය. ඇතැම් විට මේ දැන් එම බිහිසුණු සිදුවීම සජීවීව සිදු වන්නාක් මෙන් දැනී ඔහුගේ දුර්වල මනස භීතියකින් වෙළී ගියේය.

එදා තමාත්, වික්ටරුත්, වඩිවේලුත් හෙමින් සීරුවේ කළු පැහැති මුහුණු ආවරණ සහිතව කාර්යාලය වෙත පියවර තැබූ අයුරු ඔහුට සිහිපත් විය. වඩිවේල්ගේ අතේ තරමක් දිග නයිලෝන් ලණු කැබැල්ලක් ද, වික්ටර් අත යකඩ මුගුරක් ද තමාගේ සාක්කුවේ කාණු 7 පිස්තෝලයක් ද වූයේ ඕනෑම අවස්ථාවකට මුහුණ දීමට බලාපොරොත්තුවෙනි.

හදිසියේම සිතුවම් පටයට බාධා පැමිණියේ තමා සිටි කාමරයේ දොරට යමක් වැදුණු හඬිනි. ඔහු තිගැස්සී ගියේය. වල් බළලකු හෝ පියාඹා යන වවුලකු දොරෙහි හැපෙන්නට ඇතැයි ඔහු සිතුවේය. ජනේලය කර කර හඬක් නගමින් විවෘත විය. සුළඟත් සමග ඝන මීදුම් වලාවක් කාමරයට ඇතුළු විය. ඩර්වින්ගේ වෙරිමත සිඳී ගියේය.

ඇඟ හිරිගඬු නංවමින් අධික සීතලක් දැනී ගියේය. වසා තිබූ දොර පළුව කිරි කිරි කිරි හඬින් ඇරී යත්ම කළු හැඳ ගත් රුවක් ඔහුගේ ඉදිරිපස විය. ගැහැනියක් ද පිරිමියෙක් දැයි හරිහැටි කිව නොහැකි මලානික සුදුමැලි මුහුණ පමණක් පෙනෙන සේ, කළු පැහැති වේලයකින් හිස ආවරණය කර ගත් රූපයේ, යටි පතුල දක්වාම වැසෙන සේ කළු දිග කිමෝනාවකින් සැරසී තිබුණි.

ඩර්වින්ගේ තොල් වියළී ගියේය. හදවතේ ගැස්ම වැඩි



Scanned by CamScanner

sinhalaebooks.com

විය. මුළු සිරුර පුරාම විදුලි ධාරාවක් ගලා ගියා සේ ගැහෙන්නට පටන් ගත්තේය. කළු අවතාරය වටා මීදුම් වලාව ආවරණයක් සේ ගුළි ගැසී තිබුණි. එක්වරම වියරු සිනා හඬක් නැගිණි. කළු අවතාරයේ මුව විවර විය. ඇස් ගිනි ගෙන දිලිසිණි. තම ශීතල ඇත් ඩර්වින්ගේ බෙල්ල දෙපසින් තබා මිරිකන්නට විය. ඩර්වින් විසඥ වී බිම ඇද වැටුණි.

සිනා හඬින් හා යමක් ඇද වැටෙන හඬින් ඩර්වින්ගේ බිරිඳ වහා දිව ආවාය. සොල්දරයේ පියගැට පෙළ යමකු බැස ගියා සේ ශබ්දයක් සමග මීදුමක් උඩු මහලේ සිට පහළට ගලා විත් දොරෙන් පිට වී එළියට ගියේය.

ඈ හනික තම ස්වාමියාගේ කාමරයට පිවිසුණාය. සෙම ගලන මුවින් යුතුව ඩර්වින් බිම වැටී සිටියේය. ඇය කෑ ගැසුවාය. ඇගේ හඬින් සේවකයා ද පැමිණියේය.

"අප්පු, මහත්තයාව උස්සලා ඇඳට ආන්න. ඉක්මනට මං ඩොක්ටර්ට කතා කරන්නම්."

ඈ දුරකථනයෙන් වත්තේ වෛද්‍යවරයා ඇමතුවාය. මේ අතර සිහිය ලැබූ ඩර්වින් දොඩවන්නට පටන් ගත්තේය.

"එපා.....එපා, මාව මරන්න එපා. අයියෝ මට සමාවෙයන් විල්සන්. මට සමාවෙයන්, මං මැරෙන්න බයයි."

මඳ වේලාවකින් වෛද්‍යවරයා පැමිණ රෝගියා පරීක්ෂා කොට බලා මෙය දැඩි කම්පනයෙන් ඇති වූ රෝගී තත්ත්වයක් බව පවසා අදාළ ප්‍රතිකාර ලබා දීමට කටයුතු කෙරිණි. රෝගියා විවේක ගත යුතු බවත්, ඔහු තනි නොකර සිටිය යුතු බවත් වෛද්‍යවරයාගේ උපදේශය විය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 18

"ග්‍රේලෑන්ඩ් රෙස්ට්" නිවාඩු නිකේතනය වතු යායට අයිති එකකි. වැවිලි සමාගමේ වතුවල නිලධාරීන්ට නිවාඩු ගත කිරීමට පහසුකම් සැපයීම එහි කටයුත්ත විය. පින්ටෝ නම් බර්ගර් ජාතිකයා එහි පාලකයා විය.

ඉරිදා දිනවල මේ ස්ථානය විවිධ තරාතිරමේ වතු නිලධාරීන්ගෙන් පිරේ. රාත්‍රිය එන තුරු ගත කරන බොහෝ දෙනා පැමිණියේ සිය පවුල් සමගිනි. කාන්තාවන් හා ළමුන් ඔංචිල්ලා පැදීම හෝ කතා බහෙන් කාලය ගත කරද්දී පිරිමි බියර් හෝ සැර මත්පැන් වීදුරු තොල ගාමින් තම වතුපිටිවල කටයුතු ගැන කතා කරමින් පසු වූහ. අයෙක් තම එංගලන්ත සංචාරය පිළිබඳව විස්තර කතා කළහ. තවකෙක් තම වත්තේ කම්කරු නැගී සිටීම පාලනය කළ ආකාරය සිත් ගන්නා සුලු ලෙස විස්තර කළේය.

ඩර්වින් හා බිරිඳ ද එදින "ග්‍රේලෑන්ඩ් රෙස්ට්" කරා පැමිණියේ සතුටු වීම පිණිසය. මිතුරු සමාගමයේ පසු වන විට සිතේ ඇති කරදර නිවී යයි.

"හලෝ ඩර්වින්, කාලෙකට පස්සේ දැක්කේ; එන්න මිත්‍රයා." මෙසේ ඇමතූ රියන්සි ප්‍රනාන්දු නම් නුවරඑළිය ප්‍රදේශයේ විශාල වතු යායක සුපිරින්ටෙන්ඩන්ට්වරයා ඩර්වින්ගේ හොඳ මිතුරෙකි.

"හලෝ රියන්සි, ඉතින් කොහොම ද තොරතුරු?"

තම බිරිඳ කාන්තා සමාජය වෙත යැවූ ඩර්වින් රියන්සි අසල වාඩි වුණේය.

"වේටර්, තව වීදුරුවක් ගේන්න. ඔයා මොනව ද බොන්නේ. බියර් ද? විස්කි ද?"

"බියර් බොමු. වාහනේ ආපහු එළවන්නත් එපායැ."



Scanned by CamScanner

sinhalaebooks.com

"ඉතින් ඩර්වින්, අර නඩුව තාම ඉවර නැද්ද? මට ආරංචි වුණා ඔක්කෝම සිද්ධිය."

"තීන්දුව ලබන මාසෙ ලැබෙයි. මට හිතෙන්නෙ මට අවාසි වෙයි කියලා."

"ඒ මොක ද?"

"විල්සන් මැරෙන්න කලින් ඔක්කොම ගනුදෙනුවල මුල් පිටපත් අරගෙන ෆයිල් එකක් හැදුවා. ඒක දැන් උසාවියට බාර දීලා තියෙන්නේ."

"හරි හරි, ඒවා ඇත්ත කියලා ඔප්පු වෙයි ද?"

"සමහර විට එහෙම වෙන්නත් පුළුවනි. රියන්සි, ඒක ඉතින් මගේ ස්ටාර් එක අනුව තමයි සිද්ධ වෙන්නේ."

"ඩර්වින්, මං ඔයාගෙන් එකක් අහන්නම්, මාත් එක්ක අමනාප වෙන්නෙ නැත්නම්."

"අහන්න රියන්සි, ඕන දෙයක් අහන්න."

ඩර්වින් බියර් වීදුරුව හිස් කළේය.

"මට දැනගන්න ලැබුණු විදියට මිස්ටර් විල්සන්ගෙ අවතාරේ මේ වත්තේ සැරිසරනවාලු. මිනිස්සු දෙන්නෙක්ම මැරුණෙත් ඒ නිසා කියලා නිකන් ඕපදූප කතාවකුත් තියෙනවා."

ඩර්වින්ගේ මුහුණෙහි භීතියේ සෙවණැල්ලක් වැටී ගියේය. ඔහු ඇස් මහත් කර වටපිට බැලුවේය.

"රියන්සි, මටත් ඔහොම කතාවක් ඇහුණා. වත්තේ වොචර්ලා කීප දෙනකුටත් ඔය කළු ඇඳ ගත්තු අවතාරේ පහුගිය කාලෙ පෙනිලා තියෙනවා." ඔහුගේ මුහුණින් බයෙන් තැති ගත් විලාසයක් දිස් විය.

"ඔයාට එහෙම මුණගැහුණෙ නැහැ?"

"න් නෑ......නෑ.....ම.........මං දැක්කේ නෑ."



Scanned by CamScanner

sinhalaebooks.com

"එහෙනම් කමක් නෑ."

රාත්‍රී නවය දහය පමණ වන විට බොහෝ දෙනා පිටව ගියහ. ඩර්වින් මහතා සහ බිරිඳ මඳක් නැවතුණේ ඩර්වින්ගේ හිස තරමක් භ්‍රමණය වෙමින් පැවතුණු බැවිනි.

රාත්‍රී දහයයි තිහට පමණ ඔවුහු ආපසු පිටත් වූහ. මෝටර් රථය පාරට ගනිද්දී ඔවුනට පිටුපා පා ගමනින් යන යුවළ දර්ශනය විය. ඔවුන් ද "ග්‍රේලෑන්ඩ් රෙස්ට්" හි විනෝද වූ යුවළකි.

"අර දෙන්නා මොකෝ පයින්ම යන්නේ?"

වාහනයේ විදුලි ලාම්පු එළියෙන් ඔවුන් දෙදෙනා වටිනා ඇඳුම් ඇඳ ඇති බව පෙනිණි. කාන්තාව ලා අළු පැහැති දිග ගවුමකින් ද, හිස කළු පැහැති රිදී වැඩ ඇමූ ලේන්සුවකින් ද වසා සිටියාය. පිට මත වැටුණු කැරලි ගැසුණු කොණ්ඩය නිසා ඇය ඉතා රූමත් ළඳක් බව පෙනිණි. මිනිසා, යුරෝපීය ඇඳුම් ඇඳ සිටියේය. ඔහුගේ හිසෙහි සුදු මහත්වරුන් පලඳින ආකාරයේ දුඹුරු පැහැති තොප්පියක් විය.

"වාහනේ කැඩෙන්න ඇති. නැත්නම් ළඟ දෙන්නෙක් වෙන්න ඇති. අපි යමු."

කාරය ළඟා වත්ම මිනිසා අත ඉදිරියට දිගු කළ බැවින් ඩර්වින් වාහනය නවතා පසුපස දොර ඇර දුන්නේය.

"නගින්න, මගෙ හිතේ වාහනේ කැඩෙන්න ඇති." ඩර්වින් කීවේය.

"ඔව්, වාහනේ කැඩුණා. ඔයාලට ස්තුතියි." කාන්තාව කීවාය.

කාරය ඉදිරියට ඇදුණි. පසුපස සිටි යුවළ කතා බහෙන් තොරවම ගමන් කළහ. ඩර්වින් මහත්මියට මේ නිහඬතාව පුරුදු නැත.

"ඕගොල්ලන්ගේ බංගලාව මේ ළඟ වෙන්න ඇති තියෙන්නෙ."



Scanned by CamScanner

sinhalaebooks.com

"ඔව්, කන්ද උඩ. ඒතරම් දුර නැහැ." කාන්තාව කීවාය.

ග්‍රේලෑන්ඩ් බංගලාවට හැරෙන හන්දියේ දී "මය ඉස්සරහින් නවත්වන්න, කරුණාකරලා." කාන්තාව ඉල්ලුවාය. කාරය හන්දිය ළඟ දී නතර විය. ඉදිරියෙන් සුදු පාටට සොහොන් කොත් දර්ශනය විය. ඩර්වින් කාරයේ දොර හැර දීමට පසුපසට අත යැව්වේය. අයිස් කුට්ටියක් මෙන් සීතල දෙයක අත වැදුණු බැවින් ඔහු හැරී බැලුවේය. පුදුමයකි. පසු පස අසුනේ දෙදෙනකු වෙනුවට සිටියේ එක් අයෙකි. කළු පැහැති අවතාරයක් බඳු ස්ත්‍රිය රළු දෙනෙතින් ගිනි විහිදුවමින් ඩර්වින් දෙස බැලුවාය. ඔහුගේ හදවත ශීඝ්‍රයෙන් ගැහෙන්නට පටන් ගත්තේය. ඇයගේ මුහුණ දැක පුරුදුය. ඇරුණු දොරින් බැස ගත් කළු ඇඳ ගත් අවතාරය සොහොන් කොත් අතරට වැදුණි. ඩර්වින් ස්ටියරිං වීලය මත හිස තබා ගත්තේය.

"ඇයි, ඔයාට හරි නැද්ද තාම?"

ඩර්වින් මහත්මිය විමසුවාය.

"නෑ.....නෑ, මොකුත් නෑ. අපි යමු."

"අර දෙන්නා කියන්නෙත් නැතුවම බැස්සා, නේද?"

"හ්ම්..... වයින්වලට සිහිය විකල් වෙලා."

ඩර්වින් මහත්මිය ද කිසිවක් නොකීවේ වයින්වලින් ඇගේ හිස ද අවුල් වී තිබුණු බැවිනි. තමාට විල්සන්ගෙන් ගැලවීමක් නොමැති බව ඩර්වින්ට වැටහුණි. කළු හැඳ ගත් අවතාරය ඔහුට හඳුනා ගත හැකි විය. එහෙත් ඒ මළගිය භූතාත්මයක් නොවන බව ඔහුට පැහැදිලිය. කවරදාක හෝ කොතනක දී හෝ ඒ බිහිසුණු අවතාරයේ දැත් අතර තම ගෙල සිරවනු ඇතැයි සිතන විටත්, ඩර්වින්ගේ සිරුර කිලි පොළා ගියේය.

එදින රාත්‍රියේ ග්‍රේලෑන්ඩ් බංගලාවේ පිරිස නිදි සුවයේ පසු වෙද්දී රාත්‍රී දහයට පමණ ඇග්නස්ට ඇහැරුණි. වැසිකිළි යාම සඳහා අවදි වූ ඈ, විදුලි පහන දැල්වූවාය. කාමරයේ ඇඳ මත තම ස්වාමිදුව නොමැති බව දුටු ඇය තැති ගත්තාය. දොර



Scanned by CamScanner

sinhalaebooks.com

අඩවල් කර තිබුණි. කිසිවකුටත් නොදන්වා ඇය නාන කාමරය කරා ගියේ, සිල්වියා එහි යන්නට ඇතැයි සැකයෙනි. එහෙත් එය තවමත් අඳුරේය. එසේ නම් ඇය කොහේ ගියා ද? තින්දෙන් ඇවිදීම බොහෝ දුරට අඩු වී තිබුණු නිසා ඇය ලින්ඩාගේ කාමරයේ දොරට තට්ටු කළාය.

"පුංචි බේබි, පුංචි බේබි ඉක්මනට එන්න. ලොකු නෝනා කාමරේ නැහැ."

රමේෂ් වහාම කාමරයේ සිට ආවේය. ලින්ඩා ද ඔහුගේ පසුපසින් විය.

"දොරවලුත් ඇරල ද ඇගී අම්මා?"

"ඔව් බේබි, බාගෙට ඇරලා."

"ඔයා ඉන්න, මං බලලා එන්නම්. එයා මිදුලේ ඇති."

දොස්තර මහතා එසේ කියමින් සාලය තුළින් දොර හැරගෙන මිදුලට බැස්සේය. සිමෙන්ති බංකුව ද හිස්ය. සමහරදාට ඇය මේ බංකුව මත කරුවළේම වාඩි වී සිටින්නීය.

දොස්තර මහතා මිදුලෙන් ගේට්ටුව අසලට ගියේය. ලින්ඩා ද ඇග්නස් ද පෝටිකෝව යටට වී බලා සිටිති.

ගේට්ටුව පසු කර පාරට එන විටම රමේෂ්ගේ ඇසට පාරේ ඈතින් එන අඳුරු සේයා දෙකක් දිස් වුණි. ක්‍රමයෙන් එම රූ දෙක ඉදිරියටම ආවෝය. දොස්තර මහතාගේ හිස රත් විය. හදවත ගැස්ම වැඩි විය. ඒ එන එක් අයෙක් සිල්වියාය. ඇයගේ අතිනත ගෙන එන කළු පැහැති ඇඳුමක් ඇඳ තොප්පියක් පැලඳ සිටියේ අන් කවරකු හෝ නොව, විල්සන් මහතාය.

ඔහුගේ උගුරේ යමක් හිර වෙනවා මෙන් දැනිණි. තමාගේ සිහිය නැති වී යනවා සේ මතකය. ඔහු දන්නේ එපමණි.

බිම ඇද වැටීමට ගිය දොස්තර මහතා අදෘශ්‍යමාන හස්තයකින් අල්ලා ඔසවනු ලැබීය. ඊළඟට සිල්වියා මැතිනියගේ දෝතින් දොස්තර මහතා බංගලාවට ගෙන යනු ලැබීය.



Scanned by CamScanner

sinhalaebooks.com

"අනේ මොක ද මෙයාට වුණේ? අම්මි කොහේ ද ගියේ?" ලින්ඩා කලබලයෙන් විමසුවාය.

"මං පාරේ ඇවිද්දා. මෙයා මාව දැකලා බය වුණා. ඒක හරි යයි." සිල්වියා පැහැදිලි ලෙසම කීවාය.

"මොනවා! අපේ ලොකු නෝනා ආයිමත් කතා කරනවා. අනේ වාසනාවන්." ඇග්නස් ඉහළට අත් ඔසවා දෙවියන්ට ස්තූති කළාය.

වතුර ඉසිනු ලැබූ දොස්තර මහතා ප්‍රකෘති තත්ත්වයට පැමිණියේය. ඇස් හැර මවිතව බැලුවේය.

"ඇයි ඔයා අම්මිට බය වුණේ? එයා පාරට ගිහිල්ලා ඇවිදින්න. එයා දැන් කතා කරනවා රමේෂ්."

"ඒක හොඳයිනේ. මං කිව්වේ කවදා හරි එයා යථා තත්ත්වෙට එනවයි කියලා. කෝ දැන් අම්මා?"

"එයා කාමරේට ගියා."

"අපිත් යමු. මං කළුවරේම අම්මා එනවා දැක්කාම බය වුණා. අවතාරයක් වගේමයි පෙනුණේ" දොස්තර මහතා බිදුලේ ඇත කෙළවර දෙස බැලුවේය. ඔවුහු යළිත් නිඳා ගැනීමට ගියහ.

"හෙට උදේ අම්මට කතා කරමු. දැන් කරදර කරන්න එපා." රමේෂ් ලින්ඩාට පැවසුවේය.

☆ ☆ ☆ ☆ ☆ ☆ ☆

සිල්වියා මැතිනිය යළි ප්‍රකෘති තත්ත්වයට ඒම, එම පවුලේ මහත් වූ ප්‍රමෝදයට හේතුවක් විය. පසු දිනක ඔවුහු දේවස්ථානය වෙත ගොස් යාච්ඤා මෙහෙයකට ද සහභාගි වූහ.

"මට බොහොම සතුටුයි ඔබතුමියට සනීප වීම ගැන. දෙවියන් වහන්සේගේ කරුණා මහිමය ඔබට ලැබී තිබෙනවා. කවදාවත් එතුමා තමාගේ ශ්‍රාවකයන් අමතක කරන්නේ නැති බවට ඒක හොඳ සාක්ෂියක්. මැතිනිය ඔබට, දෙව් පියාණන්ගේ ආශිර්වාදය නොඅඩුව ලැබේවා!" යි කියමින් පියතුමා සිල්වියාට



Scanned by CamScanner

sinhalaebooks.com

ආශිර්වාද කළේය.

එදින යාච්ඤාව පිණිස බොහෝ දෙනකු පැමිණෙන දිනයකි. ඩර්වින් හා එම මහත්මිය ද පැමිණ සිටි අය අතර වූහ. වෙනදා ඩර්වින්ගේ මුහුණෙහි වූ කපටි, සෙල්ලක්කාර පෙනුම වෙනුවට, එහි අද යක්ෂයා ලැගුම් ගෙන සිටියේය. කළු පැහැති මුහුණ හා මලානික ඇස් හිතෙහි පවතින චංචල ස්වභාවය මැනවින් පෙන්නුම් කළේය. යාච්ඤාවේ යෙදෙන අතරතුර ඔහු, සිල්වියා ඇතුළු පිරිස දෙසට හොරෙන් හොරෙන් නෙත් යොමු කළේය. සිල්වියාගේ ශරීර ස්වභාවය ඔහුට පෙනුණේ කළු හැඳ ගත් අවතාරයක් ලෙසය. ඇයගේ කළු පැහැති කැරැලි ගැසුණු කෙස් කලඹ විෂඝෝර සර්පයන් රැසක් ලෙසින් ඔහුගේ ඇස් තුළ මහත් කැලඹීමක් ඇති කරන්නට විය. ඔහු වහාම දෙනෙත් සිර කර පියා ගත්තේය.

ලින්ඩා ද ඩර්වින්ගේ මේ විපර්යාස මැනවින් දුටුවාය. තම පියාගේ මරණය සිදු කළේ මොහු විසින් බවට කිසිදු සැකයක් නැත්තේය. ඒ සඳහා උදව් කළවුන් අතුරෙන් දෙදෙනකු අකාලයේ දරුණු ලෙස මරණයට පත් වී ඇත. ඊළඟට ඇත්තේ මොහුගේ වාරය ද? එය කෙසේ සිදු වේ ද? ලින්ඩාගේ ඇඟ හිරි වැටී ගියාය. ඇය වහා දෙනෙත් වසා ගෙන යාච්ඤාවේ නිරත වූවාය.

යාච්ඤා මෙහෙය අවසන් වීමෙන් පසුව, ඩර්වින් හා එම මහත්මිය වහ වහා දේවස්ථානයේ මිදුලට පිවිස වාහනයට නැගී පිටත්ව ගියහ.

"එයා දැනටමත් බය වෙලා." ලින්ඩා කීවාය.

"ඔව්. දැක්කෙ නැද්ද මූණ එහෙම පිටින්ම වෙනස් වෙලා?" රමේෂ් ඈතින් වේගයෙන් යන රථය දෙස බලා සිටියේය.

"පල්ලමට පෙරළ ගනීවි ද දන්නේ නෑ, යන වේගෙට."

"එයාට පිස්සු වැටිලා. මූණත් යක්ෂයාගෙ වගේ. දැක්කනේද?"



Scanned by CamScanner

sinhalaebooks.com

# 19

අධිකරණයේ තීරණයට අනුව ඩර්වින් නඩුවෙන් පරාජය ලැබුවේය. ඒ අනුව සියලුම අලාභය හා විල්සන් මහතාට ගෙවිය යුතු වන්දිය වශයෙන් විශාල මුදලක් ගෙවීමටත් ඩර්වින් මහතාට නියෝග ලැබුණි. මේ වන විටත් අධික ලෙස ණය වී සිටි ඔහුට, මේ මුදල් ගෙවීමට වර්ෂයක කාලයක් ලබා දෙන ලෙස සමාගමෙන් කළ ඉල්ලීම පිළිගනු ලැබුණි. එහෙත් ඔහු තනතුරෙන් පහත් කෙරිණි. මානසිකව ඇති වූ කම්පනය නිසා ඩර්වින් තවදුරටත් සුරාවට ලොල් වුණි.

මේ අතර සිල්වියා මැතිනියගේ ජීවිතයට නව එළියක් වැටුණේ ලින්ඩාගේ දරු ප්‍රසූතියත් සමගය. ඇයට ලස්සන ගැහැනු දරුවකු ලැබිණි. වෙනදා නොමැති වූ ප්‍රබෝධයෙන් ලින්ඩා ද සිල්වියා ද රමේෂ් ද කල් ගත කළහ.

එක්තරා දිනක රාත්‍රියේ දොස්තර මහතා ද ලින්ඩා ද දරුවා ද කාමරයේ පසු වෙද්දී සිල්වියා මැතිනිය පෝටිකෝවේ ඇඳි පුටුවේ වාඩි වී විවේක සුවයෙන් සිටියාය. කඳු යායේ ඇතින් සඳ බැබළෙමින් ඇත. සීතල සුළඟ නැවුම් සුවඳින් යුක්තව දැවටෙයි. ඉඳහිට ඇසෙන ගීත රාවයක් කම්කරුවන්ගේ නිවාස දෙසින් ගුවනට මුසු වෙයි.

සිල්වියාගේ මතකය අවදි වන්නේ මුලින්ම විල්සන් මහතාගේ ඇවැන්ත රූපයත් සමගමය. පසුගිය දින කීපයක් තුළ විල්සන්ගේ සේයාවක් හෝ තමා සොයා නොආ බව ඇයට මතකය. ඔහු සැබැවින්ම පැමිණියා ද; නැතහොත් ඒ සියල්ල සිහිනයක් දැයි ඇයට ප්‍රහේලිකාවකි. එහෙත් විල්සන් මහතාගේ භූතාත්මය වරින් වර ග්‍රේලෑන්ඩ් නිවසට පැමිණ තමාට දර්ශනය වූවා ඇයට මතකය. වශී බලයකින් තමා ඔහු වෙතට ඇද ගනු ලැබීමත්, වතු යායේ එහේ මෙහේ අසිහියෙන් තමා ඔහු සමග ගමන් කළ බවත් ඇයගේ මතකයේ තවම රැඳී ඇත. ඒ සමගම



Scanned by CamScanner

sinhalaebooks.com

දැඩි කම්පනයක් හා තිගැස්මක් සිතෙහි ජනිත වී විශාල රතු ලේ දහරාවකින් මුළු පරිසරයම වෙළා ගන්නා අන්දමත් සිල්වියාගේ මතකයෙන් අවදිවත්ම ඇගේ සිත මහත් භීතියකින් වෙළී ගියේය. ඈ කල්පනා නොකර සිටින්නට උත්සාහ කළාය. තම පපුවේ කුරුසයේ ලාංඡනය ඇඳ ගත් ඈ මරියතුමියගේ ශාන්ත භාවයෙන් පිරුණු මුහුණ සිහිපත් කරන්නට උත්සාහ කළාය. එහෙත්, ජේසු සමිඳාණන්ගේ දෙඅත් හා ළමැද සිදුරු කළ ඇණ පහරින් තුවාල වූ තැන්වලින් ගලන රතු රුධිර ධාරාවන්ගෙන් උන්වහන්සේගේ ශුද්ධ වූ ශරීරය වැසී යන අයුරු ඇයගේ සිහියට නැගුණි. කුරුස ගසෙහි එල්ලා සිටියේ ජේසු සමිඳාණන් නොව, තම සැමියාගේ රුව යයි ඇයට පෙනිණි.

එසැණින්ම ඝන මීදුම් වලාවක් පාවී අවුත් තමා වෙළා ගන්නා අයුරු ඇයට දර්ශනය විය. මීදුම තුනී වී යත්ම ඒ තුළ සිය සැමියාගේ රූපකාය දර්ශනය විය.

"සිල්වියා, මං ආවා. මං ඔයාට ආදරෙයි."

හෙමින් මුමුණන හඬක් ඇසිණි. සිල්වියා උමතු වූ ස්වභාවයකින් වශී වී ඔහු දෙස බලා සිටියාය.

"සිල්වියා......... තව එක්කෙනයි, ළඟ දී ම එයාව ඉවර කරන්න ඕනෑ. මට ඔයාගෙ උදව් ඕන. මේක තනියම කරන්න බෑ. අපි එයාව ඉවර කරමු."

අවතාරය හෙමින් මිමිණුවේය. සිල්වියා තම මුව විවර කළාය.

"විල්සන්, මං ඔයාට ආදරෙයි විල්සන්. ඒත් මට බෑ ඔයාට උදව් කරන්න. මට මිනිස්සු මරන්න බෑ, මට බෑ විල්සන්." ඇය දෙඩුවාය.

"මොනව ද ඔයා මේ කියන්නේ? උන් මාව මැරුවා. ඩර්වින්ලා මාව එල්ලුවා. වඩිවේල් කකුල් දෙකෙන් අල්ල ගෙන හිටියා. වික්ටර්.......... හඃ හඃ වික්ටර්, ඌ උදව් කළා. උන් දෙන්නම ඉවර කළා. අපිට මේකෙන් පස්සේ ඔක්කෝම ඉවරයි සිල්වියා."



Scanned by CamScanner

sinhalaebooks.com

"විල්සන්......... මගේ විල්සන්, මං ඔයාට ආදරේ නිසාමයි මෙහෙම කියන්නෙ. මේ වෛරය අපි නතර කරලා ආමු. ඩර්වින් දැනටමත් බාගෙට මැරිලා. මං දැක්කා එයා මැරි මැරී ජීවත් වෙනවා. අපි මේ පාපෙන් ගැලවෙමු විල්සන්. එයාට දෙවියන් වහන්සේ දඬුවම් දෙයි විල්සන්." ඈ බැගෑපත් විය.

"මොනවා සිල්වියා, ඔයා මොනව ද මේ කියන්නේ? උන්ට මම කොහොම ද සමාව දෙන්නේ? මට ඕනෑ එයා අර බාල්කෙ එල්ලිලා ඉන්නවා දකින්න."

"එපා! ඔයා ආයි පව් කර ගන්න එපා. මේ ආත්මෙන් ඔයාට අත් මිදෙන්න ඕන නම් මේ පව් කිරීම නතර කරලා එන්න විල්සන්. මම ඔයාගෙන් ඉල්ලනවා, අපේ ආදරේ නාමෙන්වත් මේ වෛරය නතර කරන්න. ස්වභාව ධර්මයට දඬුවම් දෙන්න ඉඩ දීලා අපි බලා ඉමු විල්සන්. ප්ලීස්, අපේ දරුවන් වෙනුවෙන්වත් අපි මේ දේ කරමු."

"සිල්වියා, මට තේරෙනවා ඔයා කියන දේ. මම මනුස්සයෙක් නොවුණට මනුස්ස හැඟීම් මටත් දැනෙනවා. මම හිතලා බලන්න ඕනෑ සමාව දීම ගැන. හිතලා බලන්න ඕනෑ. මම වෛරයෙන් පිස්සු වැටිලා. ඒක වැරදියි...... ඒක වැරදියි, මට සමාවෙන්න සිල්වියා. මං ඔයාට කරදර කළා. මං ඔයාට හැමදාම ආදරෙයි." හඬ ක්‍රමයෙන් නැති වී ගියේය.

"ලොකු නෝනා නැගිටින්න, එන්න යන්න කාමරේට ගිහින් නිඳා ගන්න."

ඇග්නස්ගේ කටහඬින් සිල්වියා සිහින ලොවින් පියවි ලොවට පැමිණියාය. ඇය ඇස් හැර වටපිට සෙවිල්ලෙන් බැලුවේ තම ස්වාමියා තවමත් තමා ඉදිරියේ සිටිතැයි යන කුතුහලයෙනි.

වෛරය බිහිසුණුය. එය බිංදුවෙන් පටන් ගෙන දිනෙන් දින වර්ධනය වෙමින් වෛර කරන්නාගේ සිත තුළ පැලපදියම් වී එයිනුදු ඔබ්බට අනන්තය තෙක් ගමන් කරයි. ඇට, ඇටමිදුලු තුළට පවා වෛරයේ වෛරසය ඇතුළු වේ. වෛරය ලබන්නා ද වෛර කරන්නා ද දෙදෙනාම බුබුළු දමමින් පැසෙන ලෝදියක



Scanned by CamScanner

sinhalaebooks.com

පැසෙන්නා සේ නිරතුරුවම වේදනා විඳිති. ඔවුනට වෛරය හා පළිගැනීම හැර වෙනත් ආගම ධර්මයක් නොමැත. වෛර කරන්නා ඉතා සියුම් ලෙස කවරදා කෙලෙසක තම සතුරාගේ ජීවිතය නසම් දැයි සැලසුම් කරමින් පසු වෙයි. ඔහු මට කුමක් කරන්නේ දැයි දිවා රෑ සෙවිල්ලෙන් පසු වෙන අනෙකා මුලින් කී එකා ලෙසම නිරතුරු සැකය හා බිය ඇතුව මෙලොව අපායක දිවි ගත කරයි.

විල්සන් මිය ගිය පසු ඔහු අවතාරයක් බවට පත් විය. මෙලෙස වෛරය සිත තුළ තබා ගෙන අවසන් හුස්ම හෙළන්නෝ කවරදාවත් සන්සුන් සිතක් සහිතව උපදින්නේ නැත. තමාගේ පළිගැනීම වඩාත් සාර්ථකව කර ගත හැකි තැනකම උපදිති. බෞද්ධ සාහිත්‍යයේ එන කාලී යකින්න ද එවැනි තැනැත්තියකි. මෙබඳු අවතාර ලෙසින් පෙනී සිටින භූතාත්ම නිසා පීඩා විඳින්නෝ ද බහුලය. ඔවුන් නිසා යැපෙන්නෝ ද බහුලය. තොවිල් පවිල් කරමින් භූතාත්ම එළවා දමන්නන් මේ වර්ගයේ අයවලුන්ය.

විල්සන් මහතාගේ අවතාරය ග්‍රේලෑන්ඩ් වතු යාය හැර ගියේ නැත. ඔහු අවශ්‍ය අවස්ථාවේ බලවත් භූතාත්මයක් වී තම අරමුණ ඉටු කර ගැනීමට උත්සාහ ගත්තේය. ඒ සඳහා තම ජීවත් වන බිරිය ද යොදා ගත්තේය. පෙර කී මරණ දෙකම සිල්වියාගේ සහයෙන් සිදු කෙරුණි. අවසාන පළිගැනීම සඳහා ද ඇය යොදා ගැනීම භූතාත්මයේ කැමැත්ත විය. එහෙත් දැනට ඒ සඳහා බාධාවක් එල්ල වී ඇත.

සිල්වියා මහත්මියට පියවි සිහිය ලැබුණත් ඇයගේ චර්යාවන්ගේ විශාල වෙනසක් නොවුණි. ඈ බොහෝ වේලා පෝටිකෝවේ වූ ඇඳි පුටුවේ ගත කළාය. කුඩා දරුවා ද සුරතල් කළාය. ඉරිදා දිනවල පල්ලියට ද ගියාය.

එක් දිනක් සිල්වියා පල්ලියට ගොස් ආපසු එන ගමනේ දී විශාල පයින් ගසක් අසල මඳක් නැවතී අවට නැරඹුවාය. එතැන ගලින් කළ ආසනයක් ද විය. මේ ස්ථානයට පහළින්



Scanned by CamScanner

sinhalaebooks.com

ඇති මනෝරම්‍ය දර්ශනය ද ඈතින් කඳු වැටිවල විස්මය දනවන දැක්ම ද මැනවින් පෙනේ. ඈතින් ඈතට විහිදී යන විට ක්‍රමයෙන් පැහැය වෙනස් වී ගොස් ඡායා මාත්‍රයක් පමණක් වන කඳු පංතිය දිය සායමෙන් ඇඳි සිතුවමක් සේ මනස්කාන්ත දසුනකි.

තමා ස්වාමියා සමග මේ ස්ථානයේ සිට කීප වතාවක් මේ දර්ශනය නරඹන්නට ඇද්දැයි ඇය සිහි කළාය. ඔහුගේ අත්ලේ උණුසුමත්, ඔහුගේ සිරුරෙන් හමා ආ කුරුඳු පොතුවල ඇති සුගන්ධයත් ඇයට සිහිපත් විය. ඇය සුසුමක් හෙළුවාය. සීතල සුළඟත් සමග ඇදී ආ මීදුම් වලාව ඇය වසා ගත්තේය. සුපුරුදු සුවඳ නාසයට දැනුණි.

"සිල්වියා, මං ආවා. මං ඔයාලව ආලා කොහේවත් යන්නෙ නෑ."

සිහින් හඬින් ඇය අමතන විල්සන් මහතාගේ ස්වරය ඈට හුරුපුරුදුය.

"විල්සන්....... මගේ විල්සන්, දැන් මට සනීපයි. දැන් මං ඉන්නේ ගොඩක් සතුටින්. ඔයා නැති අඩුව විතරයි."

"ඒක මං දන්නවා සිල්වියා. මං හැමදාම ඔයාලා ළඟම ඉන්නවා. ඒත් මට ඩර්වින්ගෙන් පළිගන්නම වෙනවා. ඔයාලගේ යහපතට ඒක කරන්නම වෙනවා. නැත්නම් එයා අපේ දරුවන්ට අනතුරක් කරාවි. මට හිතෙනවා ඔය දුෂ්ටයා දැනටමත් ඒක සැලසුම් කරලා ඇති."

"විල්සන්, ඒත් ටිකක් හිතලා බලන්න; මේකෙන් අපේ දරුවන්ට ප්‍රශ්නයක් වුණොත්?"

"නෝනා, දැන් අපි යමු නේද?"

තම ස්වාමිදූව තනිවම මුමුණනු දුටු රියැදුරු, ඇය අසලට පැමිණියේය.

"හොඳයි අපි යමු." ඇය මෝටර් රථයට ගොඩ වුණි. මීදුම් වලාව ඈතට පාවී ගියේය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 20

ඩර්වින් පියවි සිහියෙන් සිටිනුයේ උදය වරුවේ පමණි. වත්තේ රාජකාරිය ද කළේ ඕනෑවට එපාවටය. අලුතින් පැමිණි වතු අධිකාරිවරයා ද ඔහු නොරිස්සුවේය. වත්තේ පැරණි සේවක පිරිස් ද හැකි හැමවිටම ඩර්වින් මග හැර යාමට උත්සාහ කළෝය.

දිනක් ඔහු තමාට හිතවත් ටීමේකර්වරයකු සිටින බංගලාව වෙතට යමින් සිටියේය. බංගලාවට ළං වන විට එහි දොර වසා තිබූ නමුත් සාලයේ කිප දෙනකු කතා කරන හඬ පැහැදිලිව ඇසිණි. දොරට තට්ටු නොකරම ඩර්වින් ජනේලය අසලට වී ඇතුළත කෙරෙන කතා බහට කන් දී සිටියේය.

"අපි මුලදිමත් හිතුවා ඔය මිනිහා ඕක කරන්න ඇති කියලා. රත්තරං ටිකට හිටිය විල්සන් මහත්තයා ගැන ඔය හාදයා ඊර්ෂ්‍යා කළා. අනුමානයක් නෑ. ඔය යකා තමයි ඒ මනුස්සයාව මැරුවේ."

"මමත් අර කපන්ට බැරි අත ඉඹින්නා වගේ ආස්සරේ කළාට ඔය සර්පයා ළඟින්වත් තියා ගන්න හොඳ නෑ."

"හැබැයි කවදා හරි ඔය වැඩවලට මිනිහාට දඬුවම් ලැබෙනවා. වික්ටර් මළා වගේ නෙවෙයි ඔය හාදයා මැරෙන්නෙ, විඳවලා."

මේ නම් කතා කරන්නේ තමා ගැනම බව ඩර්වින්ට විශ්වාසය. ඔහු හෙමින් සීරුවේ ආපසු ආවේ බලවත් වූ සිත් කැලඹීමෙන් යුතුවය. එදා ඔහු වෙනදාටත් වඩා මත්පැන් බිව්වේය.

මීදුම වැඩිවත්ම ඔහුගේ සිත චංචල විය. දැන් දැන් විල්සන්ගේ අවතාරය පැමිණ තමාගේ ගෙල සිර කරතැයි බයෙන් ඔහු තරයේ ඇස් පියා ගෙන නිඳි වර්ජිතව රැය ගත කළේය.



Scanned by CamScanner

sinhalaebooks.com

දවල් වරුවේ නිඳා ගත්තේය.

මේ අතර වත්තේ සේවයෙන් පහ කිරීමේ ලිපිය ඔහු අතට පත් විය. සියල්ල අවසන් වන මොහොත ළඟා වී ඇතැයි ඔහු සිතුවේය. තමාට ව්‍යසනය උදා කළ දොස්තර හා ලින්ඩාගෙන් පළිගෙනම සියල්ල අවසන් කළ යුතු යැයි ඔහු තීරණය කළේය.

ලින්ඩාගේ දරුවා දැන් හුරුබුහුටිය. ලිලී මලක් මෙන් සුන්දරය. ඇගේ නම ලියෝනීය. දෙහැවිරිදි වියේ පසු වන දැරිය කාගේත් ආදරය දිනා ගත්තාය. සිල්වියා මැතිනිය ඇයට බෙහෙවින් ආදරය කළාය. දොස්තර මහතාත්, ලින්ඩාත් නිවසෙන් බැහැර ගිය එදින ලියෝනී දැරිය සිය මිත්තණිය සමග මිදුලේ සෙල්ලම් කරමින් පසු වුණි.

"නෝනා බේබිත් එක්ක එන්න තේ බොන්න."

ඇග්නස් සිල්වියාට කතා කළාය.

"අපි යමු දූ තේ බොන්න. මොනව ද ඇගී බේබිට කන්න තියෙන්නේ?"

"චූටි බේබිට චොක්ලට් කේක් තියෙනවා. පාන් තියෙනවා ජෑම් ගාලා."

"බෑ......බෑ......බෑ......" දැරිය පොල් කටුවලට වැලි පුරවමින් කීවාය.

"බෑ කියලා බෑ. ඔයා කන්නම ඕනෑ. නැත්නම් කොහොම ද බබා ලොකු වෙන්නේ? ඇගී තේ මෙහාටම ගේන්න. මම පොවන්නම් එයාට."

"හොඳයි නෝනා."

මේ අතර බංගලාව අවට ඇති තේ පඳුරු අතරින් රිංගමින් ගමන් ගන්නා කැහැටු පෙනුමැති කළු පැහැති මිනිසෙකි. ඔහුගේ අත සම් බෑගයකි. ඔහු එහි වටිනා යමක් ඇතිවාක් මෙන් ප්‍රවේසමෙන් වැලමිටට සිර කර ගෙන තේ පඳුරු අතරින් හොරකු මෙන් ගමන් කරන්නේ බංගලාව



Scanned by CamScanner

sinhalaebooks.com

දෙසටය. ක්‍රමයෙන් බංගලාව ළඟට පැමිණි පුද්ගලයා මිදුලේ වූ අඹ ගසට මුවා වී වාඩි වුණි.

මේ අතර ඇග්නස් බන්දේසියක තබන ලද කේක්, පාන් පෙති හා කිරි බෝතලයක් හා කිරි තේ ජෝගුවක් සහිතව පැමිණියාය.

"ආ කන්න පුතේ."

සිල්වියා ඇරියට බලෙන්ම කවන්නට වූවාය.

ඇරිය "බෝ.....බෝ" යනුවෙන් වතුර ඉල්ලා සිටියෙන්, සිල්වියා ඇග්නස් ඇමතුවාය. එහෙත් කුස්සියේ සිටි ඇග්නස්ට ඇගේ හඬ ඇසුණේ නැත.

"පුතා ඉන්න, මං බෝ ගේන්නම්."

සිල්වියා ඉක්මනින් ගෙතුළට ගියේ ඇරිය එතැන වූ කුඩා පුටුවේ වාඩි කරවමිනි.

ඇය මඳ වේලාවකින් වතුර වීදුරුවත් රැගෙන එන විට දුටු දෙයින් මවිත වී කතා කර ගත නොහී ගල් ගැසුණි.

ඇරිය අසලම පෙණ ගොබය පුප්පා ගත් විශාල නාගයෙකි. ඇරිය ඔහු සමග කතා කරමින් පසු වෙයි.

"කයියා........ කන්න......... පාන්"

ඇය පාන් කැබලි නයා අබියසට දමමින් සිටියාය. නයාගේ ප්‍රතිචාරයක් නොමැති තැන ඈ,

"ලත්තන කයියා....... ආ...... චිච්චි බොන්න."

කියමින් සිය මිත්තණියගේ කිරි වීදුරුව නයා අසල තැබුවාය. නාගයා සිය පෙණ ගොබය පහත් කර කිරිවලට ඉව අල්ලා බොන්නට පටන් ගත්තේ සිල්වියා පමණක් නොව, සැඟවී බලා සිටි අභිගුණ්ඨිකයා ද මවිතයට පත් කරවමිනි.

කිරි ස්වල්පයක් බිව් නාගයා නිසොල්මනේ තණකොළ මතින් ඇදී වත්තට ගමන් කළේය.

"අනේ මගෙ රත්තරං.........." සිල්වියා පියවි සිහිය ලත්



Scanned by CamScanner

sinhalaebooks.com

විගස දිවගොස් ඇරිය වඩාගෙන තුරුලු කරගෙන සිප ගත්තාය.

"ආතම්මා කයියා ගියා. චිච්චි බීලා ගියා. හොඳ කයියා නේද? ආතම්මා"

ඇරිය සුරතල් බසින් දොඩමින් සිය මිත්තණියට නයා ඇදී ගිය දිශාව පෙන්නුවාය.

මෙය දෛවයේ හාස්කමකැයි සිල්වියා සිතුවාය. වැඩිහිටියන්ගේ නපුරුකම්වලින් දරුවන්ගේ සුරතල්, නිර්මල ලෝකය විනාශ කළ නොහැකි බවට ස්වභාව ධර්මය සාක්ෂි දැරූ මේ මොහොත ඉතාම ආශ්චර්යවත් එකක් විය. ඇය දෙවියන්ට ස්තුති කළාය.

මේ අතර වහාම තේ පඳුරු අතරින් පලා ගිය අභිගුණ්ඩිකයා ගල් කුලුනට මුවා වී ඔහු එනතුරු බලා සිටි පුද්ගලයා හමුවට හති දමමින් දුවගෙන ආවේය.



"සර්....... ස... සර් වැ.... වැඩේ..... ගැස්සුණා."

"මොක ද වුණේ බං?"



Scanned by CamScanner

sinhalaebooks.com

"සර්......... න..... නයා දැම්මා. ඌ බබා කෑවෙ නෑ. එයාගෙන් කි......කිරි බීලා ගියා."

"කිරි බීලා ගියා? මෝඩ හරකෝ, තෝව මං නයාට කිරි පොවාගෙන එන්ට ද ඇරියේ. අරුන්ට දණ්ඩ කරන්න නේද?" ඩර්වින් අත දිග හැර කම්මුල් පාරක් අභිගුණ්ඨිකයාට දුන්නේය.

"අයියෝ........ මට ගහන්ට එපා. මං මක්කොරන්ට ද?" අභිගුණ්ඨිකයා කම්මුල අතගාමින් කීවේය.

"හොඳයි........... මේං මේකත් අරගෙන මගේ ඇස් දෙකට නොපෙනී මකබෑවෙයන්. හැබැයි පුතෝ මේක කාටවත් කියලා තිබ්බොත් මං උඹවත් උඹලගෙ වාඩියවත් ඉතුරු කරන්නෙ නෑ. තේරුණා ද?"

"අනේ..... නෑ සර්, මං යනවා මං යනවා."

ඩර්වින් දුන් නෝට්ටු කිපය මිට මොළවා ගත් අභිගුණ්ඨිකයා ගල අසල තිබූ තම ලෝගුවත් කරේ දමාගෙන හැකි ඉක්මනින් පාර දෙසට දිව්වේය.

"මගේ කාලකණ්ණිකමක මහත, එකක්වත් හරියන්නෑ."

තමාටම කියා ගත් ඩර්වින් අභිගුණ්ඨිකයා ගෙනා හම් බෑගයට වේගවත් පා පහරක් එල්ල කොට එතැනින් නික්මුණේය.



Scanned by CamScanner

sinhalaebooks.com

# 21

මේ වන විටත් ඩර්වින්ට තමාගේ රැකියාව ද අහිමි වී අවසානය. මේ සියල්ලම තමාගේම වැරදි ක්‍රියා කලාපය නිසා බව කිසිසේත්ම පිළිගැනීමට ඔහු නොකැමැතිය. මේ හැම දෙයක්ම විල්සන්ගේ පවුලේ අය නිසා සිදු වූ බව ඔහු තරයේ විශ්වාස කරයි. විශේෂයෙන් රමේෂ් දොස්තර මේ පවුලට සම්බන්ධ වීම තමාගේ පරිහානිය ඉක්මන් කළ බව ඔහු කල්පනා කළේය.

"හොඳයි බලමු, අවසානේ කවු ද දිනන්නේ කියලා."

ඩර්වින් තනිවම තොල් මතුළේය.

තමාගේ සතුරන් විනාශ කළ යුතුය. ඒ සඳහා තමාට මොන කරදර පැමිණියත් කම් නැත. අවතාරයෙන් බේරීම සඳහා ඔහු අපූරු උපක්‍රමයක් අනුගමනය කළේය. ඒ ගෙලෙහි කුරුසියේ ලාංඡනයක් පැලඳ ගැනීමයි. අවතාර හා භූතාත්ම කුරුසියේ ලකුණටත්, සුදු ලූනුවල සුවඳටත් බය ඇති බව ඔහු බටහිර හොල්මන් චිත්‍රපටවලින් දැක ඇත. ඒ අනුව ඔහු රිදී පැහැති කුරුසියක් පැලඳ ගත්තේය.

මියගිය වික්ටර්ගේ හොඳම මිත්‍රයකු වූ ඇන්තනී මුහුදුබඩ ප්‍රදේශයක සිට පැමිණියෙකි. නගරයේ හොර සුරා ජාවාරමට සම්බන්ධ කෙනකු වූ ඔහු තවත් නීති විරෝධී හා සමාජ විරෝධී ජාවාරම් කීපයකට ප්‍රධානියෙකි. මුදල් දෙන්නේ නම් ඕනෑම අපරාධයකට ඔහු පොලඹවා ගත හැක. ඩර්වින් ද කලක සිට ඔහු ළඟින්ම ආශ්‍රය කළේය. ඇන්තනීගේ ගෝලයන් ද ඔහු මෙන්ම මෘගයෝය.

නාවලපිටිය ප්‍රදේශයේ එක්තරා අවන්හලක මේසයක් වටා වාඩි වූ තිදෙනෙකි. ඔවුහු ඉස්තරම් වර්ගයේ මත්පැන් තොල ගාමින් සාකච්ඡාවක යෙදෙති. ඩර්වින් හා ඇන්තනී ද ටයිටස් නම් වූ මිටි මිනිසා ද අවන්හලේ අයට අමුත්තන් නොවේ.



Scanned by CamScanner

sinhalaebooks.com

ඔවුහු සතියකට වරක්වත් මේ ස්ථානයට පැමිණෙන අය වෙති.

"හරි එහෙනම්, අපි වැඩේ බාර ගත්තා. හරි ගියා කියලා හිතා ගන්න."

"මෙන්න මෙතන බාගයක් ඇති, ඉතිරිය වැඩේ වුණාට පස්සේ."

"හරි සර්, වැඩේ කෙස් ගහට දෙන්නම්. ටයිටස්ට බාර දුන් වැඩක් ආයි මිස් වෙලා නෑ." කොටා ද උදම් ඇනුවේය.

ඇන්තනි භාර ගන්නා කොන්ත්‍රාත් ඉටු කරන්නේ ටයිටස් ප්‍රධාන ගෝලබාලයන් විසිනි. සතුරන් පැහැර ගෙන යාම, කප්පම් ගෙන නිදහස් කිරීම හෝ මරා දැමීම මොවුන්ට සුළු දෙයකි. ඊට අමතරව ගිනි තැබීම්, පහර දීම් වැනි කටයුතුවලට ද මොවුහු දක්ෂයෝය.

"හොඳයි එහෙනම්, මේ ඉරිදා ඔක්කෝම බංගලාවේ ඉඳීවි. මොනවා හරි වෙනසක් වුණොත් මට කෝල් එකක් දෙනවා, හරි ද?"

මෙසේ පැවසූ ඩර්වින් ටයිටස්ගෙන් හා ඇන්තනිගෙන් සමුගත්තේය. ඔහුගේ සිතට මඳ නිදහසකි. වත්තට ඇතුළුවත්ම තම සතුරන්ට ගිනි සෑයක් වෙමින් දැල්වෙන "ග්‍රේලෑන්ඩ් බංගලාව" ඔහු මනසින් දුටුවේය. සියුම් සතුටක් ඇඟ තුළ නහර ඔස්සේ පවා ගලා ගියේය.

"හරි, ඊට පස්සේ ඔක්කොම කතන්දරේ ඉවරයි." ඔහු සිතින් මිමිණුවේය.

☆ ☆ ☆ ☆ ☆ ☆ ☆

ඩර්වින් ග්‍රේලෑන්ඩ් බංගලාව දෙස විමසිල්ලෙන් බලා සිටියේය. එහි යන එන වාහන ගැන මැනවින් බැලුවේය.

මේ අතර බංගලාව තුළ වෙනදා මෙන්ම සතුටු සිනා හඬ පැතිරී ගියේය. ලින්ඩාත්, දොස්තර මහතාත් සාලයට වී කුඩා දැරියගේ සුරතල් බලමින් සිටියහ. සිල්වියා මැතිනිය කාමරයට වී විවේකයෙන් පසු වූවාය. එක්වරම සීතල සුළඟක් සමග ඝන



Scanned by CamScanner

sinhalaebooks.com

මීදුම ජනෙල් කවුළුවෙන් ඇදී ආවේය.

"විල්සන් ඔයා?"

"ඔව් සිල්වියා. බරපතළ ප්‍රශ්නයක්. මට දැනෙනවා අද මොනවා හරි විනාශයක් වෙන්න යනවා කියලා."

විල්සන් මහතාගේ විනිවිද පෙනෙන රූපකාය සිල්වියාගේ කාමරය තුළ ඔබ මොබ සක්මන් කරන්නට පටන් ගත්තේය.

"මොකක් ද වෙන්න යන්නේ?"

"හරියටම කියන්න බෑ. මට විශාල ගිනි දැල් පෙනෙනවා. ඒ මැදින් මහා විලාපයක් ඇහෙනවා. එපමණයි මං දන්නේ. මං ආවේ ඔයාලට අනතුරු අඟවන්න. මට දැනෙනවා, ඒත් තේරුම් ගන්න බෑ. මාව විශ්වාස කරයි ද කියන්නත් බැහැ."

"මම මේ ගැන එයාලට කියන්නම්."

"එපා, මං යමක් තීරණය කරලා ආවේ. දොස්තර මහත්තයා අවතාරයක් කියන එක විශ්වාස කරයි කියලා හිතන්න අමාරුයි. සිල්වියා, ඔයා බය වෙන්න එපා. ඔහොමම ඉන්න."

විල්සන්ගේ අවතාරය තම අත්වලින් සිල්වියා ස්පර්ශ කළේය. සීතල හිම කැට බඳු එම අත්වලින් ස්පර්ශ කරමින්ම ඔහු නොතේරෙන යමක් තොල් මතුළේය. සිල්වියාගේ ඇස් පියවී නිද්‍රාවට පත් වූවාය. ඇයගේ මුව අමුතුම ආකාරයට ඇරී සෙම නිකුත් විය. ඇය ඇඳ මත දිගා වූවාය.

"දොස්තර මහත්තයා මේ බලන්න, ලොකු නෝනා ලෙඩ වෙලා."

ඇග්නස්ගේ විලාපයෙන් දොස්තර මහතා ද ලින්ඩා ද සිය මැණියන්ගේ නිඳන කාමරයට දිව ගියහ.

"මොක ද මේ වුණේ අම්මී....?" ලින්ඩා කෑ ගැසුවාය.

දොස්තර මහතා රෝගියා පරීක්ෂා කර බැලුවේය.

"අපි අම්මව හොස්පිට්ල් එකට අරගෙන යමු. නාඩි තත්ත්වය ඒ තරම් හොඳ නෑ. ඇගී අම්මා, ඔයත් ලැස්ති වෙන්න.



Scanned by CamScanner

sinhalaebooks.com

ලෙඩා ළඟ කවුරු හරි නතර වෙන්න වෙයි."

දොස්තර මහතා ද ලින්ඩා ද සිල්වියා මැතිනිය රෝහල වෙත රැගෙන යාමට සූදානම් වූහ.

"ගම්මුදලි සීයා, අපි ලොකු නෝනව ඉස්පිරිතාලේ ගෙනියනවා. ගේට්ටුව වහලා දාන්න."

"හොඳයි මහත්තයා."

මෝටර් රථය ගේට්ටුවෙන් පිටවත්ම ගම්මුදලි ගේට්ටුව වසා අගුළු දැමීය.

☆ ☆ ☆ ☆ ☆ ☆ ☆

මේ අතර ග්‍රේලෑන්ඩ් බංගලාවට නුදුරු තැනක වූ පාළු මුර මඩුවක් තුළ හොඳ හැටි මත්පැනෙන් සප්පායම් වන තිදෙනෙකි. මීට පෙර ද මුණගැසී පුරුදු මේ තිදෙනා රාත්‍රී දහය පමණ වන තුරු ඉතා රහසිගතව කතා කරමින් මේ ස්ථානයේ පසු වූහ.

"හරි දැන් යමු. මේ පැත්තෙන් උඩට නැග්ගාම කෙළින්ම බංගලාව. කාටවත් පේන්නෙ නෑ. මේ වෙලාවට කව්රුත් ඔය පැත්තේ ඇවිදින්නෙ නෑ."

සඳ නොමැති රැයක් වූ බැවින් පරිසරය බෙහෙවින් කළුවරය. අඳුරේම ඉදිරියට ඇදෙන තිදෙනාගෙන් ඉදිරියෙන්ම ගමන් කරන්නා අතේ ප්ලාස්ටික් බූලියකි. ඒ තුළ ඇත්තේ පෙට්‍රල්ය.

බකමූණන්ගේ හා වවුලන්ගේ කෑ ගැසීම හැරුණු කොට වෙනත් ශබ්දයක් නොමැත.

ඝන මීදුමක් මාර්ගය අවහිර කරමින් පැතිරී යත්ම ඩර්වින් පෙරමුණ ගත්තේය. ඔහු තමාගේ ගෙල රැඳි කුරුස ලාංඡනයට අත තබා ගත්තේය. මීදුම ක්‍රමයෙන් තුනී වී ගියේය.

"විල්සන්, උඹට බෑ මාව මරන්න." ඩර්වින් තොල් මැතුරුවේය. බලගතු භූතවිද්‍යා මන්ත්‍රාචාර්යවරයකුගෙන් ඔහු ආරක්ෂාව සලස්වා ගෙන සිටියේය.



Scanned by CamScanner

sinhalaebooks.com

"මොනව ද සර් තනියම කියවන්නේ?"

"මොකුත් නෑ බං, ඔහොම යමල්ලා."

අවතාර නොපෙනෙන තරමට ඔවුහු පදම් වී සිටියහ.

ග්‍රේලෑන්ඩ් බංගලාවේ පසුපස ලඳු කැලෑවකි. ගල් කුළු හා මීමන පඳුරුවලින් ගහන මේ ප්‍රදේශය තුළ කෙනකුට පහසුවෙන් සැඟවී සිටීමට පුළුවන.

"මම මෙතැන ඉන්නම්. උඹලා දෙන්නා පලයල්ලා. වැඩේ කරලා ඉවර වෙලා මෙතෙන්ට වරෙල්ලා."

"හරි සර්, එහෙනම් අපි ගියා."

ටයිටස් හා ඔහුගේ මිත්‍රයා කළුවරේම බංගලාව දෙසට ඇදෙන්නට වූහ. ගරාජය ළඟින් ඉදිරියට යද්දී බිත්තියට හේත්තු කර තිබූ ටකරමක් පෙරළී ගියේය.

"කවු ද කවු ද ඔතන.....?"

ගම්මුදලි විදුලි පන්දම අතැතිව ඉදිරියට ආවේය. පසුපසින් වැදුණු පහරින් විසි වී ගිය ගම්මුදලි සිහිසුන්ව වැටුණි. පහර දුන් තැනැත්තා බිම වැටී තිබුණු ටකරම ගෙන ඔහුගේ ඇඟ මතට දැම්මේය.

"දොරවල් හොඳටම හිර කරපන්, එක්කෙනෙක්වත් පැනලා යන්න බෑ."

ටයිටස් තම අතට අසු වන ලෑලි පීප්ප ආදිය දමා දොරවල් දෙක ආවරණය කළේය.

බංගලාව වටා ඉසින ලද පෙට්‍රල්වලට ගිනි දල්වනු ලැබීය. ක්‍රමයෙන් ගින්න ඇවිළී වහලය දක්වාම පැතිරී යනු බලා සිටි ටයිටස්,

"අපි යමු." තම සගයාට කියමින් දුවන්නට තැත් කරද්දී ගැඹුරු කානුව තුළට කකුල යාමෙන් එතැනම බිම ඇද වැටුණි. ඔහු ආයාසයෙන් නැගිටීමට තැත් කළේය. ඒ සමගම වහලයෙන් ගැලවී ගිය ගිනි ගත් පරාලයක් ඔහුගේ පිට මතට වැටී කොන්ද



Scanned by CamScanner

sinhalaebooks.com

බිඳී ගියේය. සගයා පසු නොබලා දුවන්නට පටන් ගත්තේය.

ශ්‍රේලෑන්ඩ් බංගලාව ගිනි දැල්ලෙන් වැසී යනු ඩර්වින් ආශාවෙන් බලා සිටියේය. ඔහුගේ සතුට නිමහිම් නැත. තමාගේ සියලු කරදර අවසාන බව ඔහු සිතුවේය. එක්වරම දකුණු කකුලෙන් දැනුණු වේදනාව ඉවසිය නොහැකි වූයෙන් ඔහු පසුපස හැරී බැලුවේය. ගිනි දැල්වල දීප්තියෙන් බබළන සුදු පැහැති පෙණ ගොබය සහිත නාගයා තවත් වරක් ඔහුගේ පාදයට දෂ්ට කළේය. ඩර්වින් එතැනම ඇද වැටුණි.



සිල්වියා මැතිනියගේ තත්ත්වය බරපතළ නොවුණි. රාත්‍රියේම ආපසු ඒම නුසුදුසු බැවින් මිත්‍රයකුගේ නිවසේ එදින ගත කළ ලින්ඩාට හා දොස්තර මහතාට පසුවදා උදෑසන ලැබුණු ආරංචිය හදවත කලඹවන්නක් විය.

"මොනවා! හිතා ගන්නවත් බෑ. අපිත් අහම්බෙන් වගේ රාත්‍රියේ මෙහෙට ආවේ."

"ඔව්. ඕගොල්ලෝ මොකක් හරි වාසනාවකින් බේරිලා තියෙන්නේ. බංගලාවේ බිත්ති විතරයි ඉතිරි වෙලා තියෙන්නේ.



Scanned by CamScanner

sinhalaebooks.com

ගම්මුදලිගේ සිරුරත් අඟුරු වෙලා. ඉක්මනට එන්න. එන ගමන් පොලීසියටත් ගිහිල්ලාම එන්න."

වතු අධිකාරිවරයා දුරකථනයෙන් ලින්ඩාට සිදු වූ දේ විස්තර කළේය.

පොලීසියට දැනුම් දීමෙන් අනතුරුව පිරිස බංගලාව බලා පිටත් වූයේ වේදනාවෙන් පිරි හදවත්වලිනි. ගම්මුදලි පිළිබඳව ඔවුහු කම්පා වූහ.

"මොනවා නැති වුණත් කමක් නෑ. ගම්මුදලි සීයා නැති වුණු එකයි මට ඉවසන්න බැරි."

ලින්ඩා කඳුළු සැලුවාය. බංගලාව අසල විශාල පිරිසක් විය. ඒ අතර වතු අධිකාරිවරයා ද විය. බංගලාවේ සුන්බුන්වලින් තවමත් දුම් පිටවෙමින් පැවතුණි. අඟුරු වී ගිය මළ සිරුර හඳුනා ගැනීමට නොහැකි ආකාරයට කළු ගැසී තිබුණි.

"අනේ ගම්මුදලි සීයේ, කව් ද මේ අපරාදේ කළේ?" ලින්ඩා වැලපුණාය.

ගිනි නොගත් ගරාජයේ සිට පැමිණි කෙනකු තමාගේ හිස වසා ගත් තුවාය ඉවත් කොට ලින්ඩාට කතා කළේය.

"පුංචි බේබි, මං ඇත්ම මැරෙන්නෙ නෑ. තාම අපේ කාලෙ හොඳයි."

"අනේ ගම්මුදලි සීයා, අපි හිතුවේ.........." ලින්ඩා ගම්මුදලි බදාගනිමින් කඳුළු සලන්නට විය.

"එතකොට මේ කවු ද?" දොස්තර මහතා අඟුරු වී ගිය මිනිය දෙසට ඇඟිල්ල දිගු කළේය.

"මේ වෙන කෙනෙක්, සමහර විට ගිනි තියන්න ඇත්තේ මේ මිනිහා වෙන්න ඕනෑ. අපි උදේ එනකොට හිතුවේ මේ ගම්මුදලි කියලා. ඒත් ටික වෙලාවකින් මේ තහඩුව අයින් කළාම ගම්මුදලි සිහිය නැතුව ඉන්නවා දැක්කා. වතුර ඉස්සාම එයාට සිහිය ආවා." වත්තේ සේවකයෙක් පැවසුවේය.



Scanned by CamScanner

sinhalaebooks.com

එවිටම පොලිස් නිලධාරින් සමගම් ජීප් රථය එම ස්ථානයට පැමිණියේය. පරීක්ෂණ ආරම්භ විය.

"මේක දේව හාස්කමක්! ඔයාලගෙ වාසනාවට තමයි සිල්වියා මැඩම්ට අසනීප වුණේ. නැත්නම් මේ මිනිහාට වුණු දේමයි ඔයාලටත් වෙන්නේ. මේක හිතාමතා සැලසුම් කරලා කළ ගිනි තැබීමක්. අපි බලමු කවු ද මේක පිටුපස ඉන්නේ කියලා."

පොලිස් පරීක්ෂකවරයා දොස්තර මහතා ඇමතුවේය. කුඩා දැරිය බියට පත් වී ලින්ඩාගේ ගෙල බදා ගත් වනම සිටියාය.

හදිසියේම හති දමමින් දුවගෙන ආ වතු කම්කරුවකු ගෙනා ආරංචිය සියලු දෙනාගේම විස්මයට හේතු විය.

"සර්....සර්, ඩර්වින් මහත්තයා හුඹහ ළඟ මැරිලා ඉන්නවා."

ඩර්වින්ගේ ඉදිමී ගිය මළ සිරුර තුඹස අසල වැටී තිබුණි.

නගරාසන්නයේ අලුතින් ඉදි කළ නිවසට දොස්තර මහතා ඇතුළු නිවැසියෝ පදිංචියට ගියහ. කාලයාගේ ඇවෑමෙන් සිල්වියා මැතිනිය කලුරිය කළාය. විල්සන් මහතාගේ අවතාරය තවමත් වත්තේ තැන තැන සැරිසරන බව කම්කරුවෝ ප්‍රකාශ කරති. ගිනි ගත් බංගලාව කැලෑවෙන් වැසී ගියේය. ඉඳහිට ඝන මීදුම් වලාවකින් එම ප්‍රදේශය වැසී යනු කාටත් දැක ගත හැක.

නිමි....



Scanned by CamScanner